
# ප්‍රලේඛා

3 වෙළුම 2 කලාපය 2014 අප්‍රේල් - ජුනි ත්‍රෛමාසිකය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන සේවා අමාත්‍යාංශය

# ප්‍රලේඛා

03 වන වෙළුම - 02 කලාපය

**ISSN 2279-2120**

උපදේශකත්වය
**මහාචාර්ය සෝමරත්න බාලසූරිය**
සභාපති

සංස්කරණය
**මාලිනි ගෝවින්නගේ**

සම්බන්ධීකරණය
**මෛත්‍රී ජයසුන්දර**
සහකාර අධ්‍යක්ෂ

පිටු සැලසුම හා කවර නිර්මාණය
**ප්‍රේම් දිසානායක**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ප්‍රකාශනය
**ව්‍යාප්ති සේවා**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන: 011-2687583, 011-2698847-283
ෆැක්ස්: 011-2674387
ඊ මේල්: pub@mail.natlib.lk
වෙබ් අඩවිය: www.natlib.lk

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

කලාපයක මිල: රු. 100.00
වාර්ෂික දායකත්වය: රු. 400.00

චෙක්පත් හා මුදල් ඇණවුම්:
සභාපති, ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය,
නමට යොමු කරන්න.

මුද්‍රණය:
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

අපේ ලිපිනය:
**ප්‍රලේඛා**
ව්‍යාප්ති සේවා අංශය,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.

## සංස්කාරක සටහන

මේ තෙමස ලාංකිකයාට මෙන්ම ජගත් ප්‍රජාවට ද අතිශයින් වැදගත් වන සිද්ධීන් හා අවස්ථා රැසක් සැමරෙන වකවානුවකි. සිංහල - හින්දු අලුත් අවුරුද්ද, එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත්කොට ඇති ගෞතම බුදුන් වහන්සේගේ ඉපදීම, බුද්ධත්වය හා පිරිනිවීම සැමරෙන වෙසක් පුන් පොහොය, ජගත් පරිසර දිනය... සහ තවත් වැදගත් ජාත්‍යන්තර දිනයන් රැසක් මේ වකවානුවෙහි සැමරේ.

මෙහි ආරම්භක ලිපියට මැය වන පූජ්‍ය වල්පොළ රාහුල හිමියන්ගේ ජන්ම සංවත්සරය ද ජූනි 07 වැනිදාට යෙදෙයි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් මේ සියලු සිද්ධීන් හා අවස්ථා සමඟ ගළපා ගැනීම පහසු ය. මනුෂ්‍යයාගේ දුකට හේතුව මනසේ හටගන්නා ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල මූලයන් තුන බව බුද්ධ ඉගැන්වීමෙහි සඳහන් ය. මේවා පොදුවේ, සමාජයක්, රටක් හා සමස්ත ලෝකය තුළම සමාජ, ආර්ථික හා දේශපාලනික දුක් සහගත තත්ත්වයනට ද මුල බව වටහා ගැනීම අපහසු නොවේ. තණ්හාව හේතුවෙන් ලොව එකම සෝෂාකාරී වෙළෙඳ පොළක් බවට පත්ව ඇත. ඒ වෙළෙඳ පොළ තුළ පුද්ගලයා හුදු පාරිභෝගිකයෙකි; නොඑසේ නම් වෙළෙඳ භාණ්ඩයකි. ලෝකයේ වටිනා ස්වාභාවික සම්පත් අනාගත පරම්පරා පිළිබඳව තැකීමක් නැතිවම වනසමින්, කොල්ලකමින් තිබේ. ද්වේෂය මඟින් ජාතික, වාර්ගික හා සාමයික වෙනස්කම් සැකය හා එදිරිවාදිකම බෝකරන සාධක බවට පත්ව ඇති අතර, මෙමඟින් හිටිහැටියේ ඇවිළෙන භීෂණ තත්ත්වයන්ට හා නොනිමෙන පළිගැනීම්වලට මුලපිරෙයි. තණ්හාව හා ද්වේෂයට රුකුල් දෙන්නේ මෝහය හෙවත් මුළාවයි. තණ්හාවෙන් ද්වේෂයෙන් උසිගැන්වෙන සාවද්‍ය මත හා විශ්වාස සාධාරණීකරණය කිරීමට මෝහය ආධාරකයකි. වත්මනෙහි ප්‍රචලිතව පවත්නා බහුවිධ භීෂණයන් හා අපරාධයන් පසුගාමී කිරීම පිණිස සමාජ ව්‍යුහයන්හි සහ ප්‍රතිපත්තීන් හී වෙනසක් අවශ්‍ය වුව ද, සැබෑ සාමය හා සංහිඳියාව සඳහා එම වෙනස ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා නව දැක්මක් ඇවැසිය. ආත්ම කේන්ද්‍රීය හෝ වර්ග කේන්ද්‍රීය නොවී සිටීමට, ක්‍රියා කිරීමට හැකි විය යුතුය.

පූජ්‍ය වල්පොළ රාහුල හිමියෝ එවන් බුද්ධ පුත්‍රයෙකි. උන්වහන්සේ විශ්වීය චරිතයකි. සිංහල ගැමි පවුලක උපත ලැබුව ද, ලොවම හිස නැමූ ප්‍රාඥයකු බවට පත්වීමට උන්වහන්සේට උපකාර කළෝ, උන්වහන්සේගේ පාණ්ඩිත්‍යය මැනැවින් හඳුනාගත්තෝ, අන්‍යජාතිකයෝ හා අන්‍යාගමිකයෝ ය. උන්වහන්සේගේ ජීවන චරිතය ජාත්‍යන්තර හා සමයාන්තර සංහිඳියාව පිළිබඳ අත්පොතක් වැන්න.

---

මෙහි පළවන ලිපි පිළිබඳ වගකීම අදාල ලේඛකයින් සතු වේ.

# අත්වැල


**වල්පොළ රාහුල නම් වූ බුද්ධ පුත්‍රයා** 3
මාලිනී ගොවින්නගේ

---

**අද්‍යතන සමාජය සහ ගෝලීය භාෂා අධ්‍යයනය** 16
තිස්ස ජයවර්ධන

---

**සාහිත්‍ය මනුෂ්‍යත්වයෙහි විශේෂ අනුභවයකි** 24
අනුවාදක: මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි

---

**විදුලි පුවත (කෙටි කතාව)** 27
පරිවර්තනය: උපුල් රංජිත් හේවාවිතාන

---

**කවි ලියැවෙන සමාජයක ජීවත්වීමේ සතුට නොහොත්**
**2013 නූතන ම සිංහල කවිය** 34
හිනිදුම සුනිල් සෙනෙවි

---

**මූල්‍ය පාලන දැනුම පුස්තකාලයාධිපතිවරයෙකුට අත්‍යාවශ්‍ය අංගයක්** 40
ඩී.ජී.ඒ. ශ්‍යාමලී මල්කාන්ති

---

**සිහිනය ඔබමය (කවි)** 45
කුමාර හෙට්ටිආරච්චි

---

**සාහිත්‍ය විචාරය විධිමත් විද්‍යාවක් සේ ගොඩනැගිය යුතුයි** 46
ම.ව. සුගතපාල ද සිල්වා

---


**ගේබ්‍රියෙල් ගාෂියා මාකේස් ඉන්ද්‍රජාලිකයාගේ යථාර්තය** 50

---

**පොතක වත** 54




ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
වෙත අත්පත් කරගන්නා ලදී
දිනය :..........................



# වල්පොළ රාහුල

## නම් වූ

# බුද්ධ පුත්‍රයා



වල්පොළ රාහුල (1907.05.09 - 1997.09.18)

මවුපියන්: පියා - කරෝලිස් ද සිල්වා

මව - හත්තොටුව ගමගේ සිලිඳුහාමි

උපන් ගම: වල්පොළ, පින්ගොඩවත්ත

සොයුරු සොයුරින්: වැඩිමහලු නව (09) දෙනෙකි.

ගිහි නම: හෙට්ටිගොඩ ගමගේ දොන් හෙන්ද්‍රික් ද සිල්වා

මුල් පැවිදි නම: වල්පොළ ධම්මදස්සී මහානාග

පැවිද්ද: 1920

උපසම්පදාව: 1965

අධ්‍යාපනය: නිවෙසක පවත්වා ගෙන ගිය පෞද්ගලික පාසලකින් තෙවසරක මූලික අධ්‍යාපනය

කොළඹ යුනිවර්සිටි කොලීජිය

අධ්‍යයන සමර්ථතා: ඉන්දු ආර්ය භාෂා පිළිබඳ විශේෂ ශාස්ත්‍රවේදී උපධිය (1941)

ආචාර්ය උපාධිය (1950) කොළඹ විශ්වවිද්‍යාලය

තනතුරු: විද්‍යෝදය සරසවියේ කුලපති, කැලණිය සරසවියේ කුලපති, අමෙරිකාවේ නෝර්ත් වෙස්ටර්න් සරසවියේ බෞද්ධ දර්ශනය පිළිබඳ ප්‍රථම මහාචාර්ය, ඔක්ස්ෆර්ඩ් සරසවියේ බෞද්ධ දර්ශනය පිළිබඳ මහාචාර්ය

සම්පාදිත ග්‍රන්ථ:

- සත්‍යෝදය
- History of Buddhism in Ceylon (මෙය ලක්දිව බුදුසමයේ ඉතිහාසය නමින් ප්‍රකාශිතය.)
- භික්ෂුවගේ උරුමය (1974 දී Heritage of the Bhikku නමින් ද ප්‍රකාශයට පත්විය.)
- What the Buddha Taught (බුදුන් වදාළ ධර්මය නමින් ද 1964 දී ප්‍රකාශයට පත්විය.)
- Zen and the Taming of the Ball
- Le compendium de la Supper - Doctrine (Philosophie) Abhidharma Samuccaya D.D. Asanga (සංස්කෘත බසින් අසංග පඬිවරයා විසින් ලියන ලද අභිධර්ම සමුච්චය කෘතියේ ප්‍රංශ පරිවර්තනය)

ගෞරව නාම: ත්‍රිපිටක වාගීස්වරාචාර්ය (ශ්‍රී කල්‍යාණී සමග්‍රී මහා සංඝ සභාව)

අග්ගමහා පණ්ඩිත (බුරුම රජය)

ධර්ම ශාස්ත්‍ර ශිරෝමණී (කැලණියේ විද්‍යාලංකාර පිරිවෙන)

ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලයේ අධි සම්මාන සාමාජිකත්වය (1969)


බිහාර් නව නාලන්දා විශ්වවිද්‍යාලය - විද්‍යාචාර්ය උපාධිය (1978)

ඩී. ලිට් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය (1978)

ඩී. ලිට් - අමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ප්‍රාචීන අධ්‍යයන විශ්වවිද්‍යාලය (1979)

LL.D කැලණිය විශ්වවිද්‍යාලය (1980)

Dr. Sacred Thealogy ශුද්ධ දේවධර්මාචාර්ය - අමෙරිකාවේ නෝර්ත් වෙස්ටර්න් විශ්වවිද්‍යාලය 1985



කලින් කල විප්ලවවාදීහු බිහිවෙති. ආගමික වේවා, දේශපාලනික හෝ සමාජීය වේවා, පවත්නා ක්‍රමයේ වැරැදි හා දුබලකම් දකින මෙම නව චින්තකයෝ රටක ජනතාවගේ චින්තනය වෙනස් කිරීමට ගන්නා උත්සාහය නිසාම යුගයක, ජාතියක සුවිශේෂ පුද්ගලයන් බවට පත්වෙති. එමතු ද නොව, තත්කාලීන සාවද්‍ය චින්තනයන්ට හා ක්‍රියාදාමයන්ට එරෙහිව ඔවුන් ඉදිරිපත් කරන එම ඍජු, අභීත චින්තනයම ඔවුන්ගේ ප්‍රමුද්‍රාව බවට පත්වෙයි.

ඉකුත් සියවස මුල්භාගයේ දී දිවයිනෙහි ජනිත වූ එක් ප්‍රවිඥ පුත්‍රයෙක් බුදු සසුනට ඇතුළු වී, මහණදම් පුරමින් බෞද්ධ භික්ෂු සමාජයට මෙන්ම ගිහි සමාජයට ද, රට කර වූ ප්‍රභූන්ට ද නිවැරැදි මඟ පෙන්වා දීමට උත්සාහ ගනිමින් විප්ලවීය මෙහෙයක් ඉටු කළහ.

වල්පොළ රාහුල හිමියෝ විප්ලවවාදියෙකි. නිවහල් චින්තකයෙකි. මෙරට ජනිත වූ අන් කිසිවෙකුට නොදෙවෙනි ප්‍රාඥයෙකි. බුදුන් වදාළ දහම අනුවම කටයුතු කළ පූජනීය බුද්ධ පුත්‍රයෙකි.

යම් පුද්ගලයකුගේ පාණ්ඩිත්‍යය හඳුනාගනු ලැබීමට හැකි වන්නේ එම පුද්ගලයාගේ චින්තනයෙහි, ලේඛනයෙහි හා දේශනයෙහි නිරවුල් හා පැහැදිලිකමෙනි. සරල, සුගම බවෙනි. එකී මං ඔස්සේ ඉදිරිපත් කරන චින්තනයෙහි නවමු හා අරුත්බර බවෙන් හා එම අදහස් ප්‍රකාශනයේ අභීත හා නොවක් ස්වභාවයෙනි.

ඒ හැම ගුණාංගයකින්ම පරිපූර්ණව සිටි රාහුල හිමියන් පිළිබඳව තබන සටහනක දී උන්වහන්සේ ලාංකිකයාට පමණක් නොව, ලොව පුරා වෙසෙන බෞද්ධ ජනතාවට ඉතිරිකොට ගොස් ඇති ඥාන සම්භාරය පිළිබඳව පළමුව සටහනක් තැබීම වටී.

සිය ගණනක් නැත ද, උන්වහන්සේ විසින් රචිත පොත් කිහිපය සබුද්ධික චින්තන විප්ලවයක් සඳහා හොඳටම ප්‍රමාණවත්ය.

බුදු දහම, බෞද්ධයා හා බෞද්ධ භික්ෂුව අලළා ලියන ලද 'සත්‍යෝදය' ලිපි පෙළ ද, 'භික්ෂුවගේ උරුමය' කෘතිය ද සිංහල බෞද්ධ සමාජයේ නැණැස පාදමින් විශාල පෙරළියකට මුලපිරූ පොත්ය. What the Buddha Taught බටහිරට බුදු දහම හඳුන්වා දීම සඳහා බුද්ධ දේශනාවේ සියලුම මූලධර්මයන් හැම දෙනාටම තේරුම්ගත හැකි පරිද්දෙන් ලියන ලද පැහැදිලි, තර්කානුකුල ප්‍රාමාණික ග්‍රන්ථයකි. පෙර'පර භාෂා ගණනාවකට පරිවර්තිත, බුදු දහම පිළිබඳ අත්පොතකි.

බෞද්ධයන්ට නිදහස්ව සිතන්නට උගන්වන ලිපි පෙළක් ලෙස හැඳින්වුණු පත්‍රිකා 7ක් 1933 - 1934 කාලයේ දී රාහුල හිමියන් විසින් ලියා මුද්‍රණය කොට නොමිලේ

බෙදාහරින ලදි. පියදාස සිරිසේනයන්ගේ සංස්කාරකත්වයෙන් එළිදුටු සිංහල ජාතිය පුවත්පතෙහි සංක්ෂිප්ත සටහන් ලෙස මුලින්ම පළවූ මෙම ලිපි පසුකලෙක යළි වැඩිදියුණු කොට රාහුල හිමියෝ සතොයාදය පත්‍රිකා ලියූහ. දැන් පොතක් ලෙස පළවන මෙම ලිපි මඟින් බෞද්ධයා අතර පවතින දූර්මත හා සාවද්‍ය චර්යාවන් දැඩි ලෙස විවේචනයට ලක්කෙරේ. එදා, කිව්වර ජී.එච්. පෙරේරා ප්‍රකාශ කළා සේම මේ ලිපි බෞද්ධයාට නිදහස්ව සිතන්නට උගන්වයි.

එදා තරමටම, ඇතැම් විට එදාටත් වඩා අදට මෙම ලිපි කාලීන යැයි සතොයාදය පත්‍රිකා කියවන්නෙකුට ඇතිවන හැඟීම ස්වාභාවිකය. පාඨකයා අසන ප්‍රශ්නවලට ලේඛකයා සපයන පිළිතුරු ආකාරයෙන් සකස් වී ඇති මෙම ලිපි මාලාවෙන්, බුද්ධ වන්දනාව ලෙස බෞද්ධයා කරන සාවද්‍ය ක්‍රියා, බෞද්ධයා තුළ පැලපදියම්ව ඇති මිථ්‍යා මත හා ඔවුන් අතර මුල්බැසගත් වැරැදි පුරුදු දැඩි විවේචනයට ලක් කෙරේ.

බුද්ධ ප්‍රතිමාවලට ආහාර පූජා කිරීම, ධර්ම දේශනාවට පෙර කෙරෙන දේවාරාධනය, දහම් පඬුරු පිදීම, ධර්ම දේශනාව පැවැත්වෙන අතර සම්මාදම් එකතු කිරීම, භික්ෂූන් අතර ඇති කුලභේදය වැනි දේ උන්වහන්සේ මේ පත්‍රිකාවලින් දැඩි ලෙස හෙළා දකිති.

ශාසනය යනු කුමක්දැයි උන්වහන්සේ පැහැදිලි කරන්නේ මෙසේ ය: 'ශාසනය යනු විහාර, පන්සල් නොව, සුචරිතයයි. ප්‍රතිපත්තියයි. ශාසනය යනු ශීල, සමාධි ප්‍රඥා තුනයි... ශාසනය (බුද්ධ ශාසනය) සොයාගත්තේ මනුෂ්‍යයෙක් නම් මනුෂ්‍යයන් විසින් එය රැකිය යුතුයි."

'භික්ෂූන්ගේ කුලභේදය' ලිපියෙන්;

"සියම් නිකායේ මේ කුලභේදය පවත්නා තුරු අනෙක් කුලයෙහි මිනිසුන්ට හිතවත්ව ඒ නිකාය ආශ්‍රය කළ නොහැකි ය. මේ පාපයෙන් තුරන් වනතුරු සිංහලයන් අතර අවංක, ස්ථිර සමඟියක් බලාපොරොත්තුවීම උගහටය. අනාර්ය වූ අශාසනික වූ මේ භයානක පාපය මුලිනුපුටා දමන්නට ශාසනාභිවෘද්ධිකාමී ශ්‍රද්ධාවත් සත්පුරුෂ ගිහි පැවිදි උතුමන් වහ වහා ඉදිරිපත් වී ක්‍රියාකළ යුතුයි". (35 පිටුව, සතොයාදය)

වත්මනෙහි උදේ සවස ගුවන්විදුලියෙන් සීවලී පිරිත අසන්නට ලැබෙයි. පිරිත් ශ්‍රවණය කිරීමෙන් "......... ගහක් ගලක් යට හිටියත් සිව්පසය ලැබෙන" බව ද භික්ෂුවක්ම පවසති. අදටත් පවතින මේ භාවිතය පිළිබඳව රාහුල හිමියන් මීට සැත්තෑ වසරකට පෙර සඳහන් කළේ මෙසේය:

ප්‍රශ්නය: බොහෝ බෞද්ධ ගෘහයන්හිත්, ආපන ශාලාවලත් සීවලී මහරහතන් වහන්සේගේ රූපය තබාගෙන ඒ ළඟ පහනක් දල්වති. එහි අදහස කුමක්ද?

පිළිතුර: ලාභ ප්‍රයෝජන ලැබීමේ අදහසයි. සීවලී මහරහතන් වහන්සේ ප්‍රත්‍යයලාභීන්ගෙන් අග්‍රය. උන්වහන්සේගේ රූපය ගෙදර හෝ වෙළෙඳ ශාලාවේ තබාගතහොත් තමාටත් ලාභ වැඩිවනු ඇතැයි බොහෝ දෙනා ආශාවෙන් මුළාවෙති. එහි උත්තමයෙකුට ගරු කිරීමේ අදහසක් නැත. සීවලී මහරහතන් වහන්සේට වඩා සැලකිය යුතු අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේගේ රූපය කවුරුවත් තබා නොග නිති. උන්වහන්සේගෙන් වෙළෙඳාමට උදව්වක් ලැබේ යැයි නොසිතන හෙයිනි. (66 පිටුව, සතොයාදය)

ලංකාවේ භික්ෂු සමාජයේ පමණක් නොව, සෙසු ආගමික, දේශපාලන සංස්කෘතික සහ සාමාජික අංශවල පිබිදීමක් ඇතිවීමට මුල්වූ, 'භික්ෂුවගේ උරුමය' කෘතිය ලිවීමට උන්වහන්සේට පසුබිම නිර්මාණය වූයේ මෙසේ ය:

හතළිහ දශකයේ මුල් භාගය දේශපාලන ආර්ථික හා සමාජීය වශයෙන් රටේ බහුතරයක් ජනතාව අතිශය පීඩිත තත්ත්වයකට පත්ව සිටි අවධියක් විය. සිංහල භාෂාවට හෝ බුද්ධාගමට තැනක් නොවීය. දේශපාලන කටයුතුවල නිරත වූ භික්ෂූන් වහන්සේලා දුසිල්වත් මහණුන් ලෙස පුවත්පත්වලින් හඳුන්වා දුන් අතර, දුශ්ශීල භික්ෂූන්ට දන්දීමෙන් වළකින ලෙස මජනතාවගෙන් ඉල්ලා සිටින ලදි. එකල පළ වූ ඇතැම් පුවත්පත් ද මෙම වැඩපිළිවෙළේ හවුල්කරුවෝ වූහ.

මෙම පුවත්පත්වලට එරෙහිව සතිපතා පත්‍රයක් නිකුත් කිරීමේ අවශ්‍යතාව මතුව තිබිණි. 'කාලය' නමින් පුවත්පතක් මුද්‍රණය කිරීමට සූදානම් කරන ලදි. පසුබිමේ සිටිමින් මෙම පුවත්පත සංවිධානය කරන ලද්දේ එවකට කැලණිය ධර්මාලෝක විද්‍යාපතිවරයාව සිටි ඩී.බී. ධනපාල විසිනි. ඒ වන විට ඔහු ලේක්හවුස් සමාගමේ ඩේලිනිවුස් පුවත්පතේ කර්තෘකමින් ඉල්ලා අස්වී සිටියේය. යක්කඩුවේ ප්‍රඥාරාම, තෙල්වත්තේ බුද්ධදත්ත, කොටහේනේ පඤ්ඤාකිත්ති, බඹරැන්දේ සිරිසීවලී, නාරාවිල ධම්මරතන, හැඩිගල්ලේ පඤ්ඤාලෝක, කළල්ඇල්ලේ ආනන්ද සාගර (කේයස් කවියා) ලිපි සැපයූහ.

මේ අතර එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභානායක තනතුර දැරූ ඩී.ඇස්. සේනානායකට පක්ෂපාතී පිරිස් විසින් 'බුද්ධ ශාසනය පිරිසිදු කර ගැනීම' පිණිස අලුත් ව්‍යාපාරයක් පටන් ගත්හ. මෙය කැලණියේ ශාසනශෝධක බලමණ්ඩලය නම් විය.


දේශපාලනයෙහි නියුතු භික්ෂූන් සසුනෙන් ඉවත් කිරීමටත්, දඩගැසීමට හෝ බන්ධනාගාර ගත කිරීමටත් මහානායක හිමිවරුන්ට බලය ලබා දීම පිණිස පනතක් සකස්කොට ඒ සඳහා මහානායක භික්ෂූන් වහන්සේලාගේ අනුමැතිය ලබා ගැනීම පිණිස මහනුවරට යැවුණ ද, කැලණියේ ශාසනශෝධක බලමණ්ඩලයට එරෙහිව ප්‍රබලව නැඟී සිටි විද්‍යාලංකාර පිරිවෙනෙන් ඇරඹුණු ශිෂ්‍ය බලවේගය නිසා මෙය යටපත් විය. මොවුන් ඒකරාශී වී ලංකා එක්සත් භික්ෂු බලමණ්ඩලය නම් සංවිධානයක් පිහිටුවා මෙම සංවිධානය මඟින් කොළඹ නගර ශාලාවේ දී ඒ.පී. ද සොයිසාගේ ප්‍රධානත්වයෙන් 1946 ජූනි 29 වැනිදා පැවැති ඓතිහාසික සභා රැස්වීම අමතා රාහුල හිමියෝ 'භික්ෂුවගේ උරුමය' මැයෙන් දීර්ඝ කතාවක් කළහ. යටත්විජිත පාලන සමය තුළ සමාජ කටයුතුවලින් ඉවත්කොට පන්සල්වලට සීමාකොට තිබුණු භික්ෂු චරිතයට වඩාත් වැදගත් සක්‍රීය කාර්යභාරයක් ඉටුකිරීම සඳහා ඓතිහාසික උරුමයක් පවතින්නේය යන කාරණය උන්වහන්සේ මෙම කතාවේ දී සාධක සහිතව ඉදිරිපත් කළහ.

මෙම රැස්වීමෙන් තෙමසකට පසු 'භික්ෂුවගේ උරුමය' නමින් මුද්‍රණයෙන් පිටවූයේ එම කෘතියයි. එහි ප්‍රථම මුද්‍රණය සති තුනක් ඇතුළත විකිණී අවසන් වූ බව සඳහන් ය.

ඉන් පසු එහි අඩුපාඩු සකස්කොට අංග සම්පූර්ණ දෙවන මුද්‍රණය 1948 දී ප්‍රකාශයට පත්කර ඇත. 1992 දී තෙවන වරට ගොඩගේ සමාගම විසින් මුද්‍රණය කරන ලදුව 2012 වන විට පොත සය වතාවක් මුද්‍රණය වී තිබේ.

පොතෙහි ඉංග්‍රීසි මුද්‍රණයක් 1974 දී The Heritage of the Bhikku නමින් අමෙරිකාවේ නිව්යෝර්ක් නුවර ග්‍රෝව් ප්‍රෙස් (Grove Press) ප්‍රකාශකයන් විසින් මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කෙරිණි.

දේශපාලනයෙහි නියුතු වීම සඳහා අතීතයේ පටන් භික්ෂුවට තිබෙන අයිතිය ඉතාමත් ක්‍රමානුකූලව හා තර්කානුකූලව උන්වහන්සේ මේ පොතෙන් පෙන්වා දෙති.



*වරෙන්තු පිට සිටිය දී රාහුල හිමියෝ ගාලු මුවදොර වර්ජකයන්ගේ රැලිය අමතති.*

පොතෙහි තැනක, එවකට සිටි ඇතැම් මල්වතු අස්ගිරි මහා විහාර දෙකේ භික්ෂූන් වහන්සේලා එක් අවස්ථාවක දී ඉංග්‍රීසි රජයේ ඔත්තුකරුවන් වූ හැටි උන්වහන්සේ පෙන්වා දෙති. "නීතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ කටයුතුවලින් ඉතාම නින්දිත, පහත් කටයුත්ත අලුගෝසුකම බව කවුරුත් දනිති. එසේම දේශපාලන කටුයතුවලින් ඉතාම නින්දිත පහත් කටයුත්ත ඔත්තු කීමයි. ඔත්තු කියන්නා ස්වකීයයන්ගේ මෙන්ම අන්‍යයන්ගේ ද පිළිකුලට භාජනය වෙයි. කුඩාපොළ හාමුදුරුවන් සිවුරු පිටින්ම වෙඩිතබා මැර වූ වෛකවුන්ට් ටොරින්ටන් ආණ්ඩුකාරයාගෙන් ලැබී තිබෙන බලය කරණකොට ගෙන පවරනු ලබන මේ නායකකම නිසා අපගෙන් ගරුබුහුමන් වැඳුම්පිදුම් ලබන නායක ස්ථවිරයන් වහන්සේලා ස්වකීය ජාතියට විරුද්ධව ඉංග්‍රීසි ආණ්ඩුවේ ඔත්තුකාරයන් වීම තරම් පහත් නිවට නින්දිත පිරිහීමක් අප අතර තවත් ඇතිවිය හැකිද? - 81 පිටුව, භික්ෂුවගේ උරුමය.

භික්ෂුවගේ උරුමය කෘතියෙන් ගත් තවත් උපුටන දෙකකි මේ.

"දේශපාලනය ජීවිතය පිළිබඳ ප්‍රශ්නයකි. ආගම ද ජීවිතය පිළිබඳ ප්‍රශ්නයකි. මේ දෙක වෙන්කළ නොහැකිය. ශරීරයට සිත යම් සේ ද, දේශපාලනයට ආගමත් එසේම ය. ආගම ධර්මයෙන් තොර වූ දේශපාලනය අධර්මයක්, පාපයක් වෙයි. ආගම යනුවෙන් අදහස් කරනු ලබන්නේ වැඳුම් පිදුම් ආදී බාහිර චාරිත්‍ර නොව, කරුණා මෛත්‍රී ආදී ගුණ ධර්මයන්, දියුණු කිරීමය. එබඳු අදහස්වලින් ගුණධර්මවලින්



*නෝර්ත් වෙස්ටර්න් සරසවියේ මහාචාර්ය පෙරී සමඟ*

තොර වූ චරිත දියුණුවක් නැති අය විසින් කරනු ලබන දේශපාලනයෙන් ලෝකයාට අවැඩක් මිස වැඩක් විය නොහැකි ය. (108 - 109 පිටු - භික්ෂුවගේ උරුමය)

"...අද සමස්ත ලෝකයෙහිම දේශපාලන විශේෂඥයන් හැටියට පිළිගනු ලබන මේ ශ්‍රේෂ්ඨ පඬිවරුන්ගේ විවරණයන් ගැනත්, පෙර විසූ උතුමන්ගේ අදහස් ගැනත් නුවණින් සලකා බලන විට දේශපාලනය 'තක්කඩින්ගේ අන්තිම රක්ෂාස්ථානයක්' හෝ 'පොර පිටියක්' හෝ 'හොරකමක්' නොවන බවත් පිරිසිදු චරිතයෙන් හා අවංක අදහසින් යුත් සිල්වත්, ගුණවත් උතුමන් විසින් ලෝකයාගේ යහපත පිණිස කළ යුතු ශ්‍රේෂ්ඨ මෙහෙයක් බවත් පැහැදිලිව පෙනෙනවා ඇත. කොටින්ම කියතොත් මහජනයාගේ මෙලෝ පරලෝ දෙකෙහිම යහපත පිණිස වුවමනා කරන ඉගෙනීම, සනීපාරක්ෂාව, චරිත වර්ධනය ආර්ථිකත්වය ආදි දේවල් නිසි පරිදි දියුණු කිරීම දේශපාලනයයි. (125 පිටුව භික්ෂුවගේ උරුමය)

1946 දී මුල්වරට නිකුත් වූ අවස්ථාවේ දී එවකට සිටි ඇතැම් බුද්ධිමතුන් මෙම පොත හඳුන්වා ඇත්තේ ලංකාව හෙල්ලූ පොතක් ලෙසය. යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමියන් මේ පොත පිළිබඳව මෙසේ ප්‍රකාශ කළ බව සඳහන් ය.

"රාහුල ස්ථවිරයෝ මින් පස්සේ වෙන කිසිම පොතක් නොලීවට කමක් නෑ. ඔබ වහන්සේ අමරණීය වීමට 'භික්ෂුවගේ උරුමය' නමැති මේ පොත හොඳටම ඇති.

වල්පොළ රාහුල හිමියන් විසින් සිය ආචාර්ය උපාධිය සඳහා ලියා ඉදිරිපත් කරන ලද ග්‍රන්ථය History of Buddhism in Ceylon ය. මෙය ගුණසේන සමාගම විසින් 1956 දී නිකුත් කරන ලද අතර, මෙහි සිංහල පරිවර්තනය 'ලක්දිව බුදු සමයේ ඉතිහාසය' නමින් එම සමාගම විසින්ම ප්‍රකාශයට පත් කෙරිණි.

'What the Buddha Taught' නම් ලෝකප්‍රකට ග්‍රන්ථය රාහුල හිමියන් විසින් රචනා කරන ලද්දේ ලෝකයට බුදු දහම හඳුන්වා දීම සඳහා ග්‍රන්ථයක් සම්පාදනය කරන ලෙස උන්වහන්සේගේ ආචාර්යවරයෙකු වූ ඊ.එෆ්.සී. ලුඩොවයික් විසින් කරන ලද යෝජනාවක් අනුවය.

බුදු දහම පිළිබඳ පැහැදිලි දීප්තිමත් විවරණයක් ලෙස හඳුන්වාදිය හැකි මෙම ග්‍රන්ථය මේ වනවිට ප්‍රංශ, ජර්මන්, ස්පාඤ්ඤ, ඉතාලි, යුගෝස්ලාවියානු, දෙමළ, චීන, බුරුම, සියම්, වියට්නාම් හා කොරියානු යන භාෂාවලින් ද ප්‍රකාශයට පත්ව ඇත.

සිවුවැනි සියවසේ දී අසංග ආචාර්ය නම් මහායාන පඬිවරයා විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද අභිධර්ම සමුච්චය උන්වහන්සේ විසින් ප්‍රංශ බසට නඟන ලද්දේ උන්වහන්සේ ප්‍රංශයේ සෝර්බෝන් විශ්වවිද්‍යාලයෙහි බෞද්ධ පර්යේෂණ කටයුතුවල නිරත වෙමින් සිටි අවධියේ දී ය. Le compendium de la super Doctrine (Philophie) Abhidharmasamuccaya මැයෙන් එය 1971 දී පැරිසියේ දී ප්‍රකාශයට පත්විය.

Zen and the Taming of the Bull 1978 දී බ්‍රිතාන්‍යයෙහි ගෝර්ඩන් ප්‍රෙස් මගින් ප්‍රකාශයට

පත් කරන ලද උන්වහන්සේ විසින් සම්පාදිත තවත් කෘතියකි.


මේ හැරුණු විට ලොව පුරා නොයෙකුත් භාෂාවලින් පළවන සඟරා හා වාර ප්‍රකාශනවලට රාහුල හිමියන් විසින් ලියන ලද ලිපි රාශියකි.

1974 දී නැවත සංස්කරණය වූ Encyclopaedia Britannica විශ්වකෝෂයෙහි 'බුද්ධ' පදය විග්‍රහ කරමින් බුද්ධ චරිතය පිළිබඳ සටහන ලියා ඇත්තේ ද රාහුල හිමියන් විසිනි.

හෙට්ටිගොඩ ගමගේ දොන් හෙන්ද්‍රික් ද සිල්වා හෙවත් අප්පුහාමි වල්පොල ධම්මදස්සී මහානාග නමින් සසුන්ගත වන විට වයස අවුරුදු දහතුනකි. ඊට පෙර ගිහි දරුවෙකු ලෙස අකුරු කළ ද, ඔහු පාසල් ගොස් තිබුණේ තෙවසරකි. පාසලේ ප්‍රධානාචාර්යවරයා සමඟ වාදයක් ඇති කරගෙන නිවසට පැමිණි ඔහු යළි කිසි දිනෙක පාසල් නොගියේය. පාසලෙන් ද, වත්මනෙහි වල්පොළ ශ්‍රී ගෞතමාරාමය නමින් හැඳින්වෙන වල්පොළ පන්සලෙන් ද යම් මූලික අධ්‍යාපනයක් ලබා තිබුණ ද, පන්සලකින්, පිරිවෙනකින් හෝ පාසලකින් විධිමත් අධ්‍යාපනයක් නොලද ඔහු පසුකලෙක ස්වොත්සාහයෙන් අධ්‍යාපනය ලබා ලෝකයේ අග්‍රගණ්‍ය පඬිරුවණක් බව පත්වූහ. වල්පොළ ධම්මදස්සී සාමණේර හාමුදුරුවන් සිංහල, සංස්කෘත හා පාලි භාෂාවද, අභිධර්මය ද බෞද්ධ භාවනාවද ප්‍රගුණ කළේ එවකට කීර්තිමත් පැවිදි පඬිරුවනක් වූ පරගොඩ සුමනසාර හිමියන් ගෙනි. පසුකලෙක සුමනසාර හිමියන් සිය උපසම්පදාව ද අතහැර සාමණේර හිමිනමක් ලෙස ආරණ්‍යගතව සිල් රැකීමට තීරණය කළ විට, උන්වහන්සේ සමඟ ආරණ්‍යගත වූ සාමණේර හිමිවරුන් අතර ධම්මදස්සී හිමියෝ ද වූහ. (සුමනසාර හිමියෝ පසුකලෙක බ්‍රහ්මචාරී සත්‍යනාථ වීරසිංහ නමින්



*බුරුම රජයෙන් අග්ගමහා පණ්ඩිත ගෞරව නාමය ලැබීමෙන් පසු එරට වැසියන්ගේ ගෞරව ලබමින්*



*එස්. තංගරාජා මහතා සමඟ ලන්ඩනයේ දී*

ශාසන සේවයෙහි ද, සාමණේර භික්ෂූන්ට ධර්මය ඉගැන්වීමෙහි ද යෙදුණහ.)

සුමනසාර හිමියන්ගෙන් ලද ආභාසයෙන් ධම්මදස්සී හිමියෝ නිතර, පියදාස සිරිසේනයන්ගේ කර්තෘත්වයෙන් පළ වූ 'සිංහල ජාතිය' පත්‍රය කියවීමට ද, පසුව ඊට ලිපි ලිවීමට ද පටන් ගත්හ. කොළඹ ධර්මදූත සේවය සඳහා භික්ෂූන් අවැසි බවට 1927 මුල් භාගයේ දී සිංහල ජාතිය පුවත්පතේ පළමු දැන්වීමකට ප්‍රතිචාර දක්වමින් ඉල්ලුම් පත් යවා, සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රථමයා වී රාජගිරියේ ධර්මදූතාශ්‍රමයට පැමිණ ධර්මදූත සේවය අරඹන විට උන්වහන්සේ විසි වයසැති හිමිනමකි. ධම්මදස්සී හිමි ඇතුළු ධර්මදූත භික්ෂූහු කොළඹ නගරයේ පැල්පත්වල හා මුඩුක්කුවල ජනයා වෙත යමින් ධර්ම දේශනා කළහ. ඔවුන්ට අවවාද අනුශාසනා කරමින් ඔවුන්ගේ දෛනික ප්‍රශ්න විසඳා ගැනීමට උපකාර කළහ. කොළඹ මහ රෝහලට ගොස් එහි වාට්ටුවල නතර වී සිටි රෝගීන්ගේ අවශ්‍යතා සොයා බලා ඒවා සපිරූහ. සිය නිවෙස්වලට ලියුමක්වත් යවා ගැනීමට නොදත් ඇතැම් රෝගීන් වෙනුවෙන් ලියුම් ලියා තැපැල් කිරීම පවා ධර්මදූත භික්ෂූහු භාරගත්හ.

ධර්මදූත සංගමයේ අනුග්‍රහයෙන් ගමින් ගමට, ආරාමයෙන් ආරාමයට වඩිමින් ධර්මදේශනා කළ ධම්මදස්සී තෙරණුවෝ ධර්ම කථිකයකු බවට පත්ව සිටි අතර, 1927 වන විට උන්වහන්සේ ධර්මදේශනා 250ක් පමණ පවත්වා තිබුණු බව උන්වහන්සේගේ දිනපොතේ සඳහන්ය. රාහුල තෙරණුවෝ පෙරළිකාර ධර්ම දේශකයෙක් වූහ. එක තැනක එක දවසක් පමණක් ධර්ම දේශනා කොට පිටව නොගියහ. සතියක් පමණ එක තැනක බණ දෙසූහ. පළමු දිනයේ ධර්මය දේශනා කළ උන්වහන්සේ දෙවන දිනය ශ්‍රාවකයන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට යොදාගත්හ.

වරක් ඇහැළියගොඩ ප්‍රදේශයේ රොඩී ගම්මානයකට ගොස් දානය වැළඳීමෙන් විහාරාධිපති ස්වාමීන් වහන්සේ පවා උන්වහන්සේ සමඟ උරණ වුව ද, උන්වහන්සේගේ මුහුණට කිසිවක් කීමට ඉදිරිපත් නොවූ බව ද, රොඩී ගමෙහි දානය වැළඳීමේ ප්‍රතිඵලයක් ලෙස, දිනපතාම රා බී වෙරිමතින් ගත කළ පිරිමින් ගණනාවක් ම රාහුල හිමියන්ගේ දෙපා වැඳ ඉන් ඉදිරියට රා නොබීමට පොරොන්දු වූ බව ද සඳහන් ය.

'බෞද්ධයන්ට නිදහස්ව සිතන්නට උගන්වන ලිපි පෙළක්' ලෙස ප්‍රකට 'සත්‍යෝදය පත්‍රිකා' නමින් ධර්ම පත්‍රිකා පෙළ වරින්වර නොමිලේ බෙදාහරින ලද්දේ 1933 - 1934 කාලයේ ය.

වල්පොළ ධම්මදස්සී නම වෙනුවට වල්පොළ රාහුල නාමය උන්වහන්සේ භාවිතයට ගත්තේ 1928 පටන් ය. සෙසු ශාසනික වගකීම් කොතෙකුත් එළඹිය ද, ස්වෝත්සාහයෙන් ඉගෙනීමේ ක්‍රියාදාමය කිසිවිටෙක අතපසු නොකළ රාහුල හාමුදුරුවෝ ලන්ඩන්

මැට්‍රිකියුලේෂන් විභාගයට පෙනී සිටියහ. ඒ සඳහා උන්වහන්සේට මඟ පෙන්වීම ද, උපකාර ද කරන ලද්දේ එස්. තංගරාජා නම් ද්‍රවිඩ ගුරුවරයෙකු හා එවකට යුනිවර්සිටි කොලීජියේ ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ කථිකාචාර්ය තනතුරක් දැරූ ඊ.එෆ්.සී. ලුඩොවයික් යන මහතුන් විසිනි. 1936 දී රාහුල හිමි යුනිවර්සිටි කොලීජියට බැඳුණාහ.

මැලේරියාව දිවයින පුරා වසංගතයක් ලෙස ව්‍යාප්ත වූයේ රාහුල හිමියන් යුනිවර්සිටි කොලීජියේ ශිෂ්‍යයෙකුව සිටි අවධියේ ය. රජය විසින් සපයන ලද ආධාර මැලේරියාවෙන් පීඩා විඳි ජනතාවට බෙදා දීම, ආධාර එකතු කිරීම ආදි කටයුතුවල යුනිවර්සිටි කොලීජියේ ශිෂ්‍ය සංගම් සාමාජිකයන් හා එකතු වී උන්වහන්සේ ද නියැළුණහ. මැලේරියා වසංගතය තදින් පැතිර පැවැති කෑගලු දිස්ත්‍රික්කයේ ගම්දනව් පුරා සැරිසරමින් කඳුහෙල් නගිමින් බසිමින් උන්වහන්සේ රෝගීන්ට ඇප උපස්ථාන කළේ නියම බුද්ධ පුත්‍රයෙකු යා යුතු මග යමිනි.

රාහුල හිමියෝ කිසි විටෙක කිසිදු දේශපාලන පක්ෂයකට නොබැඳුණාහ. හැම විටම නිදහස් මතධාරී ස්වාධීන චින්තකයකු ලෙස කටයුතු කළහ. එහෙත්, ඔහු නොයෙක් දේශපාලන පාක්ෂිකයන් ඇසුරු කළහ. පිලිප් ගුණවර්ධන ප්‍රධාන ලෙස්ලි ගුණවර්ධන, කොල්වින් ආර්. ද සිල්වා, එන්.එම්. පෙරේරා, වර්නන් ගුණසේකර, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ ආදීන් විසින් 1935 දී පිහිටුවා ගන්නා ලද නව පක්ෂය හැඳින්වීමට නොයෙක් නම් යෝජනා වුව ද, අවසානයේ 'සමසමාජ' පක්ෂය නාමය පක්ෂය සඳහා යෝජනා කරන ලද්දේ රාහුල හිමියන් විසිනි.


බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපනය නොමිලේ ලබා දිය යුතු ය යන යෝජනාව එවකට අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් මුලින්ම රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද්දේ 1943 දීය. අධ්‍යාපනය ලැබීම රටේ එක් ජන කොටසකගේ වරප්‍රසාදයක් පමණක් යැයි සිතා සිටි නිසාදෝ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීන් වැඩිදෙනෙක් මෙම යෝජනාවට එකඟ නොවූහ. එක්සත් භික්ෂු බලමණ්ඩලය මේ අවස්ථාවේ දී පෙරට පැමිණියහ. අධ්‍යාපනය පිළිබඳ යෝජනාව නීතිගත කර ගැනීමට නොහැකිව සිටි අධ්‍යාපන ඇමතිවරයාට සහය දීමට ඔවුහු තීරණය කළහ. පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණේ 1947 මැයි 13 වැනිදාය.

පනත සම්මත කරන ලෙස සියලුම මන්ත්‍රීන්ට බලකර සිටීමේ ව්‍යාපාරයක් අරඹන ලද අතර, මෙහි මූලිකත්වය දරන ලද්දේ රාහුල හිමියන් විසිනි. උන්වහන්සේගේ අත්අකුරින්ම ලියන ලද පෙත්සමක පිටපත් අත්සන් ලබා ගැනීම සඳහා දිවයින පුරා බෙදාහරින ලදි. භික්ෂු බලමණ්ඩලයේ සියලු සාමාජිකයෝ රැස්වීම් පවත්වමින් ජනතාව දැනුවත් කළ අතර, නිදහස් අධ්‍යාපන පනතට පක්ෂ පෙත්සම, භාර ලක්ෂයකගේ පමණ අත්සනින් යුතුව එක්සත් භික්ෂු බලමණ්ඩලයේ නියෝජිතයන් විසින් රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත භාරදෙන ලදි.

1947 මැයි 22 වැනිදා 'කාලය' පත්‍රයට මේ සම්බන්ධයෙන් දීර්ඝ වාර්තාවක් ලියන



තරුණ සිසුන් පිරිසක් සමඟ



*එතෙර දී සාකච්ඡාවක් පටිගත කරන අතර*

කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියෝ එම ලිපියේ තැනක මෙසේ සඳහන් කරති.

"මේ මස 13 වැනි දින රාජ්‍ය මන්ත්‍රණ සභාව ආරම්භ වීම දකින්නට පුල පුලා සිටි ජනතාව නිසා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභාපතිතුමාගේ ගැලරිය මෙන්ම මහජන ගැලරිය ද කල්වේලා තිබියදීම පිරී ගියේය. එහි විශේෂාංගයක් වශයෙන් දක්නට තිබුණේ භික්ෂුන් වහන්සේලා විශාල ගණනක් අසුන් දරා සිටීමය. ඈත පළාත්වලින් පැමිණි මහා ස්ථවීරවරු ද, නායක ස්ථවීරවරු ද, පරිවේණාධිපතිවරු ද, උන්වහන්සේලා අතර වූහ. ඊටත් වඩා මැති ඇමතිගොල්ලන්ගේ නෙත් වරින්වර යොමු වූයේ පසුගිය සති කිහිපය තුළ අධ්‍යාපන අතුරු පනත ස්ථිර නොකර කල් දමන්නට රාජ්‍ය මන්ත්‍රණ සභාව තීරණය කරන්නට යන බව මහජනතාවට කියා දෙමින් නිදහස් අධ්‍යාපනය රැකගන්නට දිවයින පුරා මහත් උද්ඝෝෂණයක් ඇති කළ ප්‍රගතිශීලී භික්ෂූන් වහන්සේලා දෙසය."

කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා 1947 දී සමසමාජ පක්ෂය විසින් සංවිධානය කරන ලද මහා බස් වැඩ වර්ජනය සාර්ථක කර ගැනීම පිණිස පිලිප් ගුණවර්ධන ඇතුළු පිරිසට නිර්භීතව සහය දුන් අය අතර රාහුල හාමුදුරුවෝ ද වූහ. වැඩ වර්ජනයට සහය දුන් නායකයන් සිරභාරයට ගැනීම සඳහා පොලිසිය විසින් නියෝගයක් නිකුත් කරන ලදි. නීතියෙන් සැඟවී සිටීම උන්වහන්සේගේ අභිමතය නොවුව ද, සෙසු වර්ජන සගයන්ගේ අදහසට එකඟව ටික දිනක් පන්සලක සැඟවී ගත කළ ද, පසුව වරෙන්තු තිබිය දී ම ගාලු මුවදොර පිටියේ පවත්වන ලද වර්ජකයන්ගේ මහා සභා රැස්වීම ඇමතීමට පැමිණියහ. ඉන් පසු පිලිප් ගුණවර්ධන හා ඉන්ද්‍රපාල යන වර්ජක නායකයන් සමඟ උන්වහන්සේ ද බන්ධනාගාර ගත වූහ.

ඉහත සඳහන් වන්නේ රාහුල හිමියන් විසින් සිදුකරන ලද ශාසනික හා සමාජ මෙහෙවරෙන් බිඳක් පමණි.

බුදු දහම හා ජගත් ප්‍රජාවට රාහුල හිමියන් විසින් කරන ලද විශිෂ්ට සේවයක් ලෙස චිකාගෝ නුවර, එවන්ස්ටන්හි, නෝර්ත් වෙස්ටර්න් සරසවියේ බෞද්ධ දර්ශනය

පිළිබඳ මහාචාර්යවරයා ලෙස කළ මෙහෙවර සැලකිය හැකිය. මෙම සේවය අරභයා නෝර්ත් වෙස්ටර්න් සරසවිය විසින් උන්වහන්සේට ශුද්ධ දේවධර්මාචාර්ය (Dr. Sacred Theology) යන ගෞරව නාමය පිරිනමන ලදි.

බටහිර සරසවියක මහාචාර්ය තනතුරකට පත්කරන ලද ප්‍රථම භික්ෂුව ලෙස ඉතිහාසගත වන රාහුල හිමියෝ අමෙරිකාවේ විශ්වවිද්‍යාලවල බුදු දහම ඉගැන්වීම පිළිබඳව සාධනීය වෙනසක් ඇති කළහ.

What the Buddha Taught කෘතිය බටහිර විශ්වවිද්‍යාලවල බුදු දහම පිළිබඳ ආරම්භක පාඨමාලාවල නිර්දේශිත ග්‍රන්ථයක් බවට පත්විය. භික්ෂුවගේ උරුමය කෘතිය ඉංග්‍රීසියෙන් පළවීම ද බුදු දහම විශ්වවිද්‍යාලවල ඉගැන්වීමට මහත් පිටිවහලක් විය. ඉංග්‍රීසි පරිවර්තනය පිළිබඳව අදහස් දක්වමින් අමෙරිකාවේ නෝර්ත් වෙස්ටර්න් සරසවියේ මහාචාර්ය ඔස්මන්ඩ් ඇෆ්. පෙරී, “රාහුල හිමියන් ‘භික්ෂුවගේ උරුමය’ ලියා ඇත්තේ උන්වහන්සේ එක්රැස් කරගත් ඥාන සම්භාරයෙන් පිටාර ගලා ගිය කොටස උපයෝගි කරගනිමින්” යැයි පවසා ඇත.

What the Buddha Taught කෘතිය පිළිබඳව සිය අදහස් දක්වන බෙල්ජියමේ ලුවෑ සරසවියේ මහාචාර්ය එතියන් ලමෙත් “මෙම කෘතිය බුදු දහම පිළිබඳ ඉතා පැහැදිලි, සමබර, තර්කානුකූල කෘතියක්” බව කියයි. නාගාර්ජුන වසුබන්ධු, අසංග වැනි පෙරදිග පඬිවරුන්ගේ ලියැවිලි තරම් උසස් කෘතියක් බව සඳහන් කරන මහාචාර්ය ලමෙත්, මෙම පොත යටකී පඬිවරුන්ගේ කෘතිවලට වඩා ‘මානව හිතවාදී වීම’ එහි සුවිශේෂ ලක්ෂණය බවත් දක්වයි.

විද්‍යෝදය සරසවියේ උපකුලපති තනතුර 1966 දී භාරගත් රාහුල හිමියෝ විශ්වවිද්‍යාලය ස්වාධීන ආයතනයක් ලෙස පාලනය කළහ. වරක් විනය විරෝධී සිසුන් 300ක් සරසවියෙන් නෙරපූ උන්වහන්සේ, සිසුන් පැවරූ නඩුව කැඳවූ විට උසාවි නොගියහ. ශිෂ්‍යයන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට උපකුලපති ලෙස තමාට තිබුණ බලය අනුව තීරණය කළ බැවින්,





ආචාර්ය රිචඩ් ගෝම්බ්‍රිච් සමඟ

තමන්ට එරෙහි තීන්දු ගැනීමට උසාවියට බලයක් නැති බව උන්වහන්සේ පෙන්වා දුන්හ. අවසානයේ නඩුවෙන් පරාජයට පත් වූ ශිෂ්‍යයෝ උන්වහන්සේගෙන් සමාව ගත් පසු ඔවුනට සමාව දී යළි විශ්වවිද්‍යාලයට භාරගත්හ.

දීර්ඝ කාලයක්, පුරා වසර 24ක් පමණ පැරිසිය මූලස්ථානය කරගෙන සිය ශාසනික හා බුද්ධිමය මෙහෙවර ඉටුකළ රාහුල හිමියෝ 1974 දී ලන්ඩනයේ පදිංචියට වැඩමකොට පාලි පොත් සමාගමේ උප සභාපති ලෙස කටයුතු කළහ.

උන්වහන්සේ කැලණි සරසවියේ කුලපති තනතුරට පත්කරනු ලබන්නේ ලන්ඩනයේ වැඩ සිටි කාලයේ දී ය. දිවයිනට වැඩම කළ රාහුල හිමියන්ට කුලපති තනතුරට අමතරව තවත් භාරදූර වගකීමක් ද රජය විසින් පවරන ලදි. ඒ අනුව, 1982 දී පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා වල්පොළ රාහුල හිමියෝ මූලිකත්වය ගෙන කටයුතු කළහ. දිවයිනේ සෙසු මුල් පෙළේ භික්ෂූන් වහන්සේලා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාල පනත උන්වහන්සේ විසින් සකස් කරන ලදහ.

දිවයිනට පැමිණීමෙන් පසු මඳ කලක් ඇවෑමෙන් රාහුල හිමියෝ රජයෙන් ලබා දෙන ලද දියවන්නා ඔය අසල වගුරු බිමක් ගොඩකර පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් තනවන ලද කේතුමතී ආවාසයෙහි පදිංචි වූහ. අපවත් වන තෙක්ම රාහුල හිමියන් පදිංචිව සිටියේ ආවාසයක් මෙන්ම, බෞද්ධ පර්යේෂණ ආයතනයක් ද වූ මෙම ස්ථානයෙහිය.

රාහුල හිමියෝ තමන් වහන්සේ මැදහත්ව හෝ සම්බන්ධව සිටි සියලුම කරුණු සම්බන්ධයෙන් ප්‍රථමයෙක් මෙන්ම විශිෂ්ටයෙක් ද වූහ. ඒ සුවිශේෂී තත්ත්වයන් සිය බුද්ධිය, පාණ්ඩිත්වය, ඍජු අභීත ගුණය නිසාම උන්වහන්සේට විශේෂණ පද වූ ඇය.

එවකට ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොළඹ යුනිවර්සිටි කොලීජියට ඇතුළු වී ශාස්ත්‍රෝග්‍රහණය කිරීමට සුදුසුකම් ලද ප්‍රථම උපාධි අපේක්ෂක භික්ෂුව රාහුල හිමියෝ ය.

පාසලකින් හෝ පිරිවෙනකින් විධිමත් අධ්‍යාපනයක් නොලැබ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළම හිනිපෙත්තට නැංගා වූ ප්‍රථම ලාංකිකයා ද රාහුල හිමියන්ම විය හැකිය.

ප්‍රංශ රජය විසින් පිරිනමන ලද ශිෂ්‍යත්වයක් ලද ප්‍රථමයා ද වල්පොළ රාහුල හිමියෝ ය. ක්‍රිස්තියානි දේවධර්මායතනයක් ලෙස ඇරඹුණු බටහිර (අමෙරිකාවේ) සරසවියකින් මහාචාර්ය තනතුරක් ලැබ, පසුව එම සරසවියෙන්ම ලද ගෞරව නාමයකට ද හිමිකම් කී ප්‍රථම හා එකම බෞද්ධයා ද එතුමාණෝ ය.

මේ සැම කාරණයකට වඩා විශිෂ්ට වන්නේ සැබෑ බුදු දහම කුමක් ද, බුද්ධ ශාසනය තුළ සැබෑ භික්ෂුව කෙබඳු විය යුතු ද, ලාංකික සමාජය තුළ උන්වහන්සේගේ කාර්යභාරය කුමක් විය යුතු දැයි අභීතව ප්‍රකාශ කළ, එම ප්‍රකාශයන් අනුවම කටයුතු කළ භික්ෂුව උන්වහන්සේ වීමය. "ලෝකයෙහි එකම චීවරයක්වත් නැතත්, කහපාට පවා අන්තර්ධාන වුවත්, මනුෂ්‍යයෝ ධර්මයෙන් යුක්ත නම්, ශීල, සමාධි, ප්‍රඥාවන් වඩත් නම් සත්‍යාවබෝධය ලබත් නම්, ඔවුන්ගෙන් බුදු සසුන රැකෙන බව උන්වහන්සේ ප්‍රකාශ කළේ විසිහත් හැවිරිදි භික්ෂුවකව සිටියදීය.

උන්වහන්සේ විසින් කරන ලද සමාජ මෙහෙවර අතර, ප්‍රථමයෙන් ම සඳහන් කළ යුතු වන්නේ මෙරට නිදහස් අධ්‍යාපනය ස්ථාපිත කිරීම සඳහා ප්‍රමුඛත්වය ගෙන, සංවිධානය කළ වැඩපිළිවෙලය. 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාට විරුදාවලී ලබන්නට හැකි වූයේ එදා රාහුල හිමියන් ප්‍රමුඛ කොටගත් බෞද්ධ ස්වාමීන් වහන්සේලා කළ වැඩකොටස නිසා ය. අපවත් වීමෙන් පසු හැකිතාක් අප්‍රමාදීව ආදාහනය සිදු කිරීමටත්, ජනමාධ්‍ය ඔස්සේ මරණය සම්බන්ධයෙන් ප්‍රචාරණ කටයුතු සිදුනොකරන ලෙසටත්, ආදාහනයෙන් පසු භෂ්මාවශේෂ කැලණි ගඟේ පාකර හරින ලෙසටත් උන්වහන්සේ උපදෙස් දී තිබිණි. අපවත් වීමෙන් පසු වසරක් පාසා පින්කම් හා අනුස්මරණ උත්සව පැවැත්වීම උන්වහන්සේ අනුනොදත්හ.

එහෙත්, වල්පොළ රාහුල දර්ශනය පුනර්ජීවනය ලැබිය යුතු යුගයකට ශ්‍රී ලංකාව පැමිණ ඇති බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. ඒ අනුව, පූජ්‍ය මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් පිළිබඳ අනුස්මරණ වැඩසටහනක් නොබෝ දිනක දී කොළඹ දී පැවැත්වීමට රාහුල හිමියන්ගේ එක ම ගෝල ශිෂ්‍යයා වන පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමියන් ඇතුළු ඒ සඳහා කටයුතු කරන සංවිධායක මණ්ඩලය තීරණය කොට ඇත.



*මුල් පිටුවේ ඡායාරූපය ඇතුළු සෙසු ඡායාරූප පූජ්‍ය වල්පොළ ශ්‍රී රාහුල බෞද්ධ පර්යේෂණ මධ්‍යස්ථානයේ අනුග්‍රහයෙනි.*

# අද්‍යතන සමාජය සහ ගෝලීය භාෂා අධ්‍යයනය

නූතන - සමාජය යනුවෙන් මෙහි දී හඳුන්වනු ලබන්නේ විසිවන සියවසේ අගභාගයේ සිට වර්තමානය දක්වා පැවතෙන මානව සමාජය යි. එය පැරැණි සමාජය ක්‍රමවත් ව එමෙන් ම වේගවත් ව පරිණාමයට පත්වීමේ ප්‍රතිඵල වශයෙන් ඇති වූවකි. එයට හේතු වූයේ සන්නිවේදන ක්‍රමවල පැතිර යාමත්, නව විද්‍යාත්මක සොයා ගැනීම්වල බලපෑමත් ය.

සමාජය යනුවෙන් සඳහන් කළ විට විවිධ සමාජ ස්තරවලට අයත් පුද්ගලයෝ ද එහි වෙති. සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධනය වන රටවල ද ඔවුහු සිටිති. වර්තමානයේ සංවර්ධනය යන සංකල්පය පිළිබඳ විවිධ ආකාරයෙන් අර්ථකථන ඉදිරිපත් වේ. සංවර්ධිත රටවල් වශයෙන් ගැනෙන්නේ ඒකපුද්ගල ආදායම පිළිබඳ නිශ්චිත ලක්ෂ්‍යයක් කරා ළං වූ රටවල් ය. ඒවායේ මානව පරිභෝජනය සඳහා ගැනෙන බොහෝ භෞතික වස්තුවල වෙනසක් ඇත. එසේ ම 'බලය' යන සාධකය පිළිබඳ ව ද පැහැදිලි ලක්ෂණයක් ඇත.

සංවර්ධනය වන රටවල පුද්ගල පරිහරණය සඳහා ගැනෙන භෞතික සම්පත්වල සීමිත බවක් පවතිනු පමණක් නො ව, එම රටවල පුද්ගලයන්ට එම වස්තු ලබාගැනීමේ ශක්තියෙහි ද සීමිත බවක් ඇත. ඒ සියල්ල සිදු වී ඇත්තේ ආර්ථික කරුණු පදනම් කරගෙන ය.


එබඳු ආකාරයේ කරුණු කවර තත්වයක පැවැතිය ද අද්‍යතන ලෝකය තුළ අභිනව සමාජයක් පහළ ව ඇත. සංවර්ධිත රටවල එම සමාජය බෙහෙවින් පැතිර ඇති අතර, සංවර්ධනය වන රටවල එහි සීමිත බවක් ඇත.

වර්තමාන සමාජයෙහි පවත්නා වෙනසට බෙහෙවින් හේතුවී ඇත්තේ තොරතුරු තාක්ෂණය පිළිබඳ විස්මයජනක ප්‍රගතිය යි. එමෙන් ම සන්නිවේදන ක්‍රම විධිවල වර්ධනය ද එයට බලපා ඇත. ලෝකයේ කවර ස්ථානයකට වුව ද, කෙටි කාලයකින් ළඟා විය හැකි ය. අන්තර්ජාලය උපකාර කර ගනිමින් දත්ත ලබා ගත හැකි ය. දෘශ්‍ය-ශ්‍රව්‍ය විද්‍යුත් සන්නිවේදන ක්‍රම විධි මඟින් ලෝකයේ කවර ස්ථානයක සිදුවන සිද්ධියක් වුව ද නැරඹිය හැකි ය. චන්ද්‍රිකා තාක්ෂණය හා සම්බන්ධ වූ දුරකථන මෙම ලෝකයේ කවර තැනක දී වුව ද ප්‍රයෝජනයට ගත හැකි ය. GPS (Global Positioning System)

තාක්ෂණ උපකරණ මඟින් කවරක් හෝ පවතින ස්ථානය අවශ්‍ය කවර අවස්ථාවක දී හෝ සොයාගත හැකි ය. මේ කරුණු මේ ආකාර බැවින් වර්තමාන සමාජය **ජානකාරී සමාජයක්** (Information Society) ලෙස හැඳින්විය හැකි ය. එතකුදු වුවත් වර්තමාන ලෝකයේ කිසිදු විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් භාවිත නො කරන සංඛ්‍යාව මිලියන ගණනාවක් විය හැකි ය. එබැවින් ජන කොටස් අතර පවත්නා විවරය නිසැක වශයෙන් ම ඉතා පෘථුල වේ. එම පෘථුලත්වය අවම කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතන මඟින් පියවර ගෙන තිබේ. එහි අවසාන ඵලය වන්නේ ජානකාරී සමාජයක් බිහි කිරීම යි.

මෙබඳු පසුබිමක් යටතේ නූතන සමාජයට තාක්ෂණික ඥානය ලබාදීම අවශ්‍ය වේ. එබන්දක් ලබා දෙන්නේ කෙසේ ද? භාෂාත්මක ඥානය නොමැති ව, එය කළ නො හැකි ය. ක්‍රමවත් ව ලබා ගන්නා ඥාන සම්භාරය තැන්පත් කොට ඇත්තේ භාෂාව ආධාර කොටගෙන ය.

විද්වතුන් සඳහන් කරන ආකාරයට ලෝකයේ භාෂා තුන් දහසක් පමණ ඇත. ඒ සෑම භාෂාවක් ම එක හා සමාන නො වේ. නමුත් භාෂාවෙන් ඉටුවන කාර්යභාරයට අනුව එම භාෂා සියල්ල ම එක හා සමාන වේ. ඒ සියල්ල යොදා ගනු ලබන්නේ '**අන්තර්පුද්ගල සම්බන්ධතා**' පවත්වා ගැනීමට ය. මෙය මහාචාර්ය එම්.ඒ.කේ. හැලිඩේ (M.A.K. Halliday) දක්වන්නේ භාෂාවේ Interpersonal Function යනුවෙනි. මෙය භාෂාවේ ඉතා ම මූලික කාර්යය ද වේ. එය ම ඇතැම් තැන්වල එයට සමාන ලක්ෂණය හැඳින්වීම සඳහා Communicative Function - **සන්නිවේදන කාර්යය** යන යෙදුම භාවිත කොට ඇත. මෙය භාෂාවෙන් ඉටුවන ප්‍රධාන කාර්යභාරය යි. නමුත් එය භාෂාව පිළිබඳ නිර්වචනයක් නො වේ.



*ඇම්.ඒ.කේ. හැලිඩේ*

භාෂාව පිළිබඳ නිර්වචන සැපයීම පහසු නො වේ. නිර්වචන සැපයීමට පෙලඹී ඇති පුද්ගලයන්ගේ ඥාන සම්භාරයේ ප්‍රගමනය අනුව එය සිදු ව ඇත. 1965 දී පමණ නෝම් චොම්ස්කි (Noam Chomsky) නමැති වාග්වේදියා තම Aspects of the Theory of Syntax යන කෘතියේ භාෂාව යන්න නිර්වචනය කොට ඇත්තේ 'වාක්‍ය සමූහයක් ලෙස ය' (A set of Sentences) යනුවෙනි. එකල මෙසේ සඳහන් කොට තිබුණ ද, අනතුරු කාලය තුළ දී භාෂාව සහ මනස අතර පවත්නා සම්බන්ධතාව වඩාත් අවධානයට යොමු විය. එබැවින් භාෂාව, මනස හා සම්බන්ධ වූ සංසිද්ධියක් ලෙස දැක්වේ. එය පුද්ගලයා සතු ව ඇති **සංජානන පද්ධතිය** (Cognitive System) ලෙස සලකනු ලැබේ. එය කවර ආකාර වූ හෝ සාමාන්‍ය තත්ත්වයෙන් සිටින - එනම් මානසික ආබාධවලින් තොර මානවයකුගේ මනසෙහි එක්තරා කොටසක් වෙයි.

භාෂාව සම්බන්ධ ව විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කළ හැකි වුව ද මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ ප්‍රථම භාෂාව (First Language), ද්විතීය භාෂාව (Second Language), විදේශීය භාෂාව (Foreign Language) ආදී වශයෙන් දැක්වෙන අංශ කෙරෙහි ය. එයින් ප්‍රථම භාෂාව, පළමු බස, මවුබස වැනි වචන සියල්ලෙන් ගම්‍ය වන්නේ එක ම සංසිද්ධියකි.

ප්‍රථම භාෂාව යනු දරුවා කුඩා කාලයේ දී එනම්, ඇතැම් විට අවුරුදු 3 1/2 පමණ වන වයසේ දී, එක ම භාෂාවක් කතා කරන මවුපියන්ගෙන් හෝ වැඩිහිටි සහෝදර සහෝදරියන් හා වෙනත් අයගේ කථාවට ඇහුම්කන් දීමෙන් ග්‍රහණය කරනු ලබන භාෂාව ය. මෙහි එක් මූලික අවශ්‍යතාවක් වන්නේ අදාළ වැඩිහිටි සමාජය එක භාෂාවක් කථා කරන (Monolingual) සමාජයක් වීම ය.

සෑම සාමාන්‍ය මානවයකුම භාෂාවක් ග්‍රහණය කිරීමට අභ්‍යන්තර ශක්තියක් (Innate ability) තිබේ. ඒ හේතු කොටගෙන යම් භාෂාවක් කථා කරන ආකාරය, එය පරිහරණය කරන ආකාරය අසන්නට හා දකින්නට අවස්ථාවක් ලබන - එනම් භාෂාවකට අනාවෘත වන (Exposed) දරුවා අදාළ භාෂාව මනා සේ පරිහරණය කිරීමට සමත් වෙයි. මෙම මුළුමහත් ක්‍රියාවලිය භාෂා ස්වීකරණය (Acquisition) නම් වේ. එකම භාෂාවක් කථා කරන සමාජයක භාෂාව භාවිත කිරීමේ දී මෙය සිදුවන අතර, භාෂාව ග්‍රහණය කරන්නා එය කරන්නේ අනායාසයෙන් ය. විධිමත් ඉගැන්වීමක් එහි නැත. භාෂාව ග්‍රහණය කරන්නා වූ අයට ඇසෙන්නේ ශබ්ද පමණකි. භාෂාවක් ග්‍රහණය කිරීමේ **අභ්‍යන්තරික ශක්තිය** (Innate ability) ඔවුන් සතු ව තිබෙන බැවින් එම ශබ්ද යෙදෙන ආකාරය විශ්ලේෂණය කොට ක්‍රමවත් පද්ධතියක් මනස තුළ ඔවුහු වර්ධනය කර ගනිති. ඉන් පසු ක්‍රමයෙන් වැඩි වයසට පත්වන ස්වභාෂකයාට එම භාෂාව කථා කරන කවර හෝ අයකුගේ කථා කිරීමේ දී ඉදිරිපත් කෙරෙන භාෂාව හා සම්බන්ධ අර්ථ වටහා ගැනීමටත්, අභිනවයෙන් වාක්‍ය නිපදවීමටත් අවශ්‍ය ශක්තිය අනායාසයෙන් ම ලැබේ. එබැවින් ඔහු පරමාදර්ශී භාෂකයෙකි; ශ්‍රාවකයෙකි. ඔහුගේ **මනස ක්‍රමලේඛගත කොට** (Programmed) තිබේ. එසේ ම එම භාෂාව කථා කරන සියලු දෙනාගේ මනස ද සමාන ආකාරයෙන් ක්‍රම ලේඛනගත කොට ඇත. මෙය භාෂා දැනීම පිළිබඳ ඉතා විස්මයජනක සිද්ධියකි.

පුරාතන සමාජය තුළ කෙබඳු තත්ත්වයක් පැවැතිය ද කල්යාමේ දී එකිනකට දුරස්ථ වූ සමාජ බිහිවිය. ඒ සමඟ ම එකිනෙකට වෙනස් වූ භාෂා එම සමාජ තුළ භාවිත වීමට ද ආරම්භ විය. ඇතැම් සමාජ ඥාන ගවේෂණය නිසා වඩාත් ප්‍රගතිගාමී විය. එම ඥාන ගවේෂණයේ ප්‍රතිඵල ලබා ගැනීමට බාහිර ජන කොටස් පෙලඹුණු බවක් ද පෙනේ.

සමාජයක් සතු වූ ඥාන සම්භාරය තැන්පත් වූයේ භාෂාව තුළ ය. මෙය භාෂාවේ එක් කාර්යයක් ද විය. එම කාර්යය **සත්‍ය ගවේෂී කාර්යය** (Heuristic Function) ලෙස, එම්.ඒ.කේ. හැලිඩේ මහාචාර්යවරයා විසින් දක්වනු ලැබී ය.

බටහිර ලෝකයේ ග්‍රීක භාෂාවෙන් මෙය කෙරිණ. රෝමවරු එම ඥාන සම්භාරය ලබා ගත්හ. එම භාෂා දෙක අතර, එකල පැවැතියේ සමීප සම්බන්ධතාවකි. පෙරදිග ලෝකයේ භාරත දේශයේ ද එම ලක්ෂණය තිබිණ. ඒ සමඟ ම ආගම් දහම් ද පහළ විය. භාරත දේශයේ බුදු දහමත් රෝම දේශයේ කිතු දහමත් ප්‍රචලිත විය. බුදු දහම සඳහා **මගධ භාෂාව** ද (වර්තමානයේ දී පාලි යනුවෙන් එම භාෂාව හැඳින්වේ) බටහිර ලෝකයේ කිතු දහම සඳහා **ලතින්** (Latin) **භාෂාව** ද මාධ්‍ය විය. මෙම හේතුව නිසා, එම භාෂා පුරාතන ජාත්‍යන්තර භාෂා බවට පත්විය. පස්වැනි ශත වර්ෂයේ දී

ලංකාවේ ජාත්‍යන්තර භාෂාව වශයෙන් පාලි භාෂාව සැලකුණු බව, ආචාර්ය පී.සී. මෙන්ඩිස් මහතා සඳහන් කොට තිබේ. එතුමා එකල ලංකා විශ්වවිද්‍යාලයේ සිටි ඉතිහාසය පිළිබඳ ආචාර්යවරයෙකි. ක්‍රි.ව. දහවන ශතවර්ෂයෙන් පසු ව, ලංකාව කෙරෙහි සංස්කෘත බලපෑම වැඩි වූයේ ය.

බටහිර ලෝකයේ මුල් කාලය තුළ දී ග්‍රීක් භාෂාවට ප්‍රමුඛස්ථානයක් ලැබුණු අතර, වෙයි. බටහිර ලෝකයේ, පැරණි කල එම තත්ත්වයට පත් වූයේ රෝමවරුන්ගේ ලතින් භාෂාව ය. එබැවින් පශ්චාත් කාලීන අවධියේ දී, ඥාන සම්භාරය ලබා ගැනීමේ උපක්‍රමයක් වශයෙන් බටහිර යුරෝපයේ පවතින විවිධ භාෂා කථා කළ ජනයා අතර ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටි ජනයා අතර ද, ලතින් භාෂාව ඉගෙනීම සහ ඉගැන්වීම ව්‍යාප්ත විය. ඉන්දියානු කලාපයේ පාලි සහ සංස්කෘත භාෂා ඉගෙනීම සහ ඉගැන්වීම පැවැතිණ.

---

සෑම සාමාන්‍ය මානවයකුට භාෂාවක් ග්‍රහණය කිරීමට අභ්‍යන්තර ශක්තියක් (Innate ability) තිබේ. ඒ හේතු කොටගෙන යම් භාෂාවක් කථා කරන ආකාරය, එය පරිහරණය කරන ආකාරය අසන්නට හා දකින්නට අවස්ථාවක් ලබන - එනම් භාෂාවකට අනාවෘත වන (Exposed) දරුවා අදාළ භාෂාව මනා සේ පරිහරණය කිරීමට සමත් වෙයි. මෙම මූලමහත් ක්‍රියාවලිය භාෂා ස්වීකරණය (Acquisition) නම් වේ. එකම භාෂාවක් කථා කරන සමාජයක භාෂාව භාවිත කිරීමේ දී මෙය සිදුවන අතර, භාෂාව ග්‍රහණය කරන්නා එය කරන්නේ අනායාසයෙන් ය.

---

පසු කාලයේ දී එම ස්ථානය ලතින් භාෂාවට හිමි විය. රෝම අධිරාජ්‍යයේ බලපෑම මෙයට බෙහෙවින් හේතු විය. රෝමයේ සිටි විද්වත්හු ග්‍රීකයන්ගේ ඥාන සම්භාරයේ ශ්‍රේෂ්ඨත්වය පිළිගත්හ. එහෙයින් ග්‍රීකයන් සතු ව පැවැති චින්තනය රෝමවරුන්ගේ ලේඛනවලට ප්‍රවේශ විය.

එක් එක් භාෂාව පොදු වශයෙන් පවතින්නේ එක් රාජ්‍යයක් තුළ ය. එහෙත්, විවිධ සංස්කෘතික හේතු නිසා එම භාෂා එම රාජ්‍යයේ දේශසීමා ඉක්මවා යාමට පිළිවන. එසේ වූ විට එම භාෂාව අන්තර්ජාතික භාෂාවක්

මධ්‍යකාලීන අවධියේ දී එනම් 15/16 ශතවර්ෂවලින් අනතුරු ව මෙම තත්ත්වය වෙනස්වීම ආරම්භ විය. එයට හේතු වූයේ යටත්විජිත ඇති වීම ය. එහි මූලික ලක්ෂණය වන්නේ බලවත් ජාතීන් දුබල ජාතීන් යටත්කර ගැනීම ය. එවිට සිදු වූයේ එම බලවත් ජාතීන්ගේ භාෂා ඉගෙනීමේ සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය ආරම්භ වීම ය. ප්‍රංශ සහ ඉංග්‍රීසි ඉගෙනීම මෙහි දී ආරම්භ විය. එයට හේතු වූයේ ප්‍රංශ ජාතිකයන් සහ ඉංග්‍රීසි ජාතිකයන් සතු ව විශාල සංඛ්‍යාවක් යටත්විජිත පැවැතීම ය.

බලවත් බටහිර ජාතීන්ගේ සංස්කෘතික කරුණු වෙනත් රටවල ප්‍රචලිත වීමේ හෝ ප්‍රචලිත කිරීමේ ක්‍රියාවලිය විසිවන සියවසේ අග භාගයේ පටන් හැඳින්වූයේ **ගෝලීයකරණය** (Globalization) යනුවෙනි. දේශපාලන දෘෂ්ටියකින් මෙය දෙස බලන විට, මෙය යටත්විජිතකරණයේ අභිනව ස්වරූපය ලෙසින් පෙනිණ.

බලවත් ජාතීන්ගේ භාෂා, **ලෝක භාෂා** (World Languages) බවට පත්විය. පසු ව එම භාෂා **ගෝලීය භාෂා** (Global Languages) යනුවෙන් ද හැඳින්වින. ඇතැම් තැන්වල ජාත්‍යන්තර හෙවත් අන්තර්ජාතික භාෂා යනුවෙන් දැක්වා ඇත්තේ ද මෙයම ය. එම භාෂා අධ්‍යයනය ගෝලීය භාෂා අධ්‍යයනය යනුවෙන් දළ වශයෙන් නිර්වචනය කළ හැකි ය.

භාෂා ඉගෙනීමේ ක්‍රියාවලියට දීර්ඝ ඉතිහාසයක් තිබූ අතර, එය නව ස්වරූපයක් ගත්තේ විසිවන සියවසේ මැත භාගයේ සිට ය. එයට හේතු වූයේ දෙවන ලෝක සංග්‍රාමය යි. එම කාලය වන තුරු ම පැවැතියේ සම්භාව්‍ය භාෂා හැදෑරීම ය. එයට අතිරේක ව ජර්මන් සහ ප්‍රංශ භාෂා ඉගෙනීම ද අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රචලිත ව පැවැතිණ.

බලවත් ජාතීන්ගේ භාෂා, ලෝක භාෂා (World languages) බවට පත්විය. පසු ව එම භාෂා ගෝලීය භාෂා (Global languages) යනුවෙන් ද හැඳින්වින. ඇතැම් තැන්වල ජාත්‍යන්තර හෙවත් අන්තර්ජාතික භාෂා යනුවෙන් දැක්වා ඇත්තේ ද මෙයම ය. එම භාෂා අධ්‍යයනය ගෝලීය භාෂා අධ්‍යයනය යනුවෙන් දළ වශයෙන් නිර්වචනය කළ හැකි ය.

දෙවන ලෝක සංග්‍රාමයට සහභාගි වූ බටහිර ජාතීන්ට - විශේෂයෙන් අමෙරිකානු සෙබළුන්ට අරාබි භාෂාව සහ ජපන් භාෂාව ඇතුළු පෙරදිග භාෂා ඉගෙනීමට අවශ්‍ය විය. එහි දී ඉගැන්වුණේ සම්භාව්‍ය භාෂා නො ව, එම අවධියේ අදාළ ප්‍රදේශවල ජනයා අතර තිබූ, එම කාලයට අයත් වූ නූතන භාෂා ය. මෙම කාර්යය ඉෂ්ට කර ගැනීම පිණිස ප්‍රථමයෙන් සම්භාව්‍ය භාෂා ඉගැන්වූ ආචාර්යවරුන්ගේ සහය ලබාගත්තේ ය. එහෙත්, ඒ අයගේ ප්‍රයත්නය අසාර්ථක විය.

මෙම කාලයේ දී - එනම් 1930 න් පමණ පසු නූතන භාෂාවේදීන්, නූතන භාෂා විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කොට තිබිණ. විශේෂයෙන් අමෙරිකානු වාග්වේදීන් විසින් විශ්ලේෂණය කරනු ලැබූයේ උතුරු අමෙරිකාවේ ආදිවාසීන්ගේ භාෂා ය. එහි දී ප්‍රමුඛ ස්ථානය ලැබුණේ භාෂණය හෙවත් කථාව්‍යවහාරයේ යෙදුණ භාෂා විශ්ලේෂණය කිරීමට ය. සාම්ප්‍රදායික භාෂා ඉගැන්වීමේ පරිචය ලබා තිබුණ ගුරුවරුන්ගේ කාර්යභාරය. වාග්වේදීන්ට පැවරිණ. ආරම්භයේ දී මෙය දුෂ්කර කාර්යයක් වුව ද, පසු ව එය සාර්ථක ව්‍යාපාරයක් බවට පත් ව, දෙවන භාෂා ඉගෙනීම කෙටි කාලයක් තුළ සිදු කළ හැක්කක් බවට

පත් විය. එහෙත්; බටහිර ලෝකයේ සාම්ප්‍රදායික භාෂා ගුරුවරුන් මෙය දෙස බැලූයේ වෙනස් ආකාරයකිනි. ඔවුහු මෙම ක්‍රමය - එනම් කෙටි කලකින් භාෂාව ඉගැනීමේ ක්‍රමය Army Method යනුවෙන් හැඳින්වූහ.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ව භාෂා ඉගෙනීම පිළිබඳ වෙනස් තත්ත්වයක් ඇති විය. බටහිර ලෝකයේ විශ්වවිද්‍යාලවල නූතන භාෂා ඉගැන්වීම හා සම්බන්ධ ව ව්‍යවහාරික වාග් විද්‍යාව (Applied Linguistics) යනුවෙන් නව ශික්ෂණයක් පහළ විය. එක්සත් ජනපදයේ මිචිගන් (Michigan) විශ්වවිද්‍යාලය මෙහි දී ප්‍රමුඛ ස්ථානයක් ගත්තේ ය. බ්‍රිතාන්‍යයේ එඩින්බරා විශ්වවිද්‍යාලයේ ද එම ශික්ෂණය පිළිබඳ ආරම්භයක් ඇති විණ.


මෙම ආයතන මඟින් කෙරුණේ ඉංග්‍රීසි භාෂාව වෙනත් භාෂා කථා කරන අයට ඉගැන්වීම ය. මෙය ඇතැමුන් දකින්නේ යටත්විජිතවාදී සංකල්පය යටපත් වන විට පැන නැඟි භාෂා අධිරාජ්‍යවාදයක් සේ ය. කෙසේ වුව ද නව දැනුම් සම්භාරයක් බටහිර ලෝකය සතු ව ඇත. එය, වෙනත් භාෂා කථා කරන්නවුනට ද ලබා ගත යුතු ව ඇත. එය කළ හැක්කේ කෙසේ ද? භාෂා අධ්‍යයනය මඟින් පමණකි. සංවර්ධනය වන රටවල භාෂා මෙහි දී වැදගත් නො වේ. වැදගත් වන්නේ ගෝලීය භාෂා පමණකි.

මේ හේතුව නිසා ජානකාරී සමාජයක (Information Society) සාමාජිකයනට ගෝලීය භාෂා හැදෑරීම ඉතා අවශ්‍ය ව ඇත. එහි දී ප්‍රමුඛත්වයට පත් වන්නේ දැනුම ලබා ගැනීමේ අදහස ය. එහි දී භාෂාව යොදාගනු ලබන්නේ උපකරණයක් වශයෙන් පමණකි. මෙය දෙවන භාෂා ඉගැන්වීමේ දී හා ඉගෙනීමේ දී උපකරණාත්මක අභිප්‍රේරණය (Instrumental Motivation) යනුවෙන් දක්වනු ලැබේ.

භාෂා ඉගෙනීම සඳහා විවිධ ක්‍රමවිධි (Methods) පහළ ව ඇත. දෙවන භාෂා හෝ ගෝලීය භාෂා (Global Languages) ඉගෙනීමේ ක්‍රම විධි අතර වෙනසක් ඇති බවක් නො පෙනේ. පැරණි කල සම්භාව්‍ය භාෂා ඉගෙනීමේ දී යෙදුණ ක්‍රමය, ව්‍යාකරණ - පරිවර්තන ක්‍රම විධිය (Grammar-translation Method) නමින් හැඳින්විණ. එහි දී කෙරුණේ සම්භාව්‍ය භාෂාවෙන් ලියැවුණු වගන්ති ආදිය තම භාෂාවට පරිවර්තනය කිරීමක් සහ තම භාෂාවෙහි එන සරල වගන්ති සම්භාව්‍ය භාෂාවට පරිවර්තනයක් කිරීමකි. භාෂාව සන්නිවේදනය සඳහා භාවිත කිරීමක් මෙහි දී සිදු නො වී, ලතින්, සංස්කෘත, පාලි වැනි භාෂා ඉගැන්වීමේ දී ද භාවිත වන්නේ මෙම ක්‍රම විධිය යි.

යටත්විජිත පහළ වීම සමඟ තවත් ක්‍රම විධියක් පහළ වූ බව පෙනේ. එනම් (Direct Method) යනුවෙන් දක්වනු ලැබූ ක්‍රම විධිය යි. මෙය විසිවන සියවසේ මුල් භාගයේ සිට පැවැත ආවකි. එහි දී පරිවර්තනයක් නැත. ස්මෘතියේ රඳවා ගැනීමක් හෙවත් කටපාඩම් කිරීමක් නැත. ඒ සියල්ල එහි දී ඉවත් කෙරේ. පන්ති කාමරය තුළ ස්වභාෂාව කවර ආකාරයකින් හෝ යොදා නො ගැනේ. ඇතැම් විට මෙයට හේතු වන්නට ඇත්තේ භාෂා ගුරුවරයා භාෂාව ඉගෙන ගන්නා වූ පුද්ගලයාගේ භාෂාව පිළිබඳ කිසිවක් නො දැන සිටීම ද විය හැකි ය. එයට අතිරේක වශයෙන් මෙම ක්‍රමය අනුගමනය කරන්නවුන්, දෙවන භාෂා ඉගෙනීම ප්‍රථම භාෂා ඉගෙනීමට ම සමාන යැයි සිතන්නට ඇත. එහෙත්, සැලකිය යුතු කරුණ වන්නේ, ප්‍රථම භාෂා ඉගෙනීමේ දී දරුවා විවෘත වූ සමාජීය හා මානසික පරිසරය නැවත වරක් නිර්මාණය කිරීමේ දුෂ්කරතාව යි.

විසිවන ශතකයේ මැද භාගයේ දී උතුරු අමෙරිකානු සහ බ්‍රිතාන්‍ය වාග්වේදීන්ගේ සහභාගිත්වයෙන් ශ්‍රව්‍ය-භාෂණ ක්‍රම විධියක් (Audio-Lingual Method) පහළ විය. එම කාලය වන විට වාග් විද්‍යාව පිළිබඳ සංයුතික



ඩෙල් හයිම්ස්

**විශ්ලේෂණ විධිය** (Structural Analysis) දැඩි සේ ප්‍රචලිත ව තිබිණ. භාෂාවක් පරිහරණයට ගැනීම මානව චර්යාවේ කොටසක් හැටියට සැලකිණ. එබැවින් භාෂාව ඉගෙනීම, පරිහරණයට ගැනීම ආදී සියල්ල **චර්යාවාදයේ** (Behaviourism) කොටසකි. මෙහි දී ද්විතීය භාෂාවේ ඒකක **හඳුනා ගැනීමත්** (recognition) අනතුරු ව එම ඒකකය අනුකරණය කිරීමත් (Imitation) **පුනරුච්චාරණය කිරීමත්** (repetition) සිදු කෙරේ.

අනතුරු කාලයේ දී එනම් 1970 පමණ පසු භාෂා ඉගෙනීම පිළිබඳ **සන්නිවේදන ප්‍රවේශය** (Communicative Approach) යනුවෙන් ක්‍රම විධියක් ඇති විය. එහි ආදි කර්තෘවරයා වන්නේ ඩෙල් හයිම්ස් (Dell Hymes) නම් වූ අමෙරිකානු සමාජ විද්‍යාඥයා ය. භාෂාව සන්නිවේදනය සඳහා වන්නක් බව මෙහි දී අවධාරණය කෙරේ.

ද්විතීය භාෂා ඉගෙනීම පිළිබඳ මේ ආකාරයෙන් ක්‍රමවිධි රාශියක් ඇති වීමට හේතු වී ඇත්තේ ඒ ඒ ක්‍රමවිධියේ පවත්නා දුබලතා ය. ඒ සමඟ ම ව්‍යාකරණ-පරිවර්තන ක්‍රමවිධියේ පටන් එන සියලු ම ක්‍රමවිධිවල ප්‍රබලතා ද ඇත. එම ප්‍රබලතා රැස්කොට ගෙන ඇති කරගනු ලබන **සංයුක්ත ක්‍රම විධියක්** (Electic Method) පිළිබඳ ද වර්තමානයේ සඳහන් වේ.

නූතන සමාජයේ වසන සාමාජිකයා, ගෝලීය භාෂා අධ්‍යයනයනට ප්‍රවේශ විය යුතු වේ. එහි දී තම ප්‍රථම භාෂාවේ ලක්ෂණ ද සැලකිය යුතු ය. එය දෙවන භාෂාවේ ලක්ෂණවලින් වෙනස් වන්නේ කෙසේ දැයි විමසිය යුතු ය. ලෝකයේ භාෂා එක හා සමාන නො වේ. එම භාෂාවල යෙදෙන ශබ්ද, පද, වචන, වාක්‍ය ආදිය එකිනෙකට වෙනස් ය. "එක් භාෂාවක් තවත් භාෂාවකින් වෙනස් වෙයි" යනුවෙන් සඳහන් කරන්නේ ඒ නිසා ය.

භාෂා වෙනස් වන්නේ එහි බාහිර ව දක්නට ලැබෙන ලක්ෂණවලින් පමණකි. භාෂාවේ අභ්‍යන්තර අංශ - එනම් අර්ථය පිළිබඳ අංශයේ දී භාෂා අතර ඇති සමරූපතාව පැහැදිලි වේ.

සෑම පුද්ගලයකු ම තම ප්‍රථම භාෂාව ග්‍රහණය කොට ඇත. එනම් එම භාෂාවලට අයත් සූත්‍ර සමුදාය ඔහුගේ මනසෙහි ඇත. ගෝලීය භාෂාවක් හෝ වෙනත් ද්විතීය භාෂාවක් හැදෑරීමේ දී සිදු වන්නේ මනසෙහි තැන්පත් ව ඇති සූත්‍ර සමුදාය පිළිබඳ සංශෝධනයක් පමණකි.


දෙවන භාෂාවක් නැතහොත් ගෝලීය භාෂාවක් හැදෑරීම, බොහෝ විට සිදුවන්නේ තම ප්‍රථම භාෂාව ස්වීකරණය කොටගෙන අවුරුදු ගණනාවට පසු ව ය. ප්‍රථම භාෂාව ස්වීකරණය සිදුවන කාල පරිච්ඡේදය හැඳින්වෙන්නේ **ශීඝ්‍ර වර්ධනාත්මක අවධිය** (Critical Period) ලෙස ය. අදාළ භාෂාව හා සම්බන්ධ සියලු ම අංශ එම අවස්ථාව තුළ දී දරුවාගේ අත්දැකීමට

හසු වෙයි. එබැවින් දරුවාගේ කථනය හෙවත් **වාගාලාපයත්** (Utterance) බාහිර වශයෙන් පරිසරයේ ඇති වන **සිද්ධියත්** අතර, වෙන් කළ නො හැකි සම්බන්ධයක් ඇති වේ. මෙම ලක්ෂණය පිළිබඳ විමසීමක් කෙරෙන ඉංග්‍රීසියෙන් ලියැවුණ ලේඛනවල, මෙම මුළුමහත් ක්‍රියාවලිය දැක්වීම පිණිස Synchronization යන වචනය යොදා ඇත. එය **අවස්ථාබද්ධ වීම** යනුවෙන් සිංහලයට පරිවර්තනය කළ හැකි ය. එම ක්‍රියාවලියේ යහපත් ප්‍රතිඵල ඇත. එනම් කවර අයකුට වුව ද තම ප්‍රථම භාෂාව අමතක නො වීම යි. දෙ වන භාෂාව නැතහොත් ගෝලීය භාෂාව ග්‍රහණය කිරීම පොදු වශයෙන් දෙවන භාෂා ඉගෙනීම (Second Language Learning) යනුවෙන් දැක්වේ. එය ප්‍රථම භාෂා ස්වීකරණය මෙන් නො වේ. විධිමත් අධ්‍යාපනයෙන් ලබන්නකි. එම අවස්ථාව වන විට ග්‍රාහකයා තම ප්‍රථම භාෂාව ස්වීකරණය කොට අවසන් ය.

දෙ වන භාෂාවෙහි ලක්ෂණ සියල්ල ම ප්‍රථම භාෂාවෙහි නැත. එසේ ම ප්‍රථම භාෂාවෙහි ඇති ලක්ෂණ සියල්ල ම දෙ වන භාෂාවෙහි නැත. එම හේතුව නිසා ප්‍රථම භාෂා ලක්ෂණ දෙ වන භාෂාව කෙරෙහි බලපෑමක් ඇති කරයි. මෙම ලක්ෂණය දැක්වීම පිණිස **නිරෝධනය** (Interferance) යන වචනය යොදනු ලැබේ. නිදසුන් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙහි දැක්වෙන the යන වචනය 'ද' යනුවෙන් සිංහල භාෂකයන් විසින් උච්චාරණය කරනු ලැබීම දැක්විය හැකි ය. එය සිදු ව ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙහි the යන වචනයේ ඇති එක් ශබ්දයක් සිංහල භාෂාවෙහි නොමැති වීම ය. එබැවින් ඉංග්‍රීසි භාෂාවෙහි ඇති ශබ්දය වෙනුවට සිංහල භාෂාවෙහි සමීපතම ශබ්දය ආදේශ වී ඇත. මෙම අංශය කෙරෙහි නූතන භාෂා අධ්‍යයනයේ දී අවධානය යොමු ව ඇත. ඒ පිළිබඳ අධ්‍යයනය **ප්‍රතිරෝධක විශ්ලේෂණය** (Contrastive Analysis) යනුවෙන් දැක්වේ. එහි දී අදාළ භාෂා දෙක, ශබ්ද, පද, වචන, වාක්‍ය වැනි ස්තරවල දී සසඳනු ලැබේ. එහි මූලික හරය වන්නේ දෙ වන භාෂාව එම භාෂාවේ ලක්ෂණවලට සමීප ආකාරයෙන් හැදෑරීම ය.

මෙබඳු දුෂ්කරතා පැවැතිය ද දෙ වන භාෂාවක්/ ගෝලීය භාෂාවක් නොමැති ව නූතන සමාජයට තම අභිමතාර්ථ ඉෂ්ට කර ගැනීම අතිශයින් දුෂ්කර ව තිබේ. මෙහි දී තවත් එක් අංශයක් පිළිබඳ ව සැලකිය යුතු ව තිබේ. ලෝකයේ පවත්නා විවිධ භාෂා අතුරින් සමහර භාෂා හා සම්බන්ධ ව තිබෙන්නේ සීමිත භාෂක සංඛ්‍යාවක් පමණකි. ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන්ගේ භාෂාවල ස්වරූපය එයට නිදසුනකි. එබඳු භාෂා ආපදාපන්න භාෂා (Endangered Languages) යනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නම් කරනු ලැබ ඇත.

එබඳු සංස්කෘතික අංශවල ස්වරූපය කවර ආකාර වුවත් නූතන සමාජය, ආර්ථික, විද්‍යාත්මක හා තාක්ෂණික අංශවලින් බලවත් තත්ත්වයට පත් ව ඇති ජාතීන්ගේ භාෂා ගෝලීය භාෂා වශයෙන් සලකා, එම භාෂා අධ්‍යයන කිරීමට ප්‍රවේශ වී ඇත. එය වඩාත් ප්‍රතිඵලදායක ආකාරයෙන් ඉෂ්ට කර ගැනීම පිළිබඳ ගැටලුව වර්තමානයේ දී පහළ ව තිබේ. එයට පිළිගත හැකි විසඳුමක් සැපයිය යුත්තේ භාෂාව විද්‍යාත්මක තලයක් මත සිට විශ්ලේෂණය කිරීමේ පරිචයක් ලද භාෂා ගුරුවරුන් ය.




**මහාචාර්ය තිස්ස ජයවර්ධන**


සිංහල භාෂාව හා වාග් විද්‍යාව පිළිබඳව හිටපු මහාචාර්යවරයෙකි.



*සංස්කෘතික දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය මගින් ක්‍රියාත්මක 'මාසික සාහිත්‍ය සංකථන' සම්මන්ත්‍රණ මාලාවෙහි පෙබරවාරි මාසයේ පැවැත්වුණු දේශනයක පිටපතකින් උපුටා ගැනිණි.*

# සාහිත්‍යය

## මනුෂ්‍යත්වයෙහි විශේෂ අනුභවයකි



සාහිත්‍යය නම් කෙබඳු දෙයක් ද? එය මනුෂ්‍යත්වයෙහි විශේෂ අනුභවයෙකැයි කියතොත් සියල්ලන්ගේ අනුභවය එක සමාන වනුයේ කෙසේ දැයි ප්‍රශ්නයෙක් පැන නැඟේ. අනුභවය වූ කලි මනුෂ්‍ය වර්ගයාගේ පරිස්ථිතියට (ආශ්‍රයට) අනුව නොඑක් ප්‍රභේද ඇත්තේ වේ. කවර හෙයින් යත්: පරිස්ථිතිය (Atmosphere) වනාහි හැම විටම එක සමානව නොපවතී. හැම තන්හිම සමව ද නොපවතී. අද එකෙක, හෙට එකෙක, නගරයෙහි එකෙක, වනයෙහි අනිකෙක. මේ නියායෙන් වෙනස් වෙනස් වූ පරිස්ථිතිය නිසා මිනිසුන් කෙරෙහි නොඑක් විදියේ ප්‍රවෘත්තීහු පැන නඟිත්. (මේ ප්‍රවෘත්තීන් ක්‍රියාවෙහි යෙදවීමේ දී හා පැතිර යෑමේ දී ඒ ඒ මනුෂ්‍යයාගේ සිත්හසර ද එහි ලා සහය වේ. නාගරිකයාගේ පැවැතුම් එක් ලෙසකය. ආරණ්‍යකයාගේ පැවැතුම් වෙන විදියක ය. මේ කිමෙක් ද? නගරයෙහි පවත්නා පරිස්ථිතියෙහි ලා හමුවන අරමුණ (Stimulus) වනයෙහි දී නොපැනේ. එහි දී හමුවන අරමුණ මෙහි දී හමු නොවේ. අරමුණ යම් ලෙසකට ද චෙෂ්ටාව (Response) ද එලෙසටය. අරමුණ යම් බඳු ද චිත්ත ප්‍රවෘත්තිය ද තදනුගත ය. අරමුණ භින්න වෙත්ම චෙෂ්ටාවෝ (ක්‍රියාවෝ) ද භින්න වෙති. මේය ස්වාභාවික නියමය නම්.

අනුභවය සාහිත්‍යයාගේ මුල යැයි අපි යට කීවෙමු. හෙයින් අනුභවය නම් කිමෙක්දැයි දැන් ප්‍රශ්නයෙක් නැඟේ. චිත්ත ප්‍රවෘත්තියෙහි වරින්වර උපදින යම් චෙෂ්ටාවක් වේ ද ඒ මේ අභ්‍යාසය කල් යෑමේ දී අනුභවය නමින් දන්නා ලැබේ. මේ අනුභවය හැඟවීම (කියාපෑම) සාහිත්‍ය නම්. මේ අනුව විමසන කලට වනවාසියකු කෙරෙහි වන අනුභවය නගරවාසියකුට පහළ විය නොහැකිය. ප්‍රචණ්ඩවාතය, ධාරානිපාත වෘෂ්ටිය, කෲර වල් සත්තුය යන මෙයින් නාගරිකයන් කෙරෙහි තරමට වන වාසීන් කෙරෙහි බියෙක් හට නොගනී. එසේ ද වුව වනවාසීන් දුම්රිය, මොටෝරිය ආදියෙන් නිකුත්වන ශබ්දයෙන් බියට පැමිණෙන්නවුන් අපි දකිම්හ. මේ දෙපස අතර මෙබඳු වෙනසක් ඇතිවීමට හේතුව කිම? ග්‍රාමීණයෙක් (ගම්වැසියෙක්) යම් මනෝවෘත්තියක් වරින්වර පවත්වාද එය නාගරිකයකු කෙරෙහි නොපවතී. එසේම නුවරුන් තුළ පවත්නා අනුග්‍රහය වනවාසීන්

තුළ නොපවතී. නගරයෙහිත් වනයෙහිත් අරමුණු හා ක්‍රියා කෙසේ නම් සමවිය හැකි ද? නොහැකිමය.

මනුෂ්‍යයකුගේ සංස්කාරය නම් අනුභවයමය. සංස්කාරයෙන්ම ව්‍යක්තිත්වය (Personality) හැඩ ගැසේ. මනුෂ්‍යයාගේ ගතිගුණ මේ ව්‍යක්තිත්වය අනුව පවත්නේ වේ. මේ ව්‍යක්තිත්වය ගණන් නොගෙන හැරිය කලට ප්‍රතිභා ශක්තියට අයත් අල්පමාත්‍ර වූ හෝ ආලෝකයක් විහිදුවාලිය හැකි කොටසක් මනුෂ්‍යයකු පිළිබඳව ඇති නොවේ. එසේ හෙයින් අප මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ **ව්‍යක්තිත්වය** (Personality) හෝ **විශේෂත්වය** (Peculiarity) **යම් සාහිත්‍යයෙක්හි නැත්නම් එය සාහිත්‍යයක් නොවන බවයි.**

**සාහිත්‍යය** විද්‍යාවගේ එක්තරා අංගයෙකැයි කියනු ලැබේ. ශික්ෂණයෙහි ලා සාහිත්‍යයෙන් පිරිය යුතු අංශය ඉතා විශාලය. විද්‍යාව මනුෂ්‍ය වර්ගයාගේ උන්නතියට ආධාරය, ශරීරය හා මනස වැඩීමට මූලයයි විද්‍යාඥයෝ කියති. එසේ කලට සාහිත්‍යය මේ මහඟු කාර්යයන් පූරණය කිරීමෙහි ලා සාකල්‍යයෙන්ම සහය වන බව අමුතුව කිවමනා නොවේ. ආත්ම විකාසයෙහි මූලය කොයි ද? උන්නතියෙහි ආධාරය කොයි තිබේ ද? අනුභවය නමැති ආධාරය කොයි තිබේ ද? අනුභවය නමැති භූමිය හැර වෙන තැනෙක එය පවතී යැයි කිය නොහැකිය.

ඇස්, කන්, නැහැ, දිව, කය යන මේ සියල්ලම පවත්නේ අනුභවය උපදවනු සඳහාය. මේ උපකරණයෝ මිනිස් තිරිසන් දෙපක්ෂයටම ඇත. එතෙකුදු වුව මිනිසුන් කෙරෙහි කිසියම් විශේෂ බලයෙක් ඇත; බුද්ධිය ඇත; භාවනාව ද ඇත; කල්පනා ශක්තිය ද ඇත. මේ සියලු ශක්තීහු විවෙක (බුද්ධි)ය නමැති අග්නි ජාලායෙහි ලා පිරිසුදු කරගනු ලබත් නම් එයින් එක්තරා විශේෂ ශක්තියක් පහළ වෙතැයි දාර්ශනිකයෝ කියති. මෙය ඌහා නමින් දන්නා ලැබේ. ඉන්ද්‍රියානුභවය, භාවනාය, කල්පනාය යන මේ ශක්තීන් පිළිබඳ ඉතා පැහැදිලි අවස්ථාව වූ ඌහාව හුදෙක් මිනිසුනට පමණක්ම ආවේණිකය. විශේෂයෙන් හිමි ය. යම් හෙයකින් මනුෂ්‍යයන් කෙරෙහි මෙබඳු විශේෂත්වයෙක් තිබේ ද, එහෙයින්ම ඔවුන්ගේ අනුභවයෙහිත් එය ප්‍රකාශ කිරීමෙහිත් ලා විශිෂ්ටත්වයක් ඇති විය යුතුය. ඔවුන්ගේ අනුභවය පිළිබඳ හැම ව්‍යක්ත ස්වරූපයෙක් (පැහැදිලි අවස්ථාවෙක්)හි ම මේ විශිෂ්ට ශක්තිය හඟවන මුද්‍රාව නොතිබේ නම් ඔවුන්ගේ වචනයෙහි හා තිරිසනුන්ගේ කථායෙහි කිසි වෙනසක් ඇති විය හැක්කේ කෙසේද? නොහැකිමය. මනුෂ්‍යයන්ගේ ඌහාව වූ කලි ඉතා විචිත්‍ර ශක්තියෙකි. එහි ඉන්ද්‍රියයන් පිළිබඳ ඥානය ඇත. සමෘතිඥානය ද ඇත. විචාර බුද්ධිය ද ඇත. එමතු නොව, මේ ඌහා තොමෝ මෙකී තාක් ශක්තීන් හසුරුවාලීමෙහි ද සමර්ථය. මනුෂ්‍යයා කෙරෙහි ඌහා ශක්තිය පවත්නා කලම ඔහුගේ වෛචිත්‍ර්‍යය ද විහිදී පැතිර පවතී. යම්තාක් මේ ඌහා ශක්තිය ඔහු කෙරෙහි නොපවතී ද ඒ තාක් හෙතෙම හුදෙක් දෙපා ඇති තිරිසනෙකි. මේ වනාහි කිසියම් අලුත් මතයෙක් නොවේ. පුරාතන සිද්ධාන්තයෙකි. මෙය මෙකල පාශ්චාත්‍ය (බටහිර) පණ්ඩිතයෝ ද පිළිගනිති. ඔවුන් හැම දෙන විසින්ම කියන්නේ, "ඌහා ශක්තිය සම්පූර්ණව පිහිටි මනුෂ්‍යයන්ගේ අනුභවය පිළිබඳ නෛසර්ගික ප්‍රකාශය වනුයේ යමෙකින් නම් ශ්‍රේෂ්ඨ සාහිත්‍යය ඒ ය. මෙබඳු උසස් මනුෂ්‍යයකුගේ ජීවිතය නමැති ආලෝකයෙන් ලෝකයට හිත සැලසේ. එසේ හෙයින් **යමක් හිත සහිතව පවතී ද සාහිත්‍යය නම් එයමය** කියා ය.

ඉදින් සාහිත්‍යතත්ත්වය මෙබඳු නම්, අනුභවය පිළිබඳ නවෝන්මේෂයක් (නව විකාසය) නැති ලිපියක් අපට සාහිත්‍ය කෘතියක් සේ සලකන්නට හැකි ද? නොහැකීම ය.

පැරැණි පොත් මඳ මඳව අඩුවැඩිකම් ඇතිවන සේ වෙනස් කරලීම සාහිත්‍ය කෘතියක් නොවේ. දුටු දුටු දෙයක්, ඇසූ ඇසූ දෙයක් එලෙසටම ලියාපෑම උපන්‍යාසයක් (Novel) නොවේ. කථාවන් හුදෙක් දොඩන (කථාකරන) න්‍යායෙන් ලීම නාටකයක් නොවේ. ශබ්දයන් යති හා අනුප්‍රාස නමැති යදමින් බැඳ තැබීම කාව්‍ය තැනීමක් විය නොහේ. කාව්‍ය, නාටක, උපන්‍යාස යනු හුදෙක් ලිපියෙහි පැනෙන ස්ථූල රූපයට කරන ව්‍යවහාරයෙක් නොවේ. එය නම් කවීහුගේ හැඟීම් පිළිබඳ සිතුවම්පටෙකි. සිතිවිලි මනින කෝදුවෙකි. මේ කාව්‍යාදියෙහි සත්‍ය ස්වරූපය නම් ලේඛකයාගේ හෘදය විදහා පෑම විය යුතු. ඔහුගේ අනුභවය පිළිබඳ යථාතත්ත්වය දැක්වීම විය යුතු.


සාහිත්‍යයාගේ ස්වරූපය හා වස්තුව හැම විටම අසාමාන්‍ය විය යුතු බවක් අපි මෙයින් අදහස් නොකරම්හ. එසේ ද වුව සාමාන්‍ය වස්තුවක් සාහිත්‍යයට ඇතුළත් කරතොත් එය හැඟවීම ක්‍රමයෙහි කිසියම් නවීනත්වයක් අවශ්‍යයෙන්ම තිබිය යුතු. මෙබඳු නවීනතාව කරණකොට ගෙන කියවන්නහුගේ මොළය තියුණු වෙයි. හෘදය විකසිත වෙයි. මොළයෙහි මේ නිසා තීව්‍රතාවක් ඇතිවෙත්ම එය ලියලන්නට පටන්ගනී. යම් සාහිත්‍යයෙක මෙබඳු ශක්තියක් නැත්නම් එහි කිසිදු වටිනාකමෙක් නැති. කවර හෙයින් යත්, එයින් මනුෂ්‍යයන්ගේ නියම අවශ්‍යතාවෝ නොපිරෙති, එහෙයිනි.

නාඩගමක් බැලීමෙන් මනුෂ්‍යයකුගේ මොළයෙහි කිසියම් තියුණු බවෙක් ඇති නොවේ. අවුරුදු පතා පෙන්වන නාඩගමක් ගැන අපි සිතා බලමු. අවුරුදු පතාම එහි යන එන ජනයාත්, ඔවුන්ගේ වස්ත්‍රත්, එහි ආසන පිළියෙල කර තිබෙන ආකාරයත් රියවල සැරසීම් හා මිනිසුන් පැලඳගත් අභරණත් යන මේ සියල්ල වෙනස් වෙනස්ව දක්නා ලැබේ. එසේ ද වුව මෙසේ අවුරුදු පතා අමුතුව යන එන මේ ජනතාව මෙහෙයවන ශක්තිය කවරක් ද? මේ නාඩගම්වල ප්‍රමෝදය ගෙන දෙනසුලු, ප්‍රබෝධය ඇති කරවනසුලු, බලන්නවුන්ගේ මොළයෙහි හා හෘදයෙහි එක්තරා නව ප්‍රබෝධයක් ඇති කරවනසුලු දෙයෙකුත් තිබේ ද? වැළිඳු දහසක් දෙනා මේ නාඩගම් බලා විනෝදයකුත් ලබත්ලු. අර්ථයක් විය හැකි ද? නාඩගම් බලන්නට යෑම හිස් සතුටක් වන්නා හාම එයින් ලැබෙන ප්‍රීතිය නිසරුය, ළාමකය. හුදෙක් මෝඩයන්ගේම සිත පිනවන්නෙකි. කිමෙක්ද? සාහිත්‍යයෙන් ලබන විනෝදයත් මෙයින් කෙළවර විය යුතු ද? නැතහොත් එහි කිසියම් විශේෂ කරුණක් තිබිය යුතු ද?

බලන විමසන හවතුන්ගේ නැණැසට යොමුව එය විවෘත කර තබන්නේ යමෙක් ද එය සාහිත්‍යය නම්. සිතෙහි ආවරණයන් පහකොට සිතැඟි විදහාපාන්නේ යමෙක් ද එය සහිත්‍යය නම්. යමෙක් එක්තරා නවීන දෘශ්‍යයක් (Phenomenon) ගෙන දෙයි ද, යමෙකින් අපේ ජීවනය පිළිබඳ රහස් එළිවේ ද එය ම සාහිත්‍යය නමි. - ශ්‍රී තාරානාථ



අනුවාදකඃ මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති
1935 නොවැම්බර ප්‍රභාෂෝදය සඟරාවෙනි.



# විදුලි පුවත

ශෑලේශ් මටියානී විසින් විරචිත මෙම හින්දි කෙටිකතාව හින්දි සාහිත්‍යයේ 'ආංචලික් කහානී' හෙවත් 'ප්‍රාදේශීය කෙටිකතා' ගණයට අයත් වෙයි. උත්තර භාරතයේ කුමාඋං නම් කඳුකර පළාතේ ග්‍රාමීය ජන ජීවිතයෙහි පැතිකඩක් මෙයින් නිරූපණය වෙයි. කාශ්මීරය මුල්කොට ගත් ඉන්දු පකිස්තාන් යුද සමයක් මෙයට පසුබිම් වී ඇත. ආර්ථික දුෂ්කරතාවලින් මිදීම සඳහා මේ ප්‍රදේශවල බොහෝ තරුණයෝ ඉන්දියානු යුද හමුදාවට බැඳී යුද භූමියට ගොස් සිටියහ. ගම්මානයෙහි ඉතිරි වූයේ කාන්තාවන් දරුවන් හා වැඩිමහල්ලන් පමණි.

ලියුම් කවරයේ පිටපැත්තේ ලිපිනය ලියා තිබුණේ මේ ආකාරයට ය.

සස්ති සිරි සර්බෝප්මා (ස්වස්ති ශ්‍රී සර්වෝත්තමා)
සිරිමාන් (ශ්‍රීමාන්) ඨාකුර් ජයෝත්සිංහ් නේගී
ග්‍රාම ප්‍රාධානි කමස්යාරී ගම්මානය
ලොකු මිදුලක් ඇති නිවස,
බුමානී ගස අසල,
ලිපිනය ඉහළින් ලියා ඇත. චේනීගේ තැපෑල,
මේ ලිපිය ඨාකුර් ජයෝත්සිංහ නේගීට
හැකි ඉක්මනින් ලැබේවා.
ලිපිය එවන්නා ඔහුගේ පුතා රතන්සිංහ් නේගී
හල් මුකාම් හමුදා තිල නිවාසය,
දේහ්රාදූන්, තැපැල් දිස්ත්‍රික්කය එයමයි.
බැටැලියන් අංකය K-B-2-339
සොල්දාදු අංකය .........

.......දිග, සාමාන්‍ය ලියුම් කවරය පුරා තැනින් තැන අලවා තිබූ මුද්දර පමණක් බේරමින් ලිපිනය ලියා තිබුණි.

දයාරාම් තැපැල් මහත්තයා සිනහවක් පාමින් සම්පූර්ණ ලිපිනය ම ගම් ප්‍රධානියාට කියවා දුන්නේ ය. ඨාකුර් ජයෝත්සිංහ් ඉමහත් ගර්වයකින් කතා කළේ ය.

“ඇස් දෙක පාදල දුන්නු එකේ පොරෝජනේ තමයි! කන්නලව් කරලා

කරලා පුතාව පරයිමරි වෙනකං ඉගැන්නුව මං. රතනුවාගෙ අම්මා කිව්වා. "මහපට ඇඟිලි සලකුණ තියල ඔක්කොම වැඩ කරගන්න පුළුවංනං, වෙලාවයි, සල්ලියි විනාස කොරන්නෙ කවුද? මනිඕඩර් එකේ ඇඟිලි අත්සන තිබ්බ ම හම්බ වෙන්නෙත් එක ම ගාණ, අස්සන ගැහුවත් හම්බු වෙන්නෙ එක ම ගාණ...' ඒත් මං හිතුවා අකුරු හතරක් ලියාගන්න පුළුවං වුණා නං ඒ ඇති කියල. අනික් අතට බුරහ්මයා සාස්තරයක් පහළ කොළේ මොන එහෙකට ද?..."

ලිපිය අතට ගනිමින් ගම් ප්‍රධානියා නැවත කතා කළේ ය.

"මේ ලේලියේ! තැපැල් මහත්තයට ඉඳගන්න එකක් එළුව නං."

ඔහු දයාරාම් දෙසට හැරුණේ ය.

"මේ... තැපැල් මහත්තයො! මේ ලියුම කියවල දුන්නනං ටිකක්. රතනුවා ගෙදර හිටිය නං, එයා අපිට ඇහෙන්න කියවනව ඕක. මොනව කියනවද මහත්තයො. කොල්ලා ඉගෙන ගන්න බොහෝම දස්සයි. මුළු පොතම කටපාඩං තිබුණා ඒකට. ඒත් ඉතිං, මෝතීරාම් ඉස්කෝලෙ මහත්තය එක්ක මං තරහ වුණු හින්ද, කොල්ලව හතරෙ කැලෑසියෙ අවුරුදු පහක්ම තියා ගත්තා. මේ...

මොනව ද සැප සනීප ලියල තියෙන්නෙ මහත්තයො?"

දයාරාම් තැපැල් මහත්තයා බුමුතුරුණ මත හිඳ ගනිමින් ලියුම් කවරය විවර කොට ලිපිය කියවන්නට පටන් ගත්තේ ය.

"සස්ති සිරී සර්බෝප්මා (ස්වස්ති ශ්‍රී සර්වෝත්තමා)

පූජනීය පියාණන් පා අල්ලා වඳිමි, නැවත නැවත වඳිමි. එය පිළිගනිත්වා. එසේ ම සස්ති සිරී සර්බෝප්මා මැණියන්ගේ ද පා අල්ලා වඳිමි. එය පිළිගනිත්වා. එසේ ම ජමන්සිංහ් ජ්යූ සහ දාජ්යූ බඩක්සිංහ් ලොකු තාත්තලාට ද වඳිමි. තිනාන් සීයාගේ හිස මත අත තබා ආසීර්වාදය ලැබේවා. පට්වාරී (ආණ්ඩුවේ ඉඩම් ලේකම්) මහත්තයාට දෙඅත් එක්කොට 'ජය් හින්ද්' (ඉන්දියාවට ජය) කීවා කියන්න. ගමේ සියලු දෙනාගේ ම සුවදුක් ඇසූ බව කියන්න. බිමාන්ද් ත්‍යාඩී තැපැල් මහත්තයාගේ ද පා අල්ලා වඳින බව කියන්න. හැකි ඉක්මනින් ලිපිනය ලියූ ලියුම් කවරයක ඔබගේ ලියුම මට ලැබෙන්නට, මගේ නමට රත්නසිංහ් නේගී නමට එවන්න. ඒක ඕනෑමයි. ඔබගේ පුතාට ඔබේ පාවල ආසීර්වාදය ලැබේවා.

රතන්සිංහ් නේගී 339

තවත් එක කාරණයක් මතකෙට ආවා. පුංචි මල්ලි ආනන්ද්සිංහ්ට මගේ ආසීර්වාදය ලැබේවා. එයාගෙ විවාහ කටයුත්ත සිදු කරන්න උත්සාහ ගන්න. ජාති-කුල වෙනස්කං ගැන හුඟාක් හොයල මොකටද. දෙවියන් හැම දෙයක්ම නිර්මාණය කරල තියෙන්නෙ සමානවයි. ඨාකුර් චේත්සිංහ්ගේ දුවට තිලකය තියන්න කියන්න. පෙනුම හොඳයි. යහපත් කෙනා, බලන්නකො. තව මොනවද ලියන්නෙ. තාත්තා හොඳට දැනුං තේරුං තියෙන කෙනෙක්නෙ. චරණ්සිංහ් සෝරජ්යූට කියන්න, ශ්‍රී ගෙදර ආවට පස්සෙ ලේලිට සුබ පැතුමක් එවන්නං කියල. මාමා නැන්දා දෙදෙනොගේම පාවල ආසීර්වාදය ලැබේවා. ඔබගේ පුතා රතන්සිංහ් නේගී 33...., මේ දවස්වල මෙහෙ සීතල කාලෙ. හිම වැටෙනව හරියට. ඩියුටි ඔෆිසර් කෑගහනවා. මං බූට්වල පොලිෂ් ගාගන්නං. ටයිම් එක හරි පෙරෙට්ටුවට යන්න. ඉතිරි ටික හවසට ලියන්නං...'

මේ පැත්තෙ ලියල තියෙන්නෙ එච්චරයි. බලමු අනිත් පැත්ත. ආ... මේ පැත්තෙ ලියල තියෙනව.

"වෙන මොනව ලියන්නද? තාත්තා ඉතිං හොඳ තේරුං ඇති කෙනෙක්නෙ. අවුරුද්දකට

පස්සෙ නිවාඩු අරං ගෙදර එන්නං. නංගිලාට සායවලුයි, දුපට්ටා සළුයි අරං දෙන්නං. අම්මාට අල්මෝඩාවල හදන නියම දුංකොළ ගුළියක් ගෙන්නව ගන්න හීරාලාල් මෝතීලාල් කඩෙන්. නෝර්තෝවල 'ගෝල්ල' දෙයියන්ගේ දේවාලෙට ගිහිං මගේ නමිං එළුවො දෙන්නෙක් පූජා කරන්න. මගේ ඇතේම ප්‍රණාමය 'ගෝල්ල' දෙයියන්ට පුද කරන්න ඒ දේවාලෙදි. මෙහෙ ඉතිං කරදරයක් නැහැ. පරම දෙවියන් වන පර්මේස්වර් දෙවියන්ගේ ආසීර්වාදය ඔබට ලැබේවායි පතමි. ඔබගේ පාවල ආසීර්වාදය ලැබේවා.

ඔබගේ පුතා, ඉහතින් ලියූ.

ලිපිය කියවා දුන් දයාරාම් තැපැල් මහත්තයා හිඳි තැනින් නැඟී සිට අනෙක් නිවෙස්වලට යැම සඳහා පිට වී ගියේය.

* * * * *

කමස්යාරී ගමෙන් පිටත් වී ආ දයාරාම් තැපැල් මහත්තයා නිවෙසට ආවේ සැන්දෑ සමයේදී ය. බේනීනාග්හි උප තැපැල් කන්තෝරුවේ තැපැල්කරු ලෙස ක්‍රියා කළේ ඔහු ය. රැකියාවට පැමිණ එතරම් කලක් ගත වී නොමැත. උසස් විද්‍යාල මට්ටම සමත් වීමෙන් පසු ඔහු සිටියේ නිකමෙකු සේ ය. ඔහුගේ පියා තැපැල්කරුවෙකු ලෙස සේවය කරමින් සිටියේ ය. නගරයේ තැපැල් කාර්යාලයේ ප්‍රධානියාගේ නිවසට මාස හතරක් තිස්සේ මුදවාපු කිරි කදවල් සහ කැකිරි ලබු පිරවූ ගෝනි යැවීමෙන් පසුව තම පුතා තැපැල්කරුවෙකු ලෙස පත් කරවා ගත්තේ ය.

සතියකට දෙවරක් දයාරාම් රාජකාරිය සඳහා කමස්යාරී සහ ඒ අවට ගම්මානවලට ගියේ ය. අද ඔහු එහි ගියේ දෙවැනි වරට ය. ගම්මානයේ සියල්ලෝම ආගන්තුක සත්කාර කිරීමට කැමැත්තෝ ය. කිසිවෙකුගේ නමට මුදල් ඇණවුමක් තැපැලෙන් ලැබුණු විට ඔහු දයාරාම්ගේ නළලත තිලකයක් තබයි. කිසියම් සන්තෝසමක් අතමිට මොළවයි. සමහරු මුදල් ඇණවුමක් ලැබුණු පසු ගමෙන් ඈත පිහිටි කඳුගැටයක් මත ඉදිකොට ඇති දෙවොලට ගොස් පහන් දල්වති. මුදල් ඇණවුමේ රිසිට්පත බතාශා රසකැවිලි සමඟ දෙවියන්ට පූජා කොට පැමිණෙන්නේ 'පර්මේසර් දෙයියනේ, මේ විදියට දිගටම මට මනිඕඩර් ලැබේවා!'යි සිතමිනි.

* * * * *

තමන්ගේ කාකි නිල ඇඳුම හැඳගෙන, කාකි රෙදිවලින් මැසූ ලියුම් මල්ල කරේ එල්ලාගන්නා දයාරාම් ගම්මානවලට යයි. කිසියම් නිවසක් අසලට ළඟා වෙද්දී ධාන්‍ය කොටමින් සිටින කාන්තාවන්ගේ අත්වල ඇති මෝල්ගස් වැඩ වරති. කිරි දොවමින් සිටින්නිය කිරි ස්වල්පයක් පොළොවේ විසුරුවා හරියි. වයසක ඇත්තන් දුම් උරමින් සිටින 'චිලම්' නළ අත්වල සිරවෙයි. හැමගේම මුවෙහි රැව් දෙන්නේ එක වචනයක් පමණි. "තැපැල් මහත්තයා!"

යුදමය කාල වකවානුවක් වූ බැවින් කුමාඌ හි බොහෝ තරුණයෝ යුද හමුදාවට බැඳී සිටියෝය. ආර්ථික දුෂ්කරතාවන් විසින් ඔවුහු තම ප්‍රියයන්ගෙන් මෙන්ම තමන්ට හුරුපුරුදු මහපොළොවෙන් සහ පරිසරයෙන් ඈත්කර දමනු ලැබ සිටිති.

දයාරාම් කැලෑ පාරවල් ඔස්සේ ගමන් කරද්දී කඳුකර මහිලාවන්ගේ වේදනාව පිරුණු විරහ ගී අසන්නට ලැබෙයි. ඒ ගීවලින් කියැවුණේ යුද හමුදාවේ සේවය කරන තම සැමියන් පිළිබඳ ස්මරණයන් ය. දයාරාම් නිරන්තරව දුටු දෙයක් නම්, කොහේ හෝ ස්ථානයකට ඔහු යන විට, සෑම සෙබළ බිරියක්ම මුවැත්තියකගේ නෙත්වලින් අවට බලමින්, සාවියක සේ කන් ඔසවා සවන් දෙමින් සිටින ආකාරයයි. දයාරාම් දෙස ඔවුන් බලන්නේ 'දේවතාවෙක්' සේය. ඔහු

ඔවුන්ගේ සෞභාග්‍යයේ මෙන්ම දුර්භාග්‍යයේ ද දේවතාවා ය. ඔහු ලිපියක් හෝ මුදල් ඇණවුමක් වෙනුවට 'විදුලි පුවතක්' රැගෙන පැමිණියහොත් එක් නළලක 'සිංදූර් තිලකය' මැකී යයි. ඇතෙහි වීදුරු වළලු බිඳී යයි. ගම්මානය පුරාම ශෝකය නමැති රාජාලියා තම අකාරුණික පියාපත් විහිදුවයි...

මුවාණී ගමෙහි සිදු වූ සිද්ධියක් දයාරාම්ට තවමත් මතකය. ඔහු 'විදුලි පුවතක්' රැගෙන එහි ගියේ ය. ධනසිංහ බිෂ්ට්ගේ පුත්‍රයා කශ්මීර යුද පිටියේ දී මියගොස් සිටියේ ය. 'විදුලි පුවත' කියවා තේරුම් කර දුන්නේ ඔහුය. ඒ සමගම ඔහුගේ ජීවිතය බරපතළ අනතුරකට මුහුණ පෑවේ ය.

ධන්සිංහ්ගේ ලේලිය දැකැත්ත රැගෙන දයාරාම්ට පහර දෙන්නට පැමිණියා ය.

"මැරියං, පෝස්ට්මෑන්, උඹව හදාවඩා ගත්තු කෙනාව, උඹට මේ ජරා වැඩේ උගන්නපු! උඹේ අම්මගෙයි. සහෝදරියන්ගෙයි කළුපාට වීදුරු වළලු කලින්ම කැඩිල ඉවර වෙච්ච හින්දද මේ පච්කාර ටෙලිගැරුං එක අරං මගේ ගෙදරට හෙණ ගහන්න ආවෙ? ඒයි, උඹේ හරක් පට්ටිය, උඹේ ගමේ මහළුකා, ඔක්කොම මැරිච්චාවේ. මගේ දරුවො අනාථ කරලා දැම්මා උඹ! උඹේ අනාගතේට හොඳක් වෙන්න එපා. 'ජය් හින්ද්' ටෙලිගැරුං එක මගේ ගෙදරට ගෙනාව වගේ, උඹේ ගෙදරටත් කවුරුහරි මේ වගේ ටෙලිගැරුං එකක් ගේන්න කියල මං 'ගෝල්ල දෙයියංගෙ' දේවාලෙට ගිහිං එළුවො කපල පළිගහනව."

ඇයගේ මෙම හද සකියවන හැඬීම, ශෝකභරිත විලාපය, වරින්වර තදින් පපුවට ගසා ගැනීම, ඇතේ පිටි අත්ලෙන් නළලට ගසා ගැනීම, අසැබි වදන් කීම ආදියෙන් යුක්ත විය.

"උඹට උකුළෙ හෙවණ දුන්නු, ඇටමස් දුන්නු එකීගෙත් මේ වගේම පපුව පැළිල පලච්චාවෙ!"

දයාරාම්ගේ නළලට දහඩිය ඉනුවේය... ඔහු පළමුවරට රැකියාවට යද්දී ඔහුගේ මව ඔහු තම පපුවට තදකර ගත්තාය.

"මගේ පුතේ! අද තමයි මගේ හිතේ මෙච්චර කල් තිබ්බච්ච ගල බිමට හැලුණෙ. මං හුඟක් බයෙන් හිටියෙ, පුතත් ගිහිං හමුදාවට බැඳේවි කියලා! පෝස්ට්මන් කෙනෙක් වුණාම බයවෙන්න දෙයක් නෑ කියල කිව්වෙ පුතාගේ තාත්තමයි!"

දයාරාම්ගේ දෑසින් කඳුළු කඩා හැලුණේය. අහෝ, මවගේ සිතෙහි දෙවියන් කොපමණ ආදරයක් පුරවා තැබුවාද? මෙදින සිට වැන්දඹුවක් බවට පත්වන භාගුලීත් තම කුඩා දරු පැටවුන් ගැන පවසමින් වැලපෙන්නට වූවා ය.

"කවුද ඉතිං ඉහට සෙවණක් දෙන්නෙ, දෙපයින් හිටගන්න හයියක් දෙන්නෙ. අනේ, මගේ පුංචි දරුපැටවුන්ට? කවුද ඉතිං යුද්ද පිටියෙං අරං ඇවිත් විස්කෝතුයි, පිටරට රසකැවිලියි කවන්නෙ... අයියෝ... මගේ උකුළෙ ඉන්න දරුවන්ට? අයියෝ. පෝස්ට්මෑන්, උඹට කිරි දීපු එකීගෙ පුපුව පැළියං.

දයාරාම්ට පැවසීමට අවශ්‍ය වී තිබුණේ, "ඇයි මට දොස් කියන්නෙ අක්කෙ? මං ඔහේගෙ මනුස්සයට වෙඩි තිබ්බෙ නෑනේ..." යන්නය. එහෙත්, ඔහුට කිසිවක් කියා ගැනීමට නොහැකි විය. භාගුලීගේ ශෝකභරිත විලාපය හමුවේ ඔහුගේ කටහඬ ගොළුවී ගියා සේ ය.

එදිනට පසුව, සතුටු වීමට හැකි කරුණ වන්නේ, "එකදු විදුලි පුවතක්වත් පැමිණියේ නැත" යන්නය. ඔහු උප තැපැල් කන්තෝරුවේ ප්‍රධානියා ලියුම් තෝරන ආකාරය දෙස බලා සිටියේ ඉමහත් ව්‍යාකුලතාවකිනි.

අද සඳුදා දිනයයි.

කමස්යාරී ගම්මානයට යන දිනය අදය. උපතැපැල් කන්තෝරුවේ අධිපති පාණ්ඩේ

මහතා ලිපි තෝරමින් සිටියි. දයාරාම් තමන්ට අයත් ලියුම්, මල්ලට දමමින් සිටියේ කොහේදෝ අතරමං වී සිටින්නා සේය. එක්වරම ඔහු ගෝනුස්සකු දෂ්ට කළාක් මෙන් තිගැස්සී ගියේ ය. පාණ්ඩේ මහත්තයා ඔහු දෙසට විදුලි පුවතක් සහිත ලියුම් කවරයක් දික්කර ගෙන සිටියේ ය.

විදුලි පුවතේ ලිපිනය වූයේ, ජයෝත්සිංහ් නේගී, කස්මයාරී...

දයාරාම්ගේ හදවත වෙවුලන්නට පටන් ගත්තේ ය. ඔහු ව්‍යාකූල භාවයට පත් විය. පාණ්ඩේ මහතා කතා කළේ ය.

"ඇයි පුතේ, මොකදැ ප්‍රශ්නෙ?"

බ්‍යාලීරාම් පාණ්ඩේ වයසින් වැඩි පුද්ගලයෙකි. දයාරාම් ඔහුට ගෞරව කළේය. ඔහු දයාරාම්ට දරුවකුට මෙන් ආදරය කළේ ය.

"මොකවත් නෑ මාමෙ! ඊයෙ ඉඳල ඇඟට ටිකක් හරි නෑ වගේ. හෙම්බිරිස්සාව හැදිල වගේ." දයාරාම් කීවේ ය. උත්සාහයෙන් නහය සූරන්නට පටන් ගත්තේ ය.

"හ්ම්... එහෙනං අද ඩියුටි යන්න එපා. කමස්සායරී ගම පැත්තට මහා හයියෙන් හීතල හුළඟක් හමනව, නිව්මෝනියාව හැදෙන්නත් බැරි නෑ." පාණ්ඩේ මහත්තයා කිවේ ය.

"ඒත්, ටෙලිග්‍රෑම් එක..."

"හොඳයි, මෙහෙම කරන්නකො. පුතා අද මගේ කඩේ ඉන්න. මුද්දරයි, ලියුම් කවරවලයි සල්ලි වෙනම තියන්න. අතිත් බඩු විකුණුණොත් ඒවයෙ සල්ලි වෙනම තියන්න. බීඩි මිටියක් සත නමයකට අඩුවෙන් දෙන්න එපා. ඔයාගෙන් මං ගන්නෙ සත අටයිනෙ."

පාණ්ඩේ මහත්තයා දයාරාම්ගේ කාකි ලියුම් මල්ල කරට ගත්තේ ය.

"කමස්යාරී ගම්මානෙ ළඟ තියෙන රත්න්‍යාරී ගමේ තමයි මගේ පවුලගෙ මහගෙදර තියෙන්නෙ. පුතාගෙ නැන්දවත් එක්කගෙන එන්න පුළුවං. පුතා ඉතිං මේ විදියට කවදා වෙනකං මට උදව් කරාවිද?

බ්‍යාලීරාම් පාණ්ඩේ තම කඩයේම කොටසක උප තැපැල් කන්තෝරුව පවත්වා ගෙන යයි. අවුරුදු තිස් පහකට වැඩි කාලයක් උප තැපැල් ස්ථානාධිපති වශයෙන් කටයුතු කිරීමත්, පුංචි පහේ වෙළෙඳාමකුත් කරමින් සිටින නිසා මේ කාර්යයන් දෙකෙහිම වෙනසක් ඔහුට දැනුණේ නැත.

දයාරාම්ගේ මතකයට ආවේ, පෙරේදා ඔහු ගම් ප්‍රධානියාගේ ගෙදර ලිපිය කියවමින් සිටිය දී ඔහුගේ ලේලිය හොරෙන්, හොරෙන් ඇස් කොනින් තමා දෙස බලමින් සිටි ආකාරයයි. කෙතරම් කුතුහලයක් තිබිණිද ඇගේ දෑස්වල. කෙතරම් සෙනෙහසක් එහි උතුරමින් තිබිණිද? තේවතුර කෝප්පයට කොපමණ කිරි හා සීනි ප්‍රමාණයක් දමා තිබුණාද? "ගන්න තැපැල් මහත්තයෝ!"

දයාරාම්ට දැනුණේ, කිසිවකු ඔහුගේ කනට හිමින් සීරුවේ කොඳුරන්නා සේ ය.

"ගන්න තැපැල් මහත්තයෝ!"

ඔහුට ඉමහත් වේදනාවක් දැනෙන්නට විය.

විදුලි පුවත අද පැමිණියේ ය... සමහර විට යුද්දෙදි රත්නසිංහ් නේගිත්... දයාරාම්ගේ ඇස් ඉදිරියෙහි අන්ධකාරයක් පැතිර ගියා සේ ය. අන්ධකාරයෙහි තට්ටු ඔහුගේ ඇස්වල කළු ඉංගිරියාව මත තැන්පත් වී ගියා සේ ඔහුට දැනෙන්නට පටන් ගත්තේ ය. රත්නසිංහ්ගේ බිරින්දෑ බ්‍යාලීරාම් උප තැපැල් ස්ථානාධිපතිවරයා දැකැත්තෙන් ඉරා දමමින් විලාප තබමින් දුවමින් සිටියි.

"උඹට කිරි දීපු එකීගෙ පපුව පැළියං. පෝස්ට්මෑන්! ඒකෙං..."

දයාරාම්ට දැනුණේ තමාට කරකැවිල්ල සැදී ඇති බවයි. හතර අතින්ම ඔහුට ඇසෙන්නට පටන් ගත්තේ රත්නසිංහ්ගේ වැන්දඹු බිරියගේ ඇනුම්-බැණුම් ය. ඒවා ඊතලයක් වැදුණු කුරුල්ලෙකු සේ මහ හඬින් තටු ගසමින් ඔහුගේ කන් තුළට ඇද වැටෙන්නට විය.

"මැරිල පලච්චාවෙ උඹව හදන එකා, පෝස්ට්මෑන්, උඹටත් 'ගෝල්ල දේවතාවුන් වහන්සේගේ' පිහිටෙං මේ වගේ ටෙලිගැරැං එකක් ලැබිච්චාවේ. උඹව උකුළෙ තියාගෙන උණුහුම දුන්නු කෙනාගෙ හෙවණ නැතිවෙලා පලච්චාවෙ..."

දයාරාම්ට කැගැසෙන්නට ආසන්න විය. ගම් ප්‍රධානියාගේ ලේලිය විදුලි පුවත අතින් ගෙන, හිසේ කෙහෙවල්ල මුදාහැර, පිටි අත්ලවලින් නළලට ගසා ගනිමින්, දැතින් පපුවට ගසා ගනිමින්, ඔහුගේ නිවසට එන්නා සේ ඔහුට දැනෙන්නට පටන් ගත්තේ ය.

එහෙත්, 'විදුලි පුවත රැගෙන එහි ගියේ පාණ්ඩේ මහත්තයනෙ' යන්න ඔහුට එක්වරම කල්පනාවට ආවේය. එම සිතුවිල්ලත් සමඟම ඔහුට තරමක සහනයක් දැනුණේ ය. මුදල් දමන පෙට්ටියට ඉණ හේත්තු කොටගෙන වැතිරුණේ ය.

වැතිරී සිටිද්දී ඔහුට එක් වරම දැනෙන්නට පටන් ගත්තේ තමා කමස්යාරී ගම දෙසට යමින් සිටින බව ය. රත්නසිංහ්ගේ වැන්දඹුව තණකොළ කැපීම සඳහා කැලයට පැමිණ සිටියා ය. ඇය හඬමින් සිටියි. 'දෙවෙනිදා ආපු ටෙලිගැරැං එක... ඉහට හෙවණක් කොයින් ද... දෙපයට හයියක් කොයින් ද...?"

ඇගේ හිසට සෙවණක්, දෙපයින් සිට ගැනීමට ආධාරකයක් වූ රත්නසිංහ් කශ්මීර යුද්ධයේ දී මරා දමනු ලැබ ඇත. දයාරාම්ගේ ඇසෙහි නැවත වාරයක් විදුලි පුවත සහිත ලිපි කවරය සැරිසරන්නට පටන් ගත්තේ ය. ලියුම් කවරයේ එක් කොනක ලියා ඇති දෙය ඔහු දුටුවේ ය. 'එවන්නෙ ඔහුගේ පුතා රත්නසිංහ් නේගී, 339...'

වැන්දඹු ජෑතුලී කෙහෙවල්ල කඩා උරහිස් මත විසුරුවා ගෙන සිටියා ය. දයාරාම්ගේ හිස් ලියුම් මල්ල ඇකැත්තෙන් ඉරා දැම්මා ය. විකෘති මුහුණක් පෙන්වමින් සිටියා ය.

"පෝස්ට්මෑන්, උඹේ තේ වතුර එකට සීනි අහුරු හතරක්ම දැම්මෙ, උඹ මගේ ජීවිතේට විස ගෙනත් ආයි කියල හිතල නෙමෙයි. මගේ දරුවන්ට තිබුණු කිරි ටිකත් උඹේ තේ එකට දැම්මේ උඹ මගේ දරුවන්ගෙ කටින් පිටරට විස්කෝතු උදුර ගනීවි කියල හිතල නෙමෙයි. මැරියං. පෝස්ට්මෑන්, උඹව මේ ලෝකෙට ගෙනාපු ගෙදරටත් මේ වගේ ආණ්ඩුවෙ ටෙලිගැරැං එකක් ලැබියං... ඊයෙ උඹ අර අසරණ වයසක මනුස්සයව එව්වෙ, උඹේ අතේ තිබුණු හෙණේ එයාගෙ අතේ තියල ද?"

දයාරාම්ට කැගැසුණේ ය.

"ඒත් අක්කේ...! මං අක්කගෙ රත්නසිංහ්ට වෙඩි තිබ්බෙ නෑ. මේ අහිංසක මට බණින්නෙ ඇයි? මං ආයි කරන්නෙ නෑ. අද ඉඳං මේ ආණ්ඩුවෙ ටෙලිගැරැං ගෙනියන රස්සාව කරන්නෙ නෑ...!"

"උණ වැඩි වෙලාද දයාරාම් පුතේ?" උප තැපැල් ස්ථානාධිපති පාණ්ඩේ කතා කළේ ඔහු වැරෙන් සොලවමිනි. ඔහුගේ මුහුණ දෙස බැලූ පාණ්ඩේ මහත්තයා නැවත කතා කරන්නට පටන් ගත්තේ ය.

"පුතේ, උඹ නං ඒ තරං වාසනාවන්තයෙක් නෙමෙයි. මං ටෙලිග්‍රෑම් එක අරං ජයෝත්සිංහ් නේගීගෙ ගෙදරට ගියා. එයාගෙ දුව බැඳල ඉන්නෙ අල්මෝඩාවලට, එයාට පුතෙක් හම්බ වෙලා. අනේ අහිංසකයො හුඟක් ආදර සත්කාර කළා! ඇනා අටක්ම දුන්න සන්තෝසෙට. මොකද බ්‍රාහ්මණයොනෙ. සතුටුදායක ආරංචියක් ගෙනාව කියලා."

දයාරාම් පාණ්ඩේ මහත්තයා දෙස බලා සිටියේ අපාර වූ විස්මයකිනි. සාක්කුවෙන් ඇනා හතරක් අතට ගත් පාණ්ඩේ මහත්තයා එය දයාරාම් අතට දුන්නේ ය.

"එන්න ලැස්ති වුණා විතරයි. ගම් ප්‍රධානියාගෙ ලේලි ගම් ප්‍රධානියට කිව්වා. ඇනා හතරක සන්තෝසමක් පුංචි තැපැල් මහත්තයටත් යවන්න කියල! ඒ නං 'ලක්ෂ්මී' වගේ ඇරිවියක්!"

දයාරාම් පාණ්ඩේ මහත්තයාගේ පා මත අත් තබා බැන්දේ ය.

## ශෑලේශ් මටියානී
## (1931 - 2001)




ශෑලේශ් මටියානී යන නමින් ජනප්‍රිය වූ මොහුගේ නියම නම රමේශ් සිංහ් මටියානී 'ශෑලේශ්'ය. 1931 ඔක්තෝබර් 14 වන දින උත්තර භාරතයේ උත්තරාඛණ්ඩ් ප්‍රාන්තයේ අල්මෝඩා දිස්ත්‍රික්කයේ 'බාඩේඡිනා'හි දී උපත ලැබූ ඔහු උසස් විද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපනය ලැබුවේ ය.

1959 දී ඔහුගේ ප්‍රථම හින්දි නවකතාව (බෝරිබල්ලී සිට බෝරිබන්දේර් තෙක්) ප්‍රකාශයට පත් වූ අතර, ලේඛකයකු වශයෙන් දශක පහකට අධික කාලයක් සිය පෑන මෙහෙයවී ය. මටියානී කෙටිකතාකරණයෙහි ලා ඉමහත් ජනප්‍රියත්වයක් ලැබී ය. විශේෂයෙන්ම ඉන්දියානු සමාජයේ පහළ පන්තිය සහ පහළ මධ්‍යම පන්තිය හා සම්බන්ධ ජනතා අරගලය නිරූපණය කිරීමෙහි ලා දැක්වූ දක්ෂතාව නිසාම ඔහු හඳුන්වනු ලබන්නේ 'ජනතාවගේ කතාකරුවා' (People's Writer) යන නාමයෙනි.

ගම්මානවලින් නගරයට පැමිණ නගරයේ පැල්පත්වල අවතැන් වූ ජීවිත ගෙවන ජනතාවට එම ජීවිතය ගෙවීමට සිදු වී ඇති ආකාරයත්, පදික වේදිකාවල මරණයට පත්වීමට සිදු වී ඇති ආකාරයත් ඔහු නිරූපණය කරන්නේ එම ජීවිතවලට ඉතා සමීපයෙහිම ජීවත්වෙමිනි. මටියානීගේ කතා නායකයන් වනුයේ යාචකයන්, ගැටකපන්නන්, අතරමං වූවන්, සමාජයෙන් කොන් කරන ලද අය වැනි චරිත ය. අසමතුලිත සංවර්ධන ක්‍රියාදාමයන්ගේ ගොදුරු බවට පත් වූ මෙ චරිත අභ්‍යන්තරයෙහි දක්නට ලැබෙන්නේ පිරිතිරි ගිය මනුෂ්‍යත්වයයි. සමහර විචාරකයන්ගේ මතයට අනුව ප්‍රේම්චන්ද්ට පසු ව හින්දි සාහිත්‍යයෙහි බිහි වූ විශිෂ්ටතම ලේඛකයා මටියානී ය.

මටියානී නවකතා 30 ක් ද, කෙටිකතා සංග්‍රහ 17 කට වඩා ද රචනා කොට ඇත. ළමයින් සඳහා කෘති 16 ක් රචනා කළ මටියානී ජනකතා සංග්‍රහ 7 ක් සහ විවිධ විෂයයන් හා සම්බන්ධ ශාස්ත්‍රීය නිබන්ධ රැසක් ද හින්දි සාහිත්‍යයට එක් කළේ ය.

හින්දි සාහිත්‍යයට ඔහුගෙන් සිදු වූ සේවය ඇගයීම සඳහා වසර 2000 දී 'මහාපණ්ඩිත් රාහුල් සාංකෘත්‍යායන් සම්මානයෙන්' ඔහු පිදුම් ලැබී ය. 1994 දී නැනීතාල්හි කුමාඌනී විශ්වවිද්‍යාලය විසින් සම්මාන සාහිත්‍යසූරි උපාධියක් ප්‍රදානය කරන ලදි.



**පරිවර්තනය: උපුල් රංජිත් හේවාවිතානගමගේ**

*කැලණිය විශ්වවිද්‍යාලයේ හින්දි අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි. ලක්නව් සරසවියේ සරස්වතී (ජාත්‍යන්තර) සම්මානය 2013 ද, ජගත් හින්දි (ජාත්‍යන්තර) සම්මානය 2012 ද දිනා ඇති ඔහු වෙත ගොඩගේ සාහිත්‍ය සම්මානය 2012 ද, රාජ්‍ය සාහිත්‍ය සම්මානය 2001 ද ප්‍රදානය කරන ලදි.*

## කවි ලියැවෙන සමාජයක ජීවත්වීමේ සතුට නොහොත්

# 2013 නූතන ම සිංහල කවිය

### පිවිසුම

වසර කිහිපයක සිට තත් වසරේ පළ වූ ප්‍රශස්ත සිංහල කාව්‍ය ග්‍රන්ථ පිළිබඳ ව අප කරගෙන පැමිණි සාකච්ඡා කිසියම් ප්‍රතිඵලදායක බවක් ගම්‍ය කළෙන් 2013 වසරෙහි ප්‍රකාශිත නූතන ම සිංහල කවිගත් වෙනුවෙන් ද කෙටියෙන් හෝ යමක් ලිවීමට අපි පෙළඹුණෙමු. වසරක කාව්‍ය අස්වැන්න පිළිබඳ සටහන් එක තැනෙක ගොනුවීම තොරතුරු අගයක් ද දරයි. ඊට අමතර ව මෙම ව්‍යායාමය, දෘෂ්ටිමය ලෙස නූතන සිංහල කාව්‍ය ගැන මෙතෙක් නැග ආ තත්වයන් දෙකකට විරෝධය පළ කරයි. එකක් නම් උසස් පෙළ නූතන සිංහල පද්‍ය කෘතිය යි. එය නූතන සිංහල කවිය පිළිබඳ ප්‍රශස්ත හරස්කඩක් නොවේ. නූතන සිංහල කවිය ලෙස අද්‍යතනයෙහි සක්‍රිය, පණ ගැහෙන සජීවී කවිය යොවුන් රසවතුන් ගෙන් මගහරින එම ග්‍රන්ථයට පිටින් සුපුෂ්පිත කවියක් පවතින බව කලෙක සිට අවධාරණය කරමින් සිටිමු. පාසල් දරුවන්ගේ සහ ගුරු භවතුන්ගේ රසිකත්වයේ පරිහානියට දැන්නම් නිර්දිෂ්ට ග්‍රන්ථ ද හේතු වී ඇති බව පිළිගත මනා ය. අනෙක් කරුණු නම්, සිංහල කවියේ පසුගාමිත්වයක් ගැන කියැවෙන ප්‍රවාදය යි. එය එසේ නැත. සම්මාන උළෙල කිහිපයක් ද ක්‍රියාත්මක වන සංස්කෘතික සංචලනයට පවත්නා සක්‍රීය කවිය ගැන සංකථනයක් ද එක්කර තිබීම විෂය පිළිබඳ ශාස්ත්‍රීය තීරණ ගැනීමේ දී ආධාර වීමට ද අවකාශ ඇත.

### හැඳින්වීම

සුපුරුදු ලෙස නූතන ම සිංහල කවිය පිළිබඳ නොතිත් අවධානයෙන් සිටි මම 2013 වර්ෂයෙහි ප්‍රකාශිත කෘති රැසක් රැස්කර ගතිමි. දෙසතියකට වරක් පොත්හල්හි ඇවිද කවිපොත් සෙවීමි. එසේ වුව ද ඇතැම් ග්‍රන්ථ මගේ රසවිඳුම් ඇස, රසවිඳුම් මනස තෘප්ත නොකළේ හැර දැමීමි. වෙනත් රස ඇසකට ඒවා රසඳුන් සඳන්නට ද ඇත. ඇතැම් කෘති තැපැල මගින් පැමිණි ඒවා ය.

දීර්ඝ කාලයක් කාව්‍යාභ්‍යාසයේ නිරත ව සිටිමින් හැදෑරීමෙන් විමසීමෙන් ඉසියුම් කරගත් කවිත්වයක් සහිත ව කවි ලියන අපගේ ප්‍රධාන ධාරණාවේ කිවිසුරන්ට අමතර ව තම ප්‍රකාශන

මාධ්‍යය ලෙස තිර ව ගෙන ප්‍රයාශයක අනවරත ව යෙදෙමින් කවි ලියන පුළුල් පරපුරක් ද දැන් අපට සිටිති. මෙයට අමතර ව තම සිතට නැගි යම් යම් අදහස් තමා විසින් කවි යැයි සිතන ලද විලාසයකට නගා පොත් ලෙස මුද්‍රණය කර ඇති පිරිසක් ද සිටිති. ඔවුනට ද විරුද්ධ වීම හෝ පහර ගැසීම එකී නිර්මාණ කවි නොවේ යැයි පැවසීම අපගේ කාර්ය නොවේ. ප්‍රශස්ත නිර්මාණ ඇසුරින් කවිමග සාක්ෂාත් කිරීමට ඔවුනට ඇරයුම් කර සිටිය යුතු ය. එහෙත්, එම වෑයම ම නොවටී ද?

අවසානයට පෙරාගත් ග්‍රන්ථ කිහිපයක් කොටස් තුනකට වර්ග කිරීමට මෙවර මම පෙළඹුණෙමි. මෙම විවරණය කියවන රසවතුන්ට මා ඇරයුම් කර සිටින්නේ හැකි නම් තවත් ක්ෂුද්‍ර ඒකකවලට මෙය ශානරගත කළ යුතු බවයි. විවිධ මාන ඔස්සේ මෙකවි ගත් දෙස බැලිය හැකි නම් මහත් ආනිශංස ලබනුයේ සිංහල කාව්‍යප්‍රිය රසිකයා ය. පහත සඳහන් කාව්‍ය වර්ගීකරණයේ දී කෘති පෙළ ගස්වා ඇත්තේ ව්‍යක්තම කෘතියේ සිට අවරෝහණ ලෙසට යැයි කිසි විටෙක නොසිතිය යුතු ය.

## ප්‍රථම භාගය

1. රළින් රළ - ආරියවංශ රණවීර
2. සුචරිත සිරිත - එරික් ඉලයප්ආරච්චි
3. සාරාසංඛ්‍ය අග්නි වාෂ්ප - කුමාර හෙට්ටිආරච්චි
4. ලංකා පොකුණ - සුමින්ද කිත්සිරි ගුණරත්න
5. මීළඟ මීවිත - රුවන් බන්දුජීව
6. මෙමල් කලඹ ම නුඹ සතු - උපුල් සේනාධීරගේ

## ද්විතීය භාගය

7. විලංගුවෙන් ලියූ කවි - චූලානන්ද සමරනායක
8. සීමාසහිත පවුල සහ සමාගම - පියන්කාරගේ බන්දුල ජයවීර
9. වරද ද සුන්දරය - යමුනා මාලිනී පෙරේරා
10. නෙත්සර සඳෙස - ඉසුරු ප්‍රසංග
11. බිනර සඳට සමුදෙමි - නේමින්දර දිසානායක
12. උපත - කේ.එච්.අයි. ස්වර්ණසිංහ
13. ගිනි පුපුර - ප්‍රසාද් වීරසිංහ
14. හැටේ වත්තේ මග්දලේනා - සෞම්‍ය සඳරුවන් ලියනගේ
15. හේමන්ත නිද්‍රාව - කපිල එම්. ගමගේ

## තෘතීය භාගය

16. ලස්සන ම අහස - සඳර්ශී කුසුම් වර්ෂා
17. පර්ත් ගමට පායන සඳ - සුනිල් ගෝවින්නගේ
18. ළහිරු රැස් දහර යට - ශ්‍රියානි අබේකෝන්
19. විශ්‍රාමිකයාගේ සංග්‍රාමය - කුමාර කඹුරුපිටිය
20. සුබ පෙරනිමිති - සන්ධ්‍යා කුමුදුනී ලියනගේ
21. රාත්‍රිය නොගැඹුරුයි - ගොංගිතොට සරත්
22. කඩතිර හැර බලත - මාතලේ ආනන්ද අබේවික්‍රම
23. ළාදළු - හසිත් ගුණසේකර
24. පුරහඳත් හිනැහෙයි - සුනීතා එම්. කොස්වත්ත
25. අනිච්චානුග - වජිර දීප්ති වීරකෝන්
26. කිණිහිරෙහි වැතිර - දිල්ප් සිරිසේන
27. මල් ම වේ ඉම්හිරි - ආනන්ද ගුණතිලක

කෘති හඳුනා ගැනීම මෙසේ වුව ද මෙම ග්‍රන්ථාකරය පිළිබඳ ලුහුඬින් හෝ අදහසක් පළ කිරීම දුෂ්කරය. කිහිපයක් හෝ පිළිබඳ ව සටහනක් තැබීමට ප්‍රයත්න දරමි. මේ ඇතැම් ග්‍රන්ථ පිළිබඳ ව ආචාර්ය ලියනගේ අමරකීර්ති, බුද්ධදාස ගලප්පත්ති, චූලානන්ද සමරනායක ඇතුළු විචාරකයෝ ද අවධානය යොමුකර ඇත්තාහ. සිංහල කවිය පිණිස පූර්ණකාලීන විචාරකයන් සහ පූර්ණ අවකාශ වෙන් කරන අඛණ්ඩ පුවත්පත් සඟරා පිටු නැතිකම මෙහි දී බරපතල පාඩුවක් ලෙස මතු ව එයි.

ඇතැම් කාව්‍ය ග්‍රන්ථ පළ වූ බව නොදැන ම මුළුගැන්වේ. විචාර වදනක සංග්‍රහය නොලබා ම ආන්තික තීර්ථයකට තල්ලුවීම ආධුනික කවියෙකු දුර්මුඛ කළ හැකි ය.

ආරියවංශ රණවීර යනු කවිය පිණිස ම භාෂාව භාවිත කර විස්මිත ලෙස බස පිරිපහදු කරගත් කවීන්ද්‍රයෙකි. බස යනු භාවිතය නිසා ම බබලන මිණකි. අභාවිත වීම, අනභ්‍යාස වීම එහි තිර මරණය යි. රළින් රළ යනු 14 වන කවි පොත යි. මෙහි දී කවියා තරමක පර්යේෂණකාමී ප්‍රවේශයක් ද ගනියි. පද්‍යානුසාරී ගද්‍ය ලීලා අත්හදා බලයි. සිත්තරා බුදුන් දකියි, පලස්තීනුවෙක්, අවමඟුලේ දී හමු වූ ස්ත්‍රිය බඳු නිර්මාණ රණවීර මුද්‍රාව ම දරයි. දාර්ශනික ගිරිමුදුන්වල හුදෙකලා වූ බවට නැඟි ප්‍රවාදවලට ද මෙවර කිසියම් පිළිතුරු ලැබී ඇති සේ ය. රජබණ, වැසි දිනෙක, 1/2/203/1975 ලිපි ගොණුව වෙමි වැනි නිර්මාණ නිරාකුල ලෙස ම අද්‍යතන ගොරහැඩි සමාජ ජීවන තතුවේ අපුල කාව්‍යාභිමුඛ ලෙස මුදාහැරීමකි. ලිපිගොණුව කවියේ දී සාරය අහිමි, පරාරෝපිත නූතන මිනිසා, කාර්යාලයීය සේවකයා, පාරිභෝගික මිනිසා අවසානයේ දෙයක් (a thing) බවට, අංකයක් බවට ඌනනය වී ඇති අයුරු හොඳින් කියා ඇත.

### වැසි දිනෙක

"............
............
තෙත දුමාරය
රැඳි
රිය
වීදුරුවෙහි
ඇඟිල්ලෙන්
ලියමි
රියෙන්
බැස
යන විට
මුදල් ගෙන
ඇය
බොරුවට
කියා
ගිය
නම"

කවිය නිසි ලෙස උපුටනය කිරීමට මෙබඳු සිඟිති ලිපි අවකාශ නොදේ. රණවීරගේ කාව්‍ය භාෂා නිපුණතාව මෙම පද සංරචනය, ඛණ්ඩනය තුළ ද ඇත. කෙටි වචන සබඳතාවල ජංගමශීලීත්වය හඟව යි. මේ බොරු සම්බන්ධය දෙදෙනාට ම රහසක් නොවේ. වසඟය (Seduction) මේ පාරිභෝජනවාදයේ ප්‍රධාන ශිෂ්‍යාවයි. අපි කැමැත්තෙන්ම රවටමින් රැවටෙමින් සිටිමු.

'සුචරිත සිරිත' එරික් ඉලයප්ආරච්චි විසින් සුචරිත ගම්ලතුන්ගේ දිවිසැරිය සංදේශ කාව්‍ය සන්දර්භය තුළ තබා පරීක්ෂා කිරීමකි. සංදේශ කාව්‍ය ආකෘතිය නූතනත්වය සමඟ ගලපා වැඩ ගැනීමට එරික් ඉදිරිපත් වීම ප්‍රශංසාර්හ ය. එහෙත්, එය මනා රස භාව ඉපදවීමට සමත් වී ඇති ද? කවියා සිය තෝරාගත් ප්‍රස්තුතය පිළිබඳ මනා පර්යේෂණයක් කර ඇති බව කව්සිරුර මඟින් අනාවරණය කරයි. ගම්ලතුන්ගේ දිවිගත වූ අයුර, ආශ්‍රය නිශ්‍රය කළ අය, මන්ත්‍රී දූත ප්‍රයාණ, රුචි අරුචි කළ දේ, දේශපාලන දෘෂ්ටිය, දිවියේ සැඟවුණු දෑ, සියල්ල සමඟින් සංදේශ කවි මඟින් අත්‍යවශ්‍ය මෙවලම් පමණක් ගෙන ස්වීය නිමැවුමක් සේ ගෙන ඒමට ප්‍රයත්න දරයි.

එරික් තම පරිණත බස් වහර මෙම ආකෘතිය ඇතුළත ද හොඳින් හසුරුව යි. එසේ වුව ද සුචරිත සිරිත තුළ එරික් ඉලයප්ආරච්චි කවියාගේ අනුහස යටපත් ව ගම්ලතුන් නැග ආ සෙයකි. ඇතැම් තැනැ (පේරාදෙණි සුයාමය බඳු තන්හි) කවියාගේ කල්පනා යටපත් වී විවරණය පළුදු වෙයි. මෙය චරිතාපදාන කාව්‍යයක් ලෙස ගත යුතු ද? එවිට කවිය? කවියා සිය භූමිකාව

ගෙන ආ යුත්තේ විග්‍රහය තුළ ය. සුචරිත දිවිසැරියේ වාර්තා වැඩසටහන ඉක්මවා එරික් නම් ප්‍රබල ස්වීය කවියාගේ වැඩබිම මතුවිය නොයුතු ද?

'සාරා සංඛ්‍ය අග්නි වාෂ්ප' සමඟ කුමාර හෙට්ටිආරච්චි නැවත ආඛ්‍යාන කාව්‍යයට ගොඩවෙයි. 'ජීවිත පත්ලෙහි කැකෑරෙන මැර කවියා' ලෙස කුමාර ව හඳුන්වන ආචාර්ය ඩබ්ලිව්.ඒ. අබේසිංහයෝ නිවැරදි ය. දෛනික දිවියේ දේශපාලන පිටපත ඔහු පෙළයි. ඔහු වචන සමග යුද්ධ කර පැගෙන දනා වෙත දයාදිය ගෙන එයි. මෙවර කුමාර සිය පැරණි ආඛ්‍යාන කාව්‍ය තමන් විසින් ම පරදන ලද සෙයකි. සිංහල ආඛ්‍යාන කාව්‍යයක් දෙස නිවහල් ව බලද්දී පවා 'ප්‍රබුද්ධ' මාත්‍රාව සිහිපත් වීම රස විඳින අපගේ වරදක් නොවිය හැකි ය. ආඛ්‍යාන කාව්‍යයක් රචනා කරන්නා චිරන්තන සාහිත්‍යය, විද්‍යාව, ගැමි වහර, පුරවහර, උපමා පිරුළු ආප්ත මතු නොව, මේ සියල්ල මිශ්‍ර කරන මාත්‍රාව දත යුතු ය. සියල්ලට ම වඩා මේ දිගු වචන මහෝඝය තුළ ම ඉලක්කගත දෘෂ්ටිය අවිච්ඡින්න ව රැකගත යුතු ය. මේවායේ දී කුමාර අසාර්ථක නැතැයි මට සිතෙයි.

"පිරමිඩයක්
දෙබෑකරන්
මමියක්
එළියට ආවා
කොකා කෝලා
බිබී"

ප්‍රබල රූපකයක් සිනමාරූපී ව නිමව යි. අප ජීවත්වන සමාජය විඥාපනය කිරීම, ඊට නමක් දීම කවීන් ම කළ යුතු නොවේ ද?

"කොත්
කැරැල්ලක
හැපී
පරෙයියෙක්
ඇද වැටී"

රාජ්‍යයේ ගැටුණු ආගම ද, ආගම නිසා ම දැදුරු වන සාමය ද මෙසේ ය. ජීවියෙකු සංසේචනය වන මොහොතේ සිට ලංකාව නම් භූමියේ සමාජ-සංස්කෘතික දිවිය නමින් ගෙවන 'කරුමය' කවියා ගෙන එයි. ලබ්-ඩබ් නම් හෘද සාක්ෂ්‍යය, මනුසත් බව ඉතා ම නිර්මාණාත්මක ආකෘතියක පුනරුක්තයක් සේ යොදාගනු ඇත.

සුමින්ද කිත්සිරි ගුණරත්න කවියා සිය සිවුවන කාව්‍ය ග්‍රන්ථය වන 'ලංකා පොකුණ' පළ කරමින් ස්පර්ශ කරන ස්ථානය ඉතා උස් වූවකි. හෙතෙම ක්‍රමානුකූල චාරිකාවක නිරත වී ප්‍රත්‍යක්ෂ කවි බසක් මෙන් ම ප්‍රත්‍යක්ෂ කවි මගක් මෙදා නිපදවා ගෙන ඇති බව සුපැහැදිලි ය. මෙම කෘතියේ අඩංගු නිර්මාණ 29 වූ කලී කේවල කාව්‍ය නිර්මාණ ලෙස තරඟයක දී නම් අතිසාර්ථක ලෙස ලකුණු උපයනවා ඇත. ඒ හැම නිර්මාණයක් ම භාෂාව, අනුභූතිය සුවිශේෂ වීම, විරල බව, කාව්‍යෝක්ති ජනනය කිරීම, තිර වූ දේශපාලන දැක්මක සෙවණ ලැබීම, රස ඉපිදවීම යන සියලු කරුණු අතින් පොහොසත් ය. සමස්ත නිර්මාණාවලිය ම වෙන වෙන ම උද්යෝගයක් පළ කරන සුළු ය.

නළු වෙසින්, ගිනි පුපුරක්, අල්ලාහුවක්බර්, හරිත ගති, මැද හමුව, ඇලි මැදින්, දිය රහස් යනාදී කවර නිර්මාණයක් විමසා බැලුව ද ඒවාට පෞද්ගලික ජීවිතයක් (Private Life) ප්‍රදානය කිරීමට කවියා සියුම් වී ඇත. කවිය යනු භාෂා භාවිතයක් බවත්, ඉදිරිපත් කිරීම් විලාසයක් බවත් සුමින්ද යලිදු ප්‍රත්‍යක්ෂ කර ඇත.

## ගිනිකුරෙකුට

'බුදුන් දෙවියන්
පිණිස කැප වූ
කවර පහනක්
ඇල්වුව ද ඔබ
ඉටි, සඳුන්, තෙල්
සුවඳකට පෙර
දැනෙන්නේ මට
වෙඩි බෙහෙත් ගඳ'

මෙබඳු ක්ෂුද්‍ර නිර්මාණයක පවා පරිසමාප්ත කලා කෘතියකින් නැගෙන බලගතු බව, කිසිවක් ම නොඅඩු බව මෙම කුඩා කවිය තුළ ද මතු වෙයි. අද වන විට සියලු ආගම් විනිවිද වෙඩි බෙහෙත් ගඳ නැග එයි. අනිත්‍ය ප්‍රතිසංයුක්ත කේන්ද්‍රීය ධර්මය දෘෂ්ටිවාදී ආයුධ ලෙස පොලා පැන ඇත. සුමින්දගේ කාව්‍ය විමසන රසිකයා හා විචාරකයා ඔහු නිපදවා ඇති කාව්‍යෝක්ති බරැති බස සහ ඔහු නිරාකුල ලෙස විසඳා ගෙන ඇති කවිය යනු කුමක්ද යන පැනය දෙස නැවත බැලිය යුතු ය. මේ දෙමග මගින් ලංකා පොකුණ පිරික්සන්නා පිරිනමන ලකුණ අබිබැවීමට අන් කවි ගත්වලට පහසු නොවනු ඇත.

'මීළඟ මීවිත' තුළ අඩංගු කවි දැනටමත් අප බොහෝ දෙනෙකුට කටපාඩම් සේ ය. රුවන් බන්දුජීව ගේ ප්‍රථම කාව්‍ය ග්‍රන්ථය දොරට වඩින තෙක් දින ගණන් බැලූ රසිකයෙකි මම. අන්තර්ජාලය, මුහුණු පොත ඔහුගේ කවි අපට හුරුපුරුදු කළෙහි ය. ඊ ඉරපානේ බන්දුල නානායක්කාරවසම් තමාට එදා අහිමි වූ විචාරක අවධානය මේ නොදුටු යොවුන් කිවිඳුනට පිදී ය. ඇළ, පොරි අහුරක්, උයන්පල්ලා, ඇඳලා දෙනවද මතක හැටියට වැනි කවි පොතෙහි පැළඳීමට පළමු අපි අපේ මතක බිත ලියාගෙන තිබුණෙමු.

## බෞද්ධාලෝක මාවතේ අවුකන අනුරුව

'.................

.................

සැබෑ රුව ඇස් දෙකෙන් දැක නැති අයෙක් අනුරුව නිසා සැනසෙයි.

සැබෑරුව සහ එහි ම අනුරුව එක ම මුද්‍රාවකින් පසුවෙයි.'

ජීන් බ්‍රෝදිලාද් ලියූ - කියූ මුල්පිටපත නැති වූ ව්‍යාජ පිටපත අපේ ජීවිත පෙළන බව - රවටන බව රුවන් කියයි.

සැබෑ රුව හා අනුරුව වෙන්කර ගැනීමට නීතියේ නොහොත් මහා අනෙකාගේ ආධාරය දැන් නැත. සත්‍යය හා අසත්‍යය අතර සියුම් ඉර දිනපතා මකා දැමෙන සමාජයට කියන අනෙක් නම ශ්‍රී ලංකාව වන බැවිනි.

රුවන් බන්දුජීව යනු නූතන සිංහල කවියේ පාඨක සමාජය පුළුල් කරවන කවියෙකි. එකවි, අප ව තිගස්වයි. විටෙක කිතිකවයි. මේ යෙදුම රුවන්ට වඩා කලින් අපට හෝ වෙනත් කවියෙකුට මේ අයුරින් සිහිපත් නොවූයේ මන්දැයි සිතෙයි. ප්‍රතිභාව යනු ඒ නො වේ ද?

'ඉන්නවා සමනල්ලු

සිරීපාදේ යන්න අකමැති' මේ යෙදුම්වල රුවන් බන්දුජීවට ම අයිති කොටසක් ඇතැයි සිතෙයි. හපුතලේ සිදු වූ නුදුරු රිය අනතුර ද, කෝට්ටේ යුගයේ වීදිය බණ්ඩාර ද, 19 වැනි සියවසේ සිටි සරදියෙල් ද ඔහු අතට පත් වූ පසු එක ම මිහිරක් ලබයි. රසයක් හැඩයක් ලබයි. රුවන්ගේ අනාගත කවිය දෙස අප බලා සිටිය යුතු ය. මානව දයාවෙන් කිරි ගැහෙන හද පමණක් නතු නොකර ගෙන කව්බස හා වෙනත් සාහිත්‍ය විධියකට බැරි කවියට ම පමණක් හැකි කොටස පිළිබඳ නිරතුරු අධ්‍යයනය යන කරුණු ඇතැම් විට රුවන් අපට පරිකල්පනය කළ නොහෙන තැනකට පවා එසවිය හැකි ය. අප එසේ සඳහන් කරන්නේ කිනම් ගුණයක් හැදෑරීමෙන් ලද ද සිතාගත රසයක් උපදවන ප්‍රතිභාවක් ඔහු දැනට ම විශද කර ඇති බැවිනි.

"මෙමල් කලඹ ම නුඹ සතු' උපුල් සේනාධීරගේ කවියාගේ තෙවැනි කාව්‍ය සංග්‍රහය යි. මේ කවියා ලොව දකින්නේ හදවතින් බව අප සියලු දෙන දන්නේ ආරංචියක් ලෙස නොව, ඔහුගේ කවිය ද එසේ කියනා බැවිනි. උපුල් යනු ධෛර්යයේ කවියෙකි.

'නානුඹය දුම්රිය නැවතුමේ දී' නම් කවිය පසුගිය වකවානුවේ උපුලතින් ලියැවුණු

උසස් නිමැවුමක් ලෙස ප්‍රශංසා ලද කවියකි. මෙම ග්‍රන්ථයේ වන නිර්මාණ සමුදාය ඔහුගේ පැන්තුඩට යළි යළිදු කැපී කෙටී යා හැකි පරිදි ඔහුට ම සම්මුඛ විනි නම් ඇතැම් නිර්මාණ මෙයට වඩා වෙනස් වීමට අවකාශ තිබුණි. එහෙත්, සහෘදයෙකුගේ කියවීමේ අත්වාරුව සහිත ව ඔහු කරන මේ ආශ්චර්ය විටෙක අපට සිතියම්ගත කරගනු ද නොහේ.

'මරාගනිති ඔවුහු
එකිනෙකා හා ගැටී
නගා ඉලක්කය හිසට ම'

ගෝඩ් ෆාදර් (God Father) චිත්‍රපටය ඇසුරින් කවියා ආසියාවේ ආශ්චර්ය පින්තාරු කරයි.

'වෙඩි තබමින් අප දිවගියේ
වෙඩි වදිමින් සිටිය දී ය' නම් සුනන්ද කරුණාරත්නගේ කවි පද ද සිහි වේ. මේ කවීන්ට ඇස ගැටෙන අද්‍යතන ලාංකික සමාජ තතුව යි.

පතන් බිමක අසිරිය, නෙත් වැනි කාව්‍ය නිර්මාණ විරෝධාකල්පය, සමාජ විවේචනය වැනි නිසැක මාර්ග හෝ නියාමයන් නොගෙන කවියට ම ආවේණික වින්දනානුභූතියක් මවා ඇත. කවිය යනු භාෂාමය විඳුමක් බව අඟවන නිර්මාණ කිහිපයක් ම මේ කෘතිය තුළ ඇත. ඊට අමතර ව බොහෝ විට අප ජීවත් වන ගම-රට මනුෂ්‍යයා උදෙසා යහපත් වීම කවියෙන් ද පතන කවියෙකි ඔහු. එහෙත්, 'වැලපෙන විලෝව' බඳු නිර්මාණයක ගැබ් වන විරෝධය තුළ සංවේග වේදනාවක් ද සහිත ය. 'වෙනස් වීම' කවීන් පතන්නේ ද කවිය තරම් ම වක් ව ය.

ද්විතීය හා තෘතීය අඩවි පිළිබඳ විමසුමක් කිරීමට සුපුරුදු ලෙස ම අවකාශ නොලබමි. එහෙත්, සත්‍යයක් ලෙස ඇත්තේ එකවිගත් අතර ඉමිහිරි ම නිර්මාණ සම්භාරයක් ඇති බව යි. ඒ ඇතැම් කෘති දොරට වඩනා දිනවල දෙසුම් ද කළ මම ඒ බව සක්සුදක් සේ දනිමි. මේ ග්‍රන්ථාර්ණවය අතරින් ඇතැම් කෘතියක්, ඇතැම් රසිකයෙකු ප්‍රථම අඩවියේ කවිගත් අතරට වර්ග කිරීමට ද අවකාශ ඇති තරමට ඒවා තුළ සාධනීයතා ඇත.

මෙලෙස ආන්තික කෙරෙන (පත් ඉරුවෙන්) නිර්මාණ දෙස බැලීමට ඇසක් නිමවා ගත නොහැකි වීම ඒ නිර්මාණකරුවන්ගේ නොව, අපේ අඩුලුහුඬුතාවක් ගම්‍ය කරවයි. විටෙක අප ආධුනික යැයි සිතූ කවිකම් හරහා ඊළඟ වසරක ප්‍රශස්ත කාව්‍ය ග්‍රන්ථය ද බිහි විය හැකි ය. කවියාගේ මේසය මත එබඳු දෑ සිදු වෙයි.

පරිවර්තන කාව්‍ය මගින් සිංහල කවිකෙත පෝෂණය වීම ද 2013 පරිණත වසරක් වීමට සාක්ෂ්‍ය කියයි. නන්දන වීරසිංහ (දිසි අදිසි) සහ පරාක්‍රම කොඩිතුවක්කු (රතු රෝස නිල් රෝස) යන ජ්‍යෙෂ්ඨ කිවිවරු මෙවර සිය වෙහෙස කාව්‍ය පරිවර්තනය පිණිස අති විශිෂ්ට ලෙස යොදවති. මෙයට අමතර ව නිහාල් රාජකරුණානායක සිංහල කවි කිවිඳියන් රැසකගේ තෝරාගත් නිර්මාණ ද ඉංග්‍රීසියට නගා Ripples නමින් පළ කර ඇත. Snapshots of Realism නම් ඉංග්‍රීසි බසින් ලියැවුණු කාව්‍ය ග්‍රන්ථය පළ කරන බෙවර්ලි ගෝමස් කවියා ඈන් රණසිංහ, ජීන් අරසනායගම් ආදී සනුහරයට එක් වෙයි. අන්‍ය භාෂීය පයුරුපාසානය අතින් ද කවිය ද සිංහල කවිය ද විවරණ ලැබීම 2013 වසර අසිරිමත් කවි වසරක් බවට පත්කර ඇත.



**ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි**

*ජ්‍යෙෂ්ඨ සරසවි කථිකාචාර්යවරයෙකි.*
*සාහිත්‍ය/ කලා/ සිනමා විචාරකයෙකි, ලේඛකයෙකි.*



# මූල්‍ය පාලන දැනුම

## පුස්තකාලයාධිපතිවරයෙකුට අත්‍යවශ්‍ය අංගයක්

පුස්තකාලයාධිපතිවරයෙකුගේ කෝණයෙන් බලන විට පුස්තකාලයකට වැදගත් කළමනාකරණයක් ලෙස මූල්‍ය කළමනාකරණය පෙන්වා දිය හැකිය. පුස්තකාලයට ලැබෙන මුදල් මත පුස්තකාලයේ සියලු කළමනාකරණ කටයුතු සිදු වේ. මෙසේ මූල්‍ය කළමනාකරණය පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් මනාව කළමනා කළයුතු අවස්ථාවකි.

ආයතනයක පරමාර්ථ හා අරමුණු ළඟාකර ගැනීම පිණිස අවශ්‍ය සම්පතකි මුදල්. මුදල් නොමැතිව කිසිම ආයතනයක කිසිම කටයුත්තක් සිදු නොවේ. ඒ අනුව ආයතන මුහුණ දෙන ප්‍රධාන ගැටලු නම් මුදල් සොයා ගැනීම හා සොයාගත් මුදල ගැළපෙන අයුරින් යෙදවීමය. පුස්තකාලයක නම් ප්‍රධාන ආදායම් මාර්ගයක් නැත. එය කිසියම් මවු ආයතනයක් යටතේ පාලනය වේ. එසේම එහි වියදම් ද සාමාන්‍ය ආයතනයකට වඩා වෙනස්ය. මෙම ආදායම හා වියදම වැදගත් සංකල්පයන් වේ. මෙසේ මූල්‍ය කටයුතු ඒ ඒ අංශයන් සමඟ සම්බන්ධ වී ඔවුන්ගේ යෝජනා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම කාර්යය සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පාලනය මූල්‍ය කළමනාකරු අතින් සිදු වේ. මේ සඳහා පෙර වර්ෂවල මුදල් තොරතුරු කාරක, ප්‍රාග්ධන, අය-වැය ඇස්තමේන්තු, සැලැසුම් උපකාරී වේ. මුදල් වැඩියෙන් තිබීම ද, අඩුවෙන් තිබීම ද අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නකි. එබැවින් ප්‍රශස්ථ මූල්‍ය ප්‍රමාණයක් පිළිබඳව නිගමනය කිරීම මූල්‍ය කළමනාකරුගේ වගකීම වේ.

පුස්තකාලයාධිපතිවරු මුදල් ලබා ගැනීමේ හා එසේ ලබා ගැනීමේ ක්‍රම පිළිබඳ කටයුතු කරමින් එසේ ලබා ගන්නා මුදල් පුස්තකාල අරමුණු ඉටුකර ගනු පිණිස නිසි ලෙස යෙදවීම පුස්තකාලයක් තුළ මූල්‍ය කළමනාකරණය සිදු වේ. ආයතන ප්‍රධාන පුස්තකාලයාධිපතිවරු මෙසේ මුදල් ආයෝජනයේ දී නිශ්චිත කාලයක් යොදාගත යුතු වේ. එසේම මේ සඳහා නියමිත ක්‍රමවේදයක් ද අනුගමනය කළ යුතු වේ. මෙහි ලා පුස්තකාලයාධිපතිවරු යොදා ගන්නා ක්‍රමවේදය වනුයේ අයවැයකරණයි. පුස්තකාලයේ නිසි අයවැය කළමනාකරණයක් තුළින් මූල්‍ය කළමනාකරණ අරමුණු ඉටුකර ගත හැකිය.

## අය-වැය ලේඛනයක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව

ආයතනයක අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කළමනාකරණයට තීරණ ගැනීම සිදු වේ. මෙම ක්‍රියාවලිය සැලැසුම් කිරීම යනුවෙන් හැඳින්වේ. සැලසුම් කිරීම කෙටිකාලීන හා දිගුකාලීන වෙයි. කෙටිකාලීන සැලැසුම් සම්පාදන ක්‍රියාවලියේ ඉතා වැදගත් අවස්ථාවකි අය-වැය ලේඛන පිළියෙල කිරීම.

යම් නිශ්චිත කාලසීමාවක් තුළ දී ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු, ඒවා ඉටුකර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, ගත යුතු පියවර සහ ඒ අනුව අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව අවසාන නිගමනයකට එළඹීමෙන් පසු එකී වැඩපිළිවෙල මෙහෙයුම් සැලැස්මක් බවට පත්වේ. මෙම මෙහෙයුම් සැලැස්ම ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් දැක්වූ විට එය අය වැය ලේඛනයක් බවට පත්වේ. මේ නිසා ආයතනයේ දිගුකාලීන අරමුණු ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා අය-වැය ලේඛන සම්පාදනය අත්‍යවශ්‍ය වේ.

## අය-වැය පාලනය

අය-වැය ලේඛනය පූර්ව සැලස්මක් වන අතර, එය ඉදිරි කටයුතු මනාව ඉටුකර ගැනීම සඳහා භාවිත කළ හැකි පාලන උපකරණයක් ද වනු ඇත. අපේක්ෂිත ඉලක්ක හෙවත් පරමාර්ථ එහි ඇතුළත් වන නිසා ක්‍රියාකාරිත්වයේ දී එම ඉලක්ක කොතෙක් දුරට ඉටු වන්නේ ද යන්නත් එබැවින් මනාව හඳුනා ගැනීමේ ඉඩකඩ කළමනාකරණය වෙත ලැබෙනු ඇත. සත්‍ය ප්‍රතිඵල අය-වැය ලේඛනය සමඟ සැසඳීමේ දී පවතින වෙනස්කම් හඳුනාගත හැකි වන අතර, මනා පිළියම් යෙදවීමෙන් එම වෙනස්කම් මඟහරවා ගත හැකි නිසා අය-වැය ලේඛනය සම්පාදනය පාලන ශිල්පී ක්‍රමයක් ලෙස යොදාගත හැකි බව මින් අදහස් කෙරේ. එංගලන්තයේ පිරිවැය හා කළමනාකරණ ආයතනය අය-වැය පාලනය යන්න පහත පරිදි දක්වා ඇත.

"ආයතනයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අය වෙත වගකීම් පැවරීම සහ එක් එක් අයගේ කටයුතුවලට ප්‍රතිඵල මැන ගැනීම සඳහා හා කළ යුතු වන සංශෝධන හඳුනා ගැනීමේ පදනමක් වශයෙන් සත්‍ය ප්‍රතිඵල අය-වැය ගත ප්‍රතිඵලයක් සමඟ අඛණ්ඩව සැසඳීමට ලක්කර ගැනීම අය-වැය පාලනය යන්නෙන් අදහස් කෙරේ." මේ හැඳින්වීම තුළින් අය-වැය පාලනය මඟින් පහත සඳහන් දෑ අපේක්ෂා කෙරේ.

1. අය-වැය ක්‍රියාවට නැංවීම
2. එක් එක් අය වෙත වගකීම් නිශ්චය කිරීම
3. ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්ති හඳුන්වා දීම
4. සත්‍ය ප්‍රතිඵල අය-වැය දත්ත සමඟ අඛණ්ඩව සැසඳීම
5. එක් එක් අයගේ ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කිරීම
6. කළ යුතු සංශෝධනයන් හඳුනා ගැනීමට කටයුතු කිරීම

## අය-වැය පාලනයේ පරමාර්ථ

### 1. සැලැසුම් කිරීම

ඉදිරි කාලයේ ආයතන කටයුතු සවිස්තරව පැහැදිලි කෙරේ. සවිස්තර සැලැසුමකට අමුද්‍රව්‍ය අවශ්‍යතා ශ්‍රම අවශ්‍යතා සංවර්ධන කටයුතු ප්‍රාග්ධන වියදම් ඇතුළත් වේ.

### 2. සම්බන්ධීකරණය

එක් එක් අංශයන්වල තත්ත්වයන් දෙස බලා සම්බන්ධීකරණ කටයුතු කරගත හැකිය.

උදාහරණ: පුස්තකාලයාධිපතිවරයෙකුට තම අංශ කෙරෙහි අවධානය යොමුකර හෝ පාඨක ප්‍රජාව කෙරෙහි අවධානය යොමුකර සම්බන්ධීකරණ කටයුතු කරගත හැකිය.

3. තොරතුරු හුවමාරුව

අය-වැයක් සකස් කිරීමේ දී සැලකිල්ට භාජනය කළ යුතු සාධක 03 කි.

1. ආයතනයේ පවතින සම්පත් ප්‍රමාණය
2. ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු
3. සීමාකාරී සාධක

අය-වැයේ හෙවත් සැලැසුමේ පවතින සම්පත් මට්ටම නිතරම රඳා පවතිනු ලැබේ. අරමුණු සැලැසුම් කළ යුත්තේ පවතින සම්පත්වලට අනුකූලව වන නිසා ඉටුකර ගත නොහැකි අරමුණු සැලැසුම් කිරීම ද සෑම විටම හානිකර වේ. ඒ හෙයින් අරමුණු සැලැසුම් කිරීම සෑම විටම පවතින සම්පත් ප්‍රමාණය මත තීරණය කළ යුතු ය.

## අය-වැයකරණය සඳහා වන අවශ්‍යතාවන්

1. ඉහළ කළමනාකරණ දායකත්වය
2. පැහැදිලි හා ඉටුකරගත හැකි අරමුණු පැවැතීම
3. සියලුම සේවකයන් දායක වීම
4. එක් එක් ඒකක සඳහා අරමුණු ඇති කිරීම
5. නම්‍යතාව
6. මනා සංවිධානය
7. මනා සන්නිවේදන ක්‍රමයක් පැවැතීම

## අය-වැයකරණයේ අරමුණු

1. කළමනාකරුවන්ට ඉදිරිය දෙස බැලීමටත්, වෙනස්වීම හඳුනා ගෙන ඊට කලින් සූදානම් කිරීමත් මෙමඟින් අරමුණු කෙරේ.

2. අනාගත ගැටලු කල් තියා සැලකිල්ලට ගෙන ඒවාට පිළියම් යෙදීම ඉක්මන් කිරීම.

3. පරිසරය විශ්ලේෂණය කර ගනිමින් වෙනස්වීම් හඳුනා ගැනීමට 'අරමුණු/ ඉලක්ක නියම කර ගැනීමටත් එම ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලැසුම් සකස් කිරීමටත් කළමනාකරුවන් පෙලඹවීම ද මින් අපේක්ෂා කෙරේ.

4. නිශ්චිත ක්‍රියාකාරී වැඩසටහන් ඇති කිරීම සහ ඒවායේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම.

5. නියම කරගත් අරමුණු කරා මනා සේවක සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම.

## අය-වැයකරණයේ ප්‍රයෝජන

- සමස්ත ආයතනයේ කටයුතු හා ආංශික කටයුතු මැනවින් සැලැසුම් කරගත හැකි වීම.
- ආයතනයේ විවිධ අංශ හා සේවකයන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යා හැකිවීම.
- අංශ හා පුද්ගලයන් අතර බලතල හා වගකීම් නිශ්චිතව පැවරිය හැකි වීම.
- එක් එක් අය විසින් ඉටුකළ යුතු වැඩ කොටස පහසුවෙන් හඳුන්වා දිය හැකි වීම.
- ආයතනයේ ඉහළ හා පහළ මට්ටමේ සියලුම අය මෙම කාර්යය හා දායක වන බැවින් එම දෙපාර්ශ්ව අතර මනා සන්නිවේදනයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළ හැකි වීම.
- ආයතනයේ කටයුතු මනා පාලනයකට යටත් කරගත හැකි වීම.
- සියලුම සේවකයන් කිසියම් ඉලක්කයන් කරා මෙමඟින් යොමුකර ඇති බැවින් එම ඉලක්ක ඉටුකර ගැනීමෙන් සේවකයාගේ චිත්ත ධෛර්යය වර්ධනය කළ හැකි වීම.
- සම්පත් භාවිතයේ ඇතිවන නාස්තිය අවම වී යාම.
- සැලැසුම්සහගත සම්පත් උපරිමව පරිභෝජනයට යෙදවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයේ ලාභ දායකත්වය වර්ධනය කරගත හැකි වීම.

● ස්වයං පාලනයට සියලුම අංශ හා සේවකයන් යොමු කළ හැකි වීම.

### පුස්තකාලයාධිපතිවරයෙකු අය-වැයකරණය සඳහා දායක වන ආකාරය

පුස්තකාල සේවා සැපයීමටත්, ඒවා නඩත්තු කොට පාලනය කිරීමටත් මුදල් ඉතාමත් අවශ්‍යය. සමහර පුස්තකාලවලට ගොඩනැඟිලි, පොත්පත්, උපකරණ පරිත්‍යාග වශයෙන් ලබා ගැනීමේ වාසනාව ඇත. මේ නිසා ඒවා පාලනය කිරීම බොහෝ සෙයින් පහසුය. පළාත් පාලන ආයතනවල හා වෙනත් දෙපාර්තමේන්තුවල පුස්තකාලවලට රජයෙන් මුදලින් ආධාර ලැබෙන බැවින් ඒවා පැවැත්ම හා නඩත්තුව ඉතාමත් අපහසුය. සමිති සමාගම් හා වෙනත් පෞද්ගලික ආයතනවලට අයිති පුස්තකාල ඒ ඒ ආයතනවල මුදල්වලින් පවත්වා ගෙන යා යුතු බැවින් ඒවා එතරම් දියුණු තත්ත්වයක නොපවතී.

පුස්තකාල පාලනය කිරීමේ කටයුතු සතරක් සඳහා මුදල් අවශ්‍යය.

1. පොත් මිලට ගැනීම, පොත් බැඳීම හා ඒවා ආරක්ෂා වන අන්දමට පවත්වා ගෙන යාමට
2. කාර්ය මණ්ඩල සේවකයන්ගේ වේතන ගෙවීමට
3. ගොඩනැඟිලි සුදුසු පරිදි පවත්වා ගෙන යාමට හා ශුද්ධ පවිත්‍ර කිරීමට
4. පාලන වියදම් හා උපකරණ වියදම් සඳහා මෙම නඩත්තු වියදම් පිළිබඳව සැලකීමේ දී ගොඩනැඟිලි, ඉඩම් හා වෙනත් වියදම් වශයෙන් මූලික වියදම් සම්බන්ධව ගණන් ගනු නොලැබේ.

පළාත් පාලන හා රජයේ ආයතනවල ඇති පුස්තකාල සඳහා අවශ්‍ය මුදල් වාර්ෂික වියදම් යනුවෙන් වාර්ෂික ඇස්තමේන්තුවට හෝ අය-වැය ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. පුස්තකාල නියම වශයෙන් පාලනය කිරීමට නම් මේ ක්‍රමය ඉතාමත් අවශ්‍ය ය. වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ දී පහත පිළිවෙළ අනුගමනය කරනු ලැබේ.

**පොත්**

පොත් වාර සඟරා පොත් බැඳීම සඳහා යන වියදම්

**කාර්යමණ්ඩලය**

වැටුප් හා වේතන රක්ෂණ වියදම්

විශ්‍රාම වැටුප් නිල ඇඳුම් වියදම්

**ගොඩනැඟිලි**

ගෙවල් කුලී අලුත්වැඩියා කිරීම්

ආලෝකය හුනු හා තීන්ත ගෑම පවත්වාගෙන යාම

පාලන හා උපකරණ වියදම්

මුද්‍රණ වියදම් තැපැල් ගාස්තු ලී බඩු උපකරණ ගමන් වියදම් ලිපි ද්‍රව්‍ය

පුස්තකාල ආදායම් හා වියදම් සාමාන්‍යයෙන් මේ ආකාරයට දැක්විය හැකි ය.

**අය**

දඩ වශයෙන් ලැබෙන මුදල්, වාර සඟරා ආදිය විකිණීමෙන් ලැබෙන මුදල්, පරිත්‍යාග වෙනත් ආදායම්

**වැය**

වේතන හා වැටුප්, පොත්වලට, වාර සඟරාවලට, පොත් බැඳීමට, උපකරණ ආදිය, ගොඩනැඟිලි නඩත්තුව හා අලුත්වැඩියාව, ගොඩනැඟිලි කුලී, විදුලිය සඳහා, දුරකථන ගාස්තු, මුද්‍රණ වියදම්, වෙනත් වියදම්

පුස්තකාලයක වියහියදම් පිළිබඳව ගණන් ගැනීම ආදි කටයුතු එම ආයතනයේ ගිණුම් අංශයෙන් සැලකිල්ලට යොමු වුවත් පුස්තකාලයාධිපති ද වියදම් පිළිබඳ යම් පරීක්ෂණයන් කරන්නේ නම් වඩා අගනේ ය. මෙසේ කිරීමෙන් වර්ෂයක් තුළ කළ යුතු වියදම් මනා සේ වෙන් කොට කොටස් වශයෙන් වියදම් කිරීමට උපකාරී වනු නියතය. මෙය වඩාත් ප්‍රයෝජනයක් වනුයේ පොත් ලිපි ද්‍රව්‍ය ආදී වියදම් පිළිබඳව ය.

පුස්තකාලයේ සෑම අංශයක්ම සම්බන්ධ කරගත් අය-වැය කමිටුවක් තිබීම අනිවාර්ය ය. ඒ ඒ අංශයන්වල ක්‍රියාකාරිත්වයන් ආදායම් හා වියදම් තත්ත්වයන් මෙම කමිටුවේ දී සලකා බැලිය හැකිය. එවිට තම අංශයේ ආදායම වියදම අවශ්‍යතාව ආදිය යෝජනා ඉදිරිපත් කර පුස්තකාලයේ සංවර්ධනයට සහය විය හැකිය. මෙම කමිටුවේ ප්‍රධාන ධුරය පුස්තකාලයාධිපතිවරයා දැරිය යුතුය. පුස්තකාලයාධිපතිවරයාගේ කළමනාකාරිත්වය යටතේ පුස්තකාලයක මූල්‍ය පාලනය සිදුවීම පුස්තකාලයට යෝග්‍ය වේ.

**ආශ්‍රිත කෘති**


1. අලහකෝන් උදිත, (2003), පුස්තකාල එකතු කළමනාකරණය, ගම්පහ. කර්තෘ ප්‍රකාශන
2. ඌරාපොළ නන්දසේන (1997), පිරිවැය කළමනාකරණ ගණකාධිකරණය, කොළඹ, රත්න ප්‍රකාශන
3. චන්ද්‍රකුමාර අනිල් (1998), කළමනාකරණයේ මූලධර්ම සංකල්ප හා කාර්යයන්, නුගේගොඩ. කර්තෘ ප්‍රකාශන
4. ජයතිස්ස එල්.ඒ. (1999), පුස්තකාල කළමනාකරණය, කැලණිය. කර්තෘ ප්‍රකාශන
5. ජයසිංහ ශ්‍යාමන් (1996), කළමනාකරණයේ හැඳින්වීම, නුගේගොඩ. සරසවි ප්‍රකාශන
6. පියසිරි ජී.ඩී. (1977), කළමනාකරණයේ මූලිකාංග, කොළඹ. දයාවංශ ජයකොඩි සමාගම
7. තාබ්‍රෙව්, එම්.එච්.ඩබ්ලිව්. (1964), පුස්තකාල විද්‍යාවේ මූලධර්ම, කොළඹ. ගුණසේන සමාගම





**ඩී.ජී.ඒ. ශ්‍යාමලී මල්කාන්ති**

*සහකාර පුස්තකාලයාධිපති*

*මාකඳුර පුස්තකාලය*

*වයඹ සරසවිය.*


# දෙබල කරු

එක්තරා වනාන්තරයක් අසල පිහිටි ගමක මිනිසුන් ඔවුන්ගේ නිවෙස්වල මේස කකුල්වලට ගන්නේ ගස්වල දෙකට බෙදී ගිය දෙබල කරු. ගෙදර මේසයේ කකුලක් කැඩුණු නිසා තාත්තා පුතාව ඇරියා කරුවක් කපාගෙන එන්න. ටික වේලාවකින් පුතා හිස් අතින් ගෙදර ආවා. තාත්තා ඔහුට දොස් පැවරුවා.

පුතා මෙහෙම පැවසුවා. "ගස්වලනං හරියට දෙබල කරු තියෙනවා. ඒත් ඒවා ඔක්කොම හැරිලා තියෙන්නෙ උඩ පැත්තටනෙ."



# සිහිනය ඔබමය

මහා දිග සිහිනයක කෙළවර
දිගා වී ඔබ නිදා සිටියෙහි
අනේ ඇස්වහ කටවහක් නැත
හතර ගාතෙන් නිදා සිටියෙය

බදාගෙන අමු ක්ලේශ කඩමලු
ගොරව ගොරවා නිදා සිටියෙය
මහා පොළොවේ ධූලි පිරුවට
පොරෝනය තුළ නිදා සිටියෙය

සිහිනය ද නිදි ඔබ ද නින්දේ
දෙදෙන නින්දට සින්න වුව ද
ශිශිර තාරක නින්ද දියවන
ලකුණු ග්ලැසියර තුළ නිධාන ව

මහා මෝසම් ඇණුමක් හැර
දිනෙක නිදිගැට හරින සිහිනය
දකී ඔබ හිම වළස් නින්දක
සුවය විඳ විඳ දපන අසිරිය

හැබැයි අනියත නින්ද කෙළවර
යළිදු ඔබ පිබිදෙනා මොහොතක
නොනින්දක හා නින්ද අතරෙහි
පරස්පරයක් දකිනු හැකිවෙද?

මහා සිහිනය ඔබම විත්තිය
ඔබට වැටහෙන සොඳුරු මොහොතක
මහා රික්තය තුළට දියවෙන
ජීවිතය සුන්දර වාෂ්පය!



**කුමාර හෙට්ටිආරච්චි**

වෘත්තියෙන් ගුරුවරයෙකු වන කුමාර හෙට්ටිආරච්චි බහු ආංශික කලාකරුවෙකි. ඔහු කවියෙක්, ප්‍රබන්ධ කතාකරුවෙක්, ළමා පොත් රචකයෙක්, විද්‍යා ලේඛකයෙක්, නාට්‍ය ශිල්පියෙක් හා චිත්‍ර ශිල්පියෙක් ද වේ. ඔහු සම්මානලාභී කවියෙකි.

ඔහුගේ 'මහාද්වීපය' හා 'සදාකාලික මධ්‍යාහ්නය' යන කාව්‍ය කෘති සඳහා පිළිවෙළින් 1991 හා 1992 වර්ෂාවල දී එම වසරවල විශිෂ්ට කාව්‍ය කෘතීන්ට හිමි රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලබාගත්තේ ය. මේ හැරුණු විට ඔහු ලියා ඇති තවත් පද්‍ය ග්‍රන්ථ කිහිපයකි. සක්මන් මළුව (1985), භස්මාවශේෂ (1986), රුවන් සක්මන (1989), පාර ජම්බුල (2010), සයංජාත සංජානන (2011), සඳකැන් මිණි ගඟුල පත්ලෙ (2012) හා සාරාසංඛ්‍ය අග්නි වාෂ්ප (2013) ඒවාය.

# සාහිත්‍ය විචාරය
## විධිමත් විද්‍යාවක් සේ ගොඩනැගිය යුතුයි

අප රට පොදු ලේඛක ජනයා අතින් බිහිවන හැම කෘතියකම පාහේ දක්නට ලැබෙන්නේ '**සාහිත්‍ය විචාරය**' යැයි හඳුන්වනු ලබන පිළිවෙළේ කියුම් ය. පාඨශාලා ශිෂ්‍යයාගේ පටන් අනුපිළිවෙළින් ඉහළ පෙළැන්ති දක්වා සියල්ලෝ ම සාහිත්‍ය විවේචනය කෙරෙති. සියල්ලෝම සාහිත්‍ය කෘති තුලනය කෙරෙති. එහෙත්, විද්‍යානුකූල පදනමක නො පිහිටා කරනු ලබන එකම විද්‍යාව නූතන සාහිත්‍ය විද්‍යාව යැයි කිවයුතු අවධිය එළඹ තිබේ. ලක්දිව මෙන් සිය ගණනින් 'සාහිත්‍ය විචාරකයන්' ඇත්තේ නැතත් අපරදිග රටවල පවා නූතන සාහිත්‍ය විචාර ක්‍රමය විධිමත් ව සකස් කළ යුතු බව උගතුන් විසින් පිළිගෙන ඉවර ය.

භාරතියයන්ගේ පැරැණි පොතක පතක දිස්වන කිසියම් හුදු සොලෝවක් අනුසෙරෙන් හෝ අවරදිග විචාරකයන් කී වැකියක් දෙකක් අවුලා ගනිමින් හෝ සාහිත්‍ය විචාරයට බැසීම ප්‍රශංසනීය නොවන ලක්ෂණයෙකි. සාහිත්‍ය විචාරය සඳහා කිසියම් 'මිණුම් දණ්ඩක්' අවශ්‍යයයි කියා කවියාගේ හිතත් හදවතත් හාරා බලන්නටත්, ඒ හිතෙහි පැවැති අදහස් හා හදවතෙහි පැවැති හැඟීම් හෙළිකරන ලද සැටි විමසන්නටත්, එකී අදහස් හා හැඟීම් පාඨකයාගේ සිතට කා වැදී ගන්නා අයුරු පිරික්සන්නටත් යාම නිසා සාහිත්‍ය විචාරය බොහෝ දෙනාට පහසු විද්‍යාවක් සේ හැඟී ඇති නමුත්, එය අවුල් ජාලයක පැටලී ඇති ශාස්ත්‍රයක් බවට අනිවාර්යයෙන් පත් වී සිටී. කවියා සිතූ පැතූ සැටිය සහ ඔහුගේ හැඟීම් විවේචනයට හෝ පරීක්ෂණයට සාහිත්‍ය විචාරකයා පොහොසත් නොවෙයි. එසේ හෙයින්, එබඳු පිළිවෙතක සරණ සොයන විචාරක තෙමේ විධිමත් පදනමක් ඇති ව සැකැසුණු විද්‍යාවකින් සංවර කළ යුත්තෙක් වෙයි.

සාහිත්‍ය විචාරයෙහි දී අප විසින් විවේචනය කරනු ලබන්නේ සාහිත්‍ය කෘතිය මිස කර්තෘවරයාගේ මනස හා හදවත නොවෙයි. සාහිත්‍ය කෘතිය අප හමුවේ සිටගෙන එක එල්ලේ අප දෙස බලා සිටී.

අපේ කාරිය'විය යුත්තේ ද එක එල්ලේ සාහිත්‍ය කෘතිය දෙස බලා එය ව්‍යවච්ඡේදනය කිරීම මිස ළඟ නැති මිනිසාගේ අදහස් පිරික්සීම නොවෙයි. සාහිත්‍ය කෘතියක් කියැවීමෙන් අපට කිසියම් අරුතක්, කිසියම් රසයක් එළැවෙතොත් ඒ එළැවෙන්නේ කවියා සිතූ අයුරක් නිසා ම නොව, සාහිත්‍ය කෘතියේ ගැබ් ව ගෙන ඇති කිසියම් අංගලක්ෂණයක් නිසා ය. සාහිත්‍ය කෘතියේ ගැබ් ව ගෙන ඇති අංගලක්ෂණ, අදහස් හා හැඟීම් ආදිය නොව, හුදෙක් වචනමය. හැම වචනයක ම වචන පද්ධතියෙක අංශයේ රැඳී සිටි වාක්‍ය, ඡේද, පිටු ආදී වශයෙන් දිවෙන 'විශේෂ භාෂාවක් එකී කෘතියෙහි නිදහන් ව ඇති හෙයින්, එකී 'භාෂාව' විධිමත් ව ව්‍යවච්ඡේදනය කොට, අර්ථ නිෂ්පත්තිය හා රස උද්වහනය සිදුවන පිළිවෙළ විද්‍යානුකූල ව පිරික්සිය යුතු වෙයි. **මෙය කළ හැක්කේ විද්‍යානුකූල සාහිත්‍ය විචාර මාර්ගයක් සකස් කිරීමෙන් මිස උපන් ගෙයි හිඳගෙන ම විචාරය කිරීමට ඇරඹීමෙන් නොවේ.**

විධිමත් ව සකස් වුණු, සකස් විය යුතු සෑම විද්‍යාවක් උදෙසා ම ඊට ආවේණික වූ විශේෂ පරිමිත භාෂාවන් හැඩගැස්විය යුතු බව මින් පෙර ද අප විසින් පෙන්වා දෙන ලදි. සාහිත්‍ය විචාරය විධිමත් විද්‍යාවක් සේ ගොඩනැංවීම් වස් සාහිත්‍ය විචාරයට අදාළ වූ විශේෂ 'පරිමිත භාෂාවක්' සකස් කැරගත යුතු ය. 'සාහිත්‍ය විචාරය' යනු දන්නා තරමින් නොයෙක් වැල් වටාරම් ගැබ්කොට ගොඩනැංවුණු ප්‍රෞඪ වාංමාලාවක ස්වරූපයෙන් ඉවතට ගතයුතු ශාස්ත්‍රයකි. විද්‍යාවක විද්‍යානුකූල ගතිය රඳා ඇත්තේ වාංමාලාවේ ප්‍රෞඪත්වය මත නොව, ඒ සඳහා යොදාගනු ලබන විද්‍යාත්මක සිද්ධාන්තත් විචාරකයාගේ නිගමන ලියැවිල්ලට නඟන්නට යොදනු ලබන පරිමිත භාෂාවත් මත ය.

## සාහිත්‍ය විචාරය යනු කුමක් ද?

කියව කියවා රස විඳීම වූ කලී සාහිත්‍ය විචාරය නොවෙයි. කවක් කියවා රස විඳීම එකකි. කාව්‍ය විභාග කොට පරීක්ෂා කිරීම අනෙකකි. රස විඳීම යනු විඳින්නාගේ රුචිය මුහුකුරා ගිය පමණට සිදුවන්නකි. විචාර ක්‍රමය වූ කලි විද්‍යානුකූල ව හැඩගැසුණු සිද්ධාන්තයන් මත පිහිටා කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල, ඒ සඳහා සකස් වුණු විශේෂ භාෂාවකින් අන්‍යයන් හට කියාපෑමේ සංග්‍රහාත්මක ව්‍යවච්ඡේදන විද්‍යාවෙකි.

එබැවින් සාහිත්‍ය විචාරය උදෙසා විධිමත් ව හැඩගැසුණු පරිමිත භාෂාවක් විද්‍යානුකූල ව සාහිත්‍ය පර්යේෂණයෙහි යෙදෙන්නන් විසින් ක්‍රමවත් ව සකස් කරගත යුතු බව පළමු කොට ම ඉදිරිපත් කරමි. මේ ඈ කිසිවක් කළ යුතු සැටිය ආදිය පිළිබඳ ව දීර්ඝ විස්තර සඳහා මේ තැන් නො වේ.

ඕනෑ ම භාෂාවෙක 'දුප්පත්' 'පොහොසත්' කම් යනුවෙන් පොදුජනයා විසින් හඳුන්වනු ලබන කිසියම් ලක්ෂණයක් වේ නම් ඒ ලක්ෂණය රඳා ඇත්තේ එකී විද්‍යාව උදෙසා උපයෝගි කර ගැන්මට සුදුසු පරිදි ඒ භාෂාව පරිමිත භාෂාවන් ගෙන් යුක්ත වූ පමණ මත ය. සිංහලය හැම වැඩක් සඳහා ම යොදාගත යුතු යැයි මුරගෑම ප්‍රමාණවත් නො වේ. එකී වැඩය උදෙසා විශේෂ ලක්ෂණයන්ගෙන් යුක්ති පරිමිත භාෂා සකසාගැන්ම ඒ අඩුපාඩුව පුරවා ගැන්මේ විද්‍යානුකූල මාර්ගය යි. ඒ පදනම, භාෂාව නා නා විෂයයනට උපයෝගී කරගැන්ම සඳහා පමණක් නො ව, එකී භාෂාවෙන් විස්තර කරනු ලබන විද්‍යාවන් ගේ විද්‍යානුකූලතාව කුළුගැන්වීමට ද ඉවහල් වන්නකි. සිංහල භාෂාවත්, සාහිත්‍ය විද්‍යාවත් යන දෙක ම

උදෙසා විද්‍යානුකූල මාර්ගයක් අනුගමනය කරන්නට රිසියන් විසින් 'පරිමිත භාෂා' න්‍යායය පිළිපැදිය යුතු වන්නේ එහෙයිනි.

සාහිත්‍ය විචාරකයාගේ අවධානය ලක්විය යුත්තේ තමා කෙරෙහි බැල්ම හෙළා සිටින සාහිත්‍ය කෘතිය මත මිස ඉන් බැහැර වූ අන් කිසිවක් මත නො වන බව පෙර ම කීමි. විචාරකයා විසින් විග්‍රහණ - ව්‍යවච්ඡේදන - පරීක්ෂණ - සංග්‍රහණ ආදි විභාග කටයුත්තේ එකී සාහිත්‍ය කෘතිය පමණි. සාහිත්‍ය කෘතියේ දක්නට ලැබෙන්නේ කිසියම් භාෂා අංශයෙකි. එය පද, වැකි, පිටු ආදියෙන් යුක්ත වූවකි. හැම පදයක් ම, හැම වැකියක් ම වෙනත් පද පෙළක වෙනත් වැකි පෙළක, ඇසුරේ රැඳී සිටී. විචාරකයාගේ අවධානය ලක්විය යුත්තේ එකී භාෂා සංග්‍රහය මත වෙයි. සාහිත්‍ය විද්‍යාවට හුදෙක් දෘෂ්ටිගෝචර විද්‍යාවක ස්වරූපය වෙසෙසා ම වැද්ද දිය යුතු අවධිය එළඹ තිබේ. විද්‍යානුකූල ව සකස් කරනු ලබන හැම විද්‍යා සිද්ධාන්තයක් ම එ තෙක් - මෙ තෙක් පහැඩගැසී ඇති විද්‍යාවන් ගේ ආශ්‍රයෙන් දියුණු වනු සැබෑ වුව ද, කිසිදු දෘෂ්ටිගෝචර විද්‍යාවක් අන්‍ය වූ විද්‍යාවකට වහල් නො කළ යුතු බව අප විසින් සිහියේ තබාගත යුත්තකි. මානසික විද්‍යාව වේවා, දර්ශන න්‍යාය ශාස්ත්‍රය වේවා, ඒ කිසිවකට සාහිත්‍ය විද්‍යාව වහල් විය යුතු නො වෙයි. එහෙත්, සාහිත්‍ය කෘතිය යනු භාෂාවෙකින් හැඩගැසුණු සන්දර්භ ලක්ෂණ නිසා රස දනවන්නක් හෙයින් වාග් විද්‍යානුකූල පදනමක පිහිටා සාහිත්‍ය විද්‍යාව නවතායෙකින් සකස් කළ යුතු බව නිහතමානයෙන් කියා සිටිමි. වාග් විද්‍යාව යනු පදයන් ගේ මුල රූප සොයා යාමට සීමා වූ විද්‍යාවක් නො ව, භාෂාවන්හි අර්ථ නිෂ්පත්තිය විද්‍යානුකූල ව පර්යේෂණ කිරීම සඳහා හැඩගැසුණු නව්‍ය විද්‍යාවකි. සාහිත්‍ය විචාරයෙහිදීත් අප විසින් සෙවිය යුත්තේ පද සමුදායෙක සංකලනයෙන් අපට කිසියම් රසයක් දැනැවෙන්නේත්, අරුතක් නිපැයෙන්නේත් කෙසේ ද යන්න ය. එබැවින්, විධිමත් ව සකස් වූ කල, වාග් විද්‍යාවත්, සාහිත්‍ය විද්‍යාවත් එක ම මාර්ගයෙක ගමන්කරනු ඇත.

## පරමාර්ථය

එක් වැකියෙකින් කියතොත්, සාහිත්‍ය විචාරයේ පරමාර්ථය විය යුත්තේ කාව්‍යය කියවා විචාරකයා ලබන අරුත හා විඳින රසය එකී පද සමුදායෙන් නැංවෙන්නේ කෙසේ දැයි විද්‍යානුකූල ව පරීක්ෂා කිරීම යි. කවියාගේ මනස හා හදවත පිළිබඳ ව හෝ හැඟීම් හා අදහස් පිළිබඳ ව හෝ විමැසිල්ලක් මෙහි දී අවශ්‍ය නො වෙයි. වෘත්තය, ලය, පද, සංඝටනාව ආදිය හුදෙක් භාෂා ප්‍රයෝගයන් මිස මානසික විද්‍යාවේ අංගෝපාංග නො වේ.

විද්‍යාත්මක පර්යේෂණය වූ කලී ප්‍රස්තර පද්ධතියක් මූලධර්ම කොට ගෙන කළ යුත්තකි. සාහිත්‍ය විද්‍යාවේ දී මූලධර්ම වශයෙන් ප්‍රස්තාර පහකින් සමන්විත න්‍යායයක් අපේ පර්යේෂණ සඳහා යොදාගත යුතුවිය. එහෙත්, මෙකී ප්‍රස්තාර පහ සියල්ලන් ගේ ම පදනම විය යුතු යයි මම නො කියමි. මා කියන්නේ සාහිත්‍ය විචාරය භාෂා, සන්දර්භ පරීක්ෂණය මුල්කොට දෘෂ්ටිගෝචර විද්‍යාවක් සේ සකස් විය යුතු බවයි. ශබ්ද සංග්‍රහය, පද සංඝටනය. ව්‍යාකරණ සංලක්ෂ්‍යය, පරිසරය මානුෂික අනුභූතිය යනුවෙන් අප විසින් යොදාගන්නා ලද ප්‍රස්තර පද්ධතිය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වෙයි. මුල් ප්‍රස්තර තුන සාහිත්‍ය කෘතියේ අභ්‍යන්තර පරීක්ෂණ අරභයා ය. ඉතිරි දෙක, එකී අභ්‍යන්තර ලක්ෂණ සමාජය හා ඈඳීම සඳහා ය. මේ පදනම නිසා සාහිත්‍ය විද්‍යාව දෘෂ්ටිගෝචර

විද්‍යාවක් පමණක් නො ව, සමාජ විද්‍යාවක් ද වෙයි.

සාහිත්‍ය කෘතියක් ලියනු ලබන්නේ සමාජයට ය. කියවනු ලබන්නේ ද සමාජය විසිනි. එබැවින් එය සමාජ විද්‍යාවක ස්වරූපය ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුත්තකි. සාහිත්‍ය විචාරය මානසික විද්‍යාව හා ඇඳුණුවට වඩා සමාජ විද්‍යාවක් බවට පත් කිරීම අත්‍යවශ්‍ය වෙයි. මෙකී පදනම සඳහා අප විසින් උපයෝගී කරගන්නා ලද්දේ වාග් විද්‍යාව පිළිබඳ නූතන මූලික සිද්ධාන්ත තුලනය කිරීමෙන් ලත් විධිමත් විද්‍යාත්මක පදනම ය. වාග් විද්‍යාව ද සමාජ විද්‍යාවෙකි. ඉතාමත් විධිමත් ව සකස්වුණ සමාජ විද්‍යාව වාග් විද්‍යාව යැයි කිවයුතු වෙයි.

භාෂාවක් වූ කලී අදහස් ප්‍රකාශ කිරීමේ පදනම ය. සාහිත්‍යය යනු කවියාගේ හැඟීම් පිරික්සන මිනුම්දණ්ඩය යනාදි නො පුළුල් කල්පනා බැහැර කළ කල සාහිත්‍ය විචාරය සමාජ විද්‍යාවක් සේ විධිමත් ව සංවර කළ යුතු බව වියතුනට පැහැදිලි වනවා ඇත. විද්‍යානුකූල ව කරනු ලබන සෑම පර්යේෂණයක් උදෙසා ම විද්‍යානුකූල සංවරයක් හා ශික්ෂණයක් ලැබීම අත්‍යවශ්‍ය හෙයින් සාහිත්‍ය විද්‍යාව පොදුජන විද්‍යාවෙකැයි යන හැඟීම සිතින් දුරු කළ යුතු අවධිය එළඹ ඇති බව ද වියතුන්ගේ අවධානයට ලක්විය යුතු ය.

ම.ව. සුගතපාල ද සිල්වා

*ලන්ඩන් විශ්වවිද්‍යාලයේ වාග් විද්‍යා මණ්ඩලය*
*රසවාහිනී (1956)*




# ගසට ඇතුළුවීම

උණ ගස පැරණි චීනයේ චිත්‍ර ශිල්පීන්ගේ කෘතිවල බෙහෙවින් දක්නට ඇත. ඉතා අගය කොට සලකනු ලබන ඇතැම් චිත්‍රවල දැක්වෙන්නේ කොළ කිහිපයකින් යුත් කුඩා උණ අතු කැබැල්ලක් පමණය. එම චිත්‍ර ඇඳ තිබෙන්නේ පට රෙද්ද මතුයෙහි තෙළිතුඩෙන් ය. සිතුවම් ඉතා ඉක්මනින් නොකළහොත් රෙද්දෙහි තීන්ත බොඳ වී පැතිරී යන්නේ ය. එහෙත්, විනාඩියකින් දෙකකින් ඇඳ අවසන් කරන ඒ චිත්‍රයක් වෙනුවෙන් ගත කරන සම්පූර්ණ කාලය ඇතැම් විට අවුරුදු හතරක් පහක් වී ඇතැයි කියති. ඒ දීර්ඝ කාලය ගතවන්නේ අඳින්ට පුරුදු වීමට නොව ශිල්පියා 'ගසට ඇතුළුවීමට' ය. ගස තමා තුළට 'ඇතුළු කර ගැනීමට'ය.

ගස ඇඳීමට අදහස් කරන ශිල්පියා ගස ළඟ පදිංචි වෙයි. එහි නැවතී ඔහු ගස ගැන 'භාවනාවෙහි' යෙදෙයි. කලක්, ඇතැම් විට අවුරුදු කිහිපයක්, මෙසේ කරගෙන යන විට, ගසත්, තමාත් අතර පරතරය නැතිවී යයි. ඒ මොහොතෙහි ඔහු චිත්‍රය ඉක්මනින් අඳියි. එහිදී සිදුවන්නේ හුදු සිතුවම් ඇඳීමක් නොව, ආධ්‍යාත්මික ක්‍රියාවක යෙදීම ය. එම මොහොතේ ගසේ පෞරුෂත්වය කලාකරුගේ නොකිලිටි හදවත තුළින් සිතුවමට යයි. එහෙයින්ම ඒ සිතුවම කලාත්මක කෘතියක් වන්නේ ය.

ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම්
(1983 දෙසැම්බර් - අමරදේව ප්‍රතිසංවේදය)



# ගේබ්‍රියෙල් ගාෂියා මාකේස්

## ඉන්ද්‍රජාලිකයාගේ යථාර්තය

(1927.03.06 - 2014.04.17)

විසිවන සියවසේ විශිෂ්ටතම ලේඛකයෙකු ලෙස හඳුනාගැනෙන ගේබ්‍රියෙල් ගාෂියා මාකේස් වඩාත්ම ප්‍රකටවන්නේ ඉන්ද්‍රජාලික යථාර්තය නම් ලේඛන ශෛලිය ජනප්‍රිය කිරීම සම්බන්ධයෙනි.

සාහිත්‍යය සඳහා පිදෙන නොබෙල් ත්‍යාගය 1982දී ඔහුට හිමිවිය. ලතින් ඇමෙරිකාව පුරා 'ගබො' නමින් ආදරයෙන් හැඳින්වුණු මෙම කොළොම්බියානු ලේඛකයා ලීවේ ස්පාඤ්ඤ බසිනි.

පුවත්පත් කලාවේදියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹූ හෙතෙම පසුකලෙක පූර්ණකාලීනව වෘත්තීය ලේඛකයකු ලෙස කටයුතු කරමින් කෘතීන් රැසක් පාඨකයාට දායාද කළේය. ස්පාඤ්ඤ බසින් පිටවී වැඩිකල් යෑමට පෙර මෙම කෘතීන් බොහොමයක් භාෂා රැසකට පරිවර්තනය විය. One Hundred Years of Solitude" Love in the Time of Cholera" The Autumn of the Patriarch" Memories of my Melancholy Whores එම පොත් අතරින් කිහිපයකි.

"ග්‍රන්ථකරණය වනාහි ආත්මඝාතක වෘත්තියකි. එයින් ලැබෙන වාසි සමග සසඳා බලන කළ ඒ තරම් කාලයක්, ඒ තරම් කැපකිරීමක් අවැසි, ඒ සා වැඩකොටසක් කළ යුතු වෙනත් වෘත්තියක් නොමැත."

පොතක් කියවා නිමකරන පාඨකයකු, ඒ ලේඛකයා එම පිටු ගණන ලිවීම සඳහා කොතරම් කාලයක් වෙහෙසවිණිද, ඔහුට ඒ කාලය තුළ කොතරම් ගෘහාශ්‍රිත වියවුල්වලට මුහුණපාන්නට සිදුවිණිද, ඔහුට පොත සඳහා කොතරම් මුදලක් ලැබුණේද යන කරුණු ගැන සිතාබලන්නේදැයි මට සිතේ. එවැනි දුක්මුසු ගණන්බැලීමකින් පසු, කරුණු එසේනම්,



මාකේස් සිය බිරිඳ මර්සිඩිස් බාර්චා හා දරුවන් වන ගොන්සාලෝ සහ රොඩ්රිගෝ සමග



ප්‍රෙන්සා ලැටිනා. පුවත් සේවයේ නියුතුව සිටි අවදියේ දී (1959)

ලේඛකයන් වන අප ලියන්නේ මන්ද යන ප්‍රශ්නය අපෙන් ඇසීම ස්වාභාවිකකය. ඊට පිළිතුර භාවාතිශයවත්නා සේම අවංකද වේ. ලේඛකයා ද යුදෙව්වෙකු හෝ කල්ලෙකු වැනිය. සාර්ථකත්වය දිරිගන්වන සුළුය. පාඨකයන්ගේ ප්‍රසාදය උත්තේජජනකය. මේවා හුදු අමතර වාසි පමණි. මන්ද, සිය පාවහන් හිල්වී තිබුණත් සිය පොත් නොවිකුණුනත් හොඳ ලේඛකයා දිගටම ලියන බැවිනි.

- මාකේස් චරිතාපදානයෙනි.

"ලිවීම තමාට බොක්සිං ක්‍රීඩාව වැනි යැයි හෙමිංවේ කර ඇති සඳහන මගේ සිත් ගත්තා. ඔහු සිය ශරීර සෞඛ්‍යය මෙන්ම තමන් පිළිබඳව උනන්දු වූ ලේඛකයෙක්. ෆෝක්නර් (විලියම් ෆෝක්නර්) ප්‍රකටව සිටියේ බේබද්දෙකු ලෙසයි. එහෙත්, බීමතින් සිටියදී එකම පේලියක්වත් තමන්ට ලියාගත නොහැකි යැයි ඔහු සිය සෑම සම්මුඛ සාකච්ඡාවකදීම



ස්පාඤ්ඤයේ ජුවාන් කාලෝස් රජුගෙන් 80 වැනි උපන් දිනයට සුභ පැතුම්.



සිය හිතවතුන්ගේ සුභ පැතුම් මැද.

පාහේ පවසා තිබෙනවා. හෙමිංවේද ඒ බව සඳහන් කළා. මගේ ඇතැම් කෘතීන් රචනාකරන විට මා බීමතින් සිටියාදැයි මගේ යම් පාඨකයෙක් මගෙන් විමසනවා. එයින් මට නම් වැටහී යන්නේ ඔවුන් සාහිත්‍යය හෝ මත්පැන් පිළිබඳ කිසිවක්ම නොදන්නා බවයි. හොඳ ලේඛකයකු වීමට නම් පැහැදිලි මනසක් හා යහපත් සෞඛ්‍ය තත්වයක් තිබීම වැදගත්. ලිවීම පරිත්‍යාගයක්යැයිද, නරකම ආර්ථික තත්වයන් හා එවැනිම භාවමය තත්වයන් හී සිටිනවිට ඉස්තරම් දෑ ලියවෙනවායැයි ද යන රොමෑන්තික සංකල්පයට මා විරුදධයි. සාහිත්‍ය නිර්මාණයක් කිරීමට මා හොඳ සනීපයෙන් සිටීම අවශ්‍යයි. අපේ අතීත පරම්පරාව මෙය අවබෝධ කරගෙන සිටියා.

"වෘත්තීය ලේඛකයකු වූ පසුව මා මුහුණ පෑ ලොකුම ගැටලුව වූයේ මාගේ වැඩකටයුතු කාලසටහනකට අනුව සකසාගැනීමයි. පුවත්පත් කලාවේදියකුට රාත්‍රී කාලයේදී වැඩ කරන්නට සිදුවෙයි. මා පූර්ණ කාලීනව ලේඛක වෘත්තියට යොමුවූයේ මා වයස අවුරුදු හතළියේදී. මා පෙරවරු නමයේ සිට




ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී (1982 දෙසැම්බර්) සාහිත්‍යය පිළිබඳ නොබෙල් සම්මානය ස්වීඩනයේ ගුස්ටාෆ් රජු විසින් පිරිනැමීය.




නොබෙල් සම්මානලාභී චිලී ජාතික පැබ්ලො නෙරූඩා කවියා සමග 1972 දී.



190257



අසූවැනි උපන් දිනයට සුභ පැතීමට පැමිණි ඇමෙරිකාවේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන් සමග



මාකේස් 1970 දී. ලිවීමේ නිරත ඔහුගේ මෙම ඡායාරූපය පුත් රොඩ්රිගෝ විසින් ගන්නා ලද්දකි.

මධ්‍යාහ්න දෙක දක්වා ලිවීමේ යෙදෙනවා.ඒ වෙලාව වෙද්දී මගේ දරුවෝ පාසල ඇරී නිවෙසට එනවා' දවස පුරා වෙහෙස වී වැඩ කිරීමට පුරුදුව සිටි මට මධ්‍යාහ්න දෙක වන විට වැඩ නතර කිරීමෙන් දැනුණේ වරදක් කළා වැනි හැඟීමක්. ඉතින් මම මධ්‍යාහ්න දෙකෙන් පස්සෙත් වැඩකරන්නට තීරණය කළත්, එසේ ලියන දෑ පසුවදා උදේ නැවත ලියන්නට සිදුව ඇති බව මට වැටහුණා"




ෆිදෙල් කස්ත්‍රෝ මාකේස් ගේ සමීප මිතුරෙක් විය.

ලිවීමේ යෙදෙන විට මා මගේ සුපුරුදු වටපිටාවේ සිටිය යුතුයි. හෝටල් කාමර තුළ අනුන්ගෙන් කුලියට තාවකාලිකව ගත් තාවකාලිකව ගත් නවාතැනක ඉඳිමින් ලිවීම මට දුෂ්කර කාර්යයක්. අනුන්ගේ යතුරුලියනයක වැඩකිරීමත් අපහසුයි.


රොමෑන්තික ලේඛකයන්ගේ අදහස වන්නේ ලිවීම සඳහා ආවේශය (inspiration) අවශ්‍යබවයි. ලිවීම සඳහා ඔබට යම් විශේෂ මානසික තත්වයක් අවශ්‍යබව සැබෑය. ඒ තත්වයට පැමිණිවිට ඔබ පහසුවෙන් ලියනු ඇත. අදහස් පහසුවෙන්, නිරායාසයෙන් ගලා එනු ඇත. එහෙත් එසේ වන්නේ ඔබට සරිලන තේමාව හා ඒ තේමාවට සරිලන ශෛලිය ඔබට ලැබුණු පසුවය. එය ඔබ කැමති තේමාවක් විය යුතුය. මන්ද, ඔබ අකමැති දෙයක් කිරීම තරම් අයහපත් දෙයක් තවත් නැති බැවිනි.

-ද පැරිස් රිවියූ සඟරාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකිනි.


# පොතක වත




**ආරියනන්ද දොඹගහවත්ත**
වාසනා ප්‍රකාශකයෝ
පිටු: 240
මිල: රු. 300/=





**සංස්කාරකවරු : සමන්ත හේරත්, පර්සි ජයමාන්න, ප්‍රණීත් අභයසුන්දර, තිඹිරියාගම බණ්ඩාර**
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
පිටු : 820





**නීටා ලෝවි**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු: 176
මිල: රු. 450/=





**ගුණදාස අමරසේකර**
සීමාසහිත විසිදුනු ප්‍රකාශකයෝ
පිටු : 135
මිල : රු. 270/=





**ගුණසේකර ගුණසෝම**
ෆාස්ට් පබ්ලිෂිං (ප්‍රයිවට්) ලිමිටඩ්
පිටු: 109
මිල : රු. 275/=





**මහාචාර්ය සුචරිත ගම්ලත්**
සේරි ප්‍රකාශන
පිටු: 151
මිල: රු. 275/=




**සුචරිත ගම්ලත්**
සේරි ප්‍රකාශන
පිටු: 319
මිල: රු. 600/=





**පොල්ගස්වත්තේ පරමානන්ද හිමි**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු: 232
මිල: රු. 750/=



**පියදාස සිරිසේන**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු: 216
මිල: රු. 290/=




**මහාචාර්ය බන්ධුසේන ගුණසේකර**
ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
පිටු: 105
මිල: රු. 170/=




**නිශා එස්. කෝට්ටෙආරච්චි**
වාසනා පොත් ප්‍රකාශකයෝ
පිටු: 48
මිල: රු. 100/=




**ශ්‍රීමා ලාලනී**
සෙරෙනිටි පබ්ලිෂිං හවුස්
පිටු: 200
මිල: රු. 400/=




**ශාරිකා කරුණාතිලක**
සෙරෙනිටි පබ්ලිෂිං හවුස්
පිටු: 428
මිල: රු. 620/=





**ජී.ජී. නන්දනී**
සෙරෙනිටි පබ්ලිෂිං හවුස්
පිටු: 277
මිල: රු. 520/=





**ගීතාංගනී ප්‍රදීපා සේරසිංහ**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු 358
මිල: රු. 750/=




**කපිල බස්නායක**
කතෘ ප්‍රකාශන
පිටු: 72
මිල: රු. 200/=




**K. Gopalapillai**
S. Godage and Brothers
Pages: 136
Price: Rs. 350/=




**විජයසිරි මිහිඳුකුලසූරිය**
කතෘ ප්‍රකාශන
පිටු: 292
මිල: රු. 450/=





**Swarnakanthi Rajapakse**
Sarasavi Pablishers
Pages: 180
Price: Rs. 490



**යූ.වී.එච්. පෙරේරා**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු: 216
මිල: රු. 450/=




**Editor: Kithsiri Amaratunga**
The Way Forward Symposium Proceedings
General Sir John Kotalawala Defence University
Pages: 539




**හසන්ත වාසනා සමරසිංහ, අමාලි සෙව්වන්දි බණ්ඩාරනායක**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු: 480
මිල: රු. 2000/=

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/23

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Irani Wijesundara

Signature : ..........

Date : 2017/10/23

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*